ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



වසරේ හොඳම ආගමික පුවත්පත



විවිධ මාධ්‍ය ආයතන හා වෙබ් අඩවි විකෘතියට මීගමුවේ කතෝලික විරෝධය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමුන් සඳහාම ද?**

3 පිටුව



**මඩෙන් උපන්නෝ මඩෙන් ම වැනසෙති**

දයාවේ ධර්මදූතිකාවෝ පැවදි නිකායට කළ අපහාසයට මෛත්‍රියෙන් කරන පිළිතුරකි...

9 පිටුව



දේවමාතාවන්ගේ නිර්දෝෂ පිළිසිඳීමේ මංගල්‍යය
දෙසැ. 08 දා
(ණය මංගල්‍යයකි)


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07

ක්‍රි.ව. 2011 ක් වූ දෙසැම්බර් මස 04 ඉරිදා 146 වෙළුම 27 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 20 QD/18/NEWS/2011 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.


## සුබ උපන් දිනයක්!



මෙරට ප්‍රමුඛ පෙළේ කාටූන් ශිල්පියකු හා පුවත්පත් කලාවේදියකු වන කැමිලස් පෙරේරා සිය ජන්ම දිනය මේ මස 03 වන දා සැමරීය. කාටූන් කලාවේ බොහෝ චරිත පණගන්වා ඇති කැමිලස් පෙරේරා බැතිමත් කතෝලිකයෙකි. ආධුනික පුවත්පත් කලාකරුවනට හොඳ ගුරුවරයෙකි. ප්‍රදීපයේ "තිත්ත ඇත්ත" තුළින් ගිහි මනසේ යථාර්ථය කදිමට හුවා දක්වන්නෙකි. එතුමනට ප්‍රදීපයේ උණුසුම් සුබපැතුම් මෙලෙස පිළිගන්වමු.

## නත්තල් කැරොල් හා නාට්‍ය තරගය මුල්වරට කෝට්ටේ දිසාවේ

කෝට්ටේ දිසාවේ මීසම් අතර මුල්වරට නත්තල් කැරොල් හා නාට්‍ය තරගාවලියක් පැවැත්වීමට දිසාවේ අධ්‍යාපන, මාධ්‍ය හා සංස්කෘතික කමිටුව මඟින් නුගේගොඩ මීසම් සේවක ගරු එඩ්මන්ඩ් තිලකරත්න පියතුමාගේ මඟ පෙන්වීම යටතේ කටයුතු යෙදීය.
(15 පිටුවට)

(✍ ට්‍රෙවෝ ලුඩ්වයික්)

## දේව ධර්ම සරසවිය අනුමත වේ

බෝලවලානේ ඉදිවන අති උතුම් සොළොස්වන බෙනඩික්ට් දේව ධර්ම සරසවියට සම්පූර්ණ අනුමතිය ලැබී තිබේ. පැරණි ගුරු අභ්‍යාස විද්‍යාල භූමියේ ඉදිවන මෙම සරසවිය පූර්ණව ආසියාකරයට විවෘත වන අතර එය ලෝකයේ පිළිගත් කතෝලික විශ්ව විද්‍යාල අතරට එක්වන නවතම සරසවිය බව වතිකාන පුවත් සේවා වාර්තා කරයි.

## ලොකු සැර්



කාලගුණ ලොක්කා ජනතාවගෙන් සමාව ඉල්ලයි
- පුවතක්

**වෙන වැඩක් නැතිවෙයි වගේ නේද?**

# තෙරේසා මව්තුමියගේ දයාවේ සේවාවට ලොව පුරා ඉහළම පිළිගැනීමක්!

## ගරු මේරි එලීසා සොයුරිය බන්ධනාගාරගත කළ ප්‍රථම දයාවේ පැවදි සොයුරියයි

## එතුමිය ඇප මත නිදහස් වේ

**විසිවන සියවසේ දහම් දූතිකාව, ජීවමාන සාන්තුවරිය ලෙස විරුදාවලි ලත් භාග්‍යවන්ත තෙරේසා මවුතුමියගේ දයාවේ ධර්මදූතිකාවෝ නිකායේ පැවදි සොයුරියන් පාලනය කරන මොරටුව රාවතාවත්ත "ප්‍රේම් නිවාසයේ" පාලිකා ගරු මේරි එලීසා පැවදි සොයුරිය ඉකුත් සඳුදා ඇප මත නිදහස් වූවාය.**

අන්ත දුගී ජීවිත ගත කරමින් අවාසනාවන්ත ලෙස මියැදෙන්නන් හට අභිමානයෙන් ජීවත් වන්නටත් ගබ්සා කරන්නට නියමිත වූ දරුවන් විශාල ප්‍රමාණයක් ජීවත් කරවන්නටත් මුල් වූ දයාවේ සොයුරියන්ගේ මේ සේවාවට ලෝකයේ රටවල් 135 ක්ම සිය ප්‍රසාදය ඉහළින්ම පිරිනමා ඇත. ඒ රටවල තතු පිරික්සා බැලීමේ දී අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බන්ධනාගාරගත කෙරුණු එම නිකායේ ප්‍රථම පැවදි සොයුරිය ගරු මේරි එලීසා පැවදි සොයුරියයි.

මේ පිළිබඳව අධිකරණයේ පවරා ඇති නඩුව දෙසැම්බර් 1 දාට විමසීමට නියමිතව තිබිණ. (තවත් විස්තර ඇතුළු පිටුවල)

## අතුල් පහරට අවිහිංසක සිනහවක්...



සේයා - ගරු ජූඩ් සමන්ත පියතුමා

**දයාවේ සොයුරියන්ගේ ශ්‍රේෂ්ඨාධිපතිනිය ගරු ප්‍රේමා පැවදි සොයුරිය දිවයිනට පැමිණි මොහොතේ ඉන්දීය තානාපති කාර්යාල නිලධාරීන්ගේ පිළිගැනීමෙන් අනතුරුව...**

දුබල අසරණ දනට මෙත් සිත් පා දුකින් මුදවා මෙමා
කරන කැපවුණු දිවිය ගරහා හිනැහුණත් ගල් මුල් දමා
රජුන්ටත් දෙවිදතුන් සිටියා නොසැලුණා ඒ හිමි තුමා
මමත් නොසැලෙමි,දයා කරනෙමි එයම මුදු නිවනක් තමා

# කොළඹ අගරදගුරු වසමට නව සහයක රදගුරු දෙනමක්

## අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු හා අතිගරු මැක්ස්වල් සිල්වා පියතුමන් රදගුරුවරයට





අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසින් කොළඹ අගරදගුරු වසමේ සහයක රදගුරු හිමිපාණන් ලෙස අතිගරු ෆිඩේලිස් ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු හා අතිගරු සම්පතවඩුගේ මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා මාහිමිපාණන් 2011 නොවැම්බර් 28 වැනි දා පත්කරන ලදැයි ශ්‍රී ලංකාවේ අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන් විසින් නිවේදනය කරන ලදි. 15 පිටුවට ▶

## 2011 රාජ්‍ය නත්තල් උත්සවය අනුරාධපුර රදගුරු වසමේ

මාණ්ඩලික වාර්තාකරුවකු විසිනි

බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, කතෝලික හා ක්‍රිස්තියානි සභාවන් හා ඒකාබද්ධව සංවිධානය කරනු ලබන 2011 රාජ්‍ය නත්තල් උත්සවය හා නත්තල් තැපැල් මුද්දර නිකුත් කිරීමේ උත්සවය මෙවර අනුරාධපුර රදගුරු පදවියේ (උතුරු මැද පළාත) කිතුනු ජනතාව හා එක්ව පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර තිබිණ.

ඒ අනුව 2011 නත්තල් තැපැල් මුද්දර නිකුත් කිරීමේ උත්සවය නොවැම්බර් මස 27 දින පෙ.ව. 10.00 අනුරාධපුරය, සා. ජෝශප් ආසන දෙව්මැඳුරේ දී පැවැත්වූ අතර, 2011 රාජ්‍ය නත්තල් උත්සවය දෙසැම්බර් 14 හා 15 යන දෙදිනෙන් එක් දිනක පෙ.ව. 10.00 ට අනුරාධපුරය, බුලංකුලම දිසාව මාවතේ රදගුරු මැඳුර අසළ ශාලාවේ දී පැවැත්වීමට නියමිත ය.

## දේව වචනයේ වසර ප්‍රකාශයට පත් කළ මොහොත

රොෂාන් ප්‍රදීප් විසිනි



නොවැ. 26 සෙනසුරාදා කොටහේන සා. ලූසියා ආසන දෙව්මැඳුරේ පැවති විශේෂ සන්ධ්‍යා යාම යැදුම් මෙහෙය අවසානයේ දී 2011 - 2012 වසර දේව වචනයේ වසර ලෙස ප්‍රකාශයට පත් කරමින් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් සන්නස් පත්‍රය ඉදිරිපත් කළ අයුරු..

# කිතුනුවන්ට හිරිහැර කරනවා නම් සියලු ආධාර නතර කරනවා

## බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ඩේවිඩ් කැමරන් කියයි



මානුෂික අයිතීන් නොතකා හරිමින් ඉතාමත් අත්තනෝමතික ලෙස කිතුනුවන්ට හිරිහැර කරන රටවල්වලට කැරෙන ආධාර නතර කිරීමට සිදුවනු ඇතැයි බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ඩේවිඩ් කැමරන් මහතා පවසයි.

කුඩා රාජ්‍යයන් සහ ආධාර ලබන රටවල් තවදුරටත් කිතුනු විශ්වාසිකයිනට හිරිහැර කරන්නේ නම් කඩිනමින් සිය රජය ප්‍රතිපත්ති සම්පාදනය කරමින් සියලු ආධාර නතර කරන්නට ක්‍රියා කරන බව බ්‍රිතාන්‍ය ගුවන් විදුලියේ ඇන්ඩෲ මාර් ඉදිරිපත් කළ වැඩසටහනකට සහභාගි වෙමින් අග්‍රාමාත්‍යවරයා තවදුරටත් පවසා සිටි. ආගමික උන්මත්තක භාවය හා අන්තවාදය වර්ධනය වන ආසියාකරයේ රටවල්වලට මෙය දැඩිව බලපාන බව දේශපාලන විශ්ලේෂකයන්ගේ මතයයි. මේ අතර බ්‍රිතාන්‍ය රජයේ මෙම යෝජනාව "එයිඩ් ටු ද චර්ච් ඉන් නීඩ්" ආයතනයේ ඉමහත් ප්‍රශංසාවට ලක් වී ඇතැයි අනාවරණය වේ. ඉහත යෝජනාවට ඉදිරියේ දී මුළු මහත් යුරෝපා සංගමයේ අනුමතිය ද ලැබෙන්නට ඉඩ ඇතැයි යන්න දේශපාලන විශ්ලේෂකයන්ගේ සාමූහික අදහසයි. ("කැතලික් හැරල්ඩ්" වාර්තා කරයි)

**"සමිඳාණන් හට ඇද නැති මාවත් සාදන්න"** (මාක් 1:1-8)

පදවියෙන් පදවියට

# කිතුනුකම අභියෝගයක්වූ යුගයක කැපවීම ඉතා වැදගත්

## සලාපුර රදගුරු හිමි ඉහළ කටුනේරියේදී පවසයි

හලාවත පදවියට අයත් කටුනේරිය මීසමේ ඉහළ කටුනේරිය සාන්ත ජූඩ් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍ය සහ දෙව්මැඳුර ඉදිකර වසර 50 ක් පිරීම නිමිතිකොට පැවැත්වූ ජුබිලි මංගල්‍ය දිව්‍ය මෙහෙයේදී හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ සැදැහැවත් බැතිමතුන් අමතමින් වසර 50 ක ඉතිහාසය තුළ මීසමේ මුතුන් මිත්තන්ගේ විශ්වාසය බැතිමත් බව නැංවීම නිසාම අද මෙම ජුබිලි මංගල්‍යය වඩාත් අර්ථවත්ව පැවැත්වීමට හැකිවූ බවත්, එදා මුතුන් මිත්තන් සුරැකි කිතුනු විශ්වාසය තුළින් අනාගත පරපුර ආදර්ශවත් කළ යුතු බවත්, කිතුනුකම රැකගැනීම අද අභියෝගයක් වී ඇති බවත්, මුලධර්මවාදීන්ගෙන් අපත් අනාගත පරපුරත් ආරක්ෂා විය යුතු බවත් ප්‍රකාශ කළහ.

මීසම් වාසින් හට එදින සුවිශේෂී දිනයක් වූයේ ඉහළ කටුනේරියේ සාන්ත ජූඩ් මුනි දෙව්මැඳුර මීසමක් බවට පත්කරමින් ජනතාව හට බාර දීම නිසයි. ඉතා උත්කර්ෂවත් අන්දමින් සිදුවූ මංගල මෙහෙයට ගරු ඇලෙක්ස් දසනායක, ගරු නෙවිල් කුඤ්ඤ් ගරු මයිකල් ලුසේනා ගරු කුවින්ටස් ප්‍රනාන්දු යන පියතුමන්ද, කටුනේරිය මීසම් සහයක පියතුමන්ද වෙනත් මීසම් වාසින් විශාල පිරිසක් ද සහභාගි වූහ.

ටෙස්මා රෝස් ශ්‍රියන්ති



තේවත්ත ලංකා අප ස්වාමිදුගේ ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ දී පසුගියදා පැවැති දේව සේවක තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිමි භාග්‍යවරයට එසවීමේ ක්‍රියාදාමයේ පළමු සංවත්සරය හා සමගාමීව සමාජ සේවා ඇමැති ෆීලික්ස් පෙරේරා මහතාගේ අනුග්‍රහයෙන් ලැබුණු රෝද පුටුවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන් විසින් ආබාධිත අයකුගේ භාර කරුවකුට ප්‍රදානය කළ අයුරු ඥානාර්ථ ප්‍රදීපය කැමරාවට මෙසේ ලක්විය.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි

සුබාසිංසන



කොළඹ විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ගේ නාමසාන්තුවර මංගල්ලය දෙසැම්බර් 06 වැනිදාට යෙදේ. එතුමනට සමිඳු ආසිරි බහුලව ලැබේවායි ප්‍රදීපයෙන් සුබ පැතුම්!

## මතින් තොරව ජීවත් වීම සතුටක් කර ගන්න ඔබටත් අවශ්‍ය ද?

ව්‍යායාම, යෝගී, භාවනා ඔස්සේ මතට ඇබ්බැහි නිසා සිරුරෙන් කෙරෙන ඉල්ලුම නතර කර අලුත් ජීවිතයකට පිය නගන්න.

වැරැදි සංකල්ප ඔස්සේ මනසින් ඇබ්බැහිවීම නතර කොට නව සිතුවිලි ධාරාවකින් නව ජීවනයක් අත්දකින්න!

මතින් ඇත්වීමෙන් ඇතිවූ හිඩැස ආගමික ප්‍රබෝධයෙන් පුරවාලන්නටත්, ලෞකික හා ආධ්‍යාත්මික නව පිළිවෙත් පුරමින් මතින් ඈත්ව පවුලේ වගකීම් ඉටුකරමින් සතුට - සැනසුම අත්දකින්නටත් ආරාධනා!

**එන්න! ඇවිත් බලන්න! වෙනස අත්දකින්න!**

මේ වැඩසටහන මාසිකව තුන් දිනක් පැවැත්වේ. වසර 3 1/2 ක් තිස්සේ සාර්ථක ප්‍රතිඵල අත්දැක තිබේ. පන්සියයකට අධික සුවපත් වූවන්ගෙන් වැඩි විස්තර දැන ගත හැකිය.

ඒ අනුව කටුනායකට ආසන්න තැනක පැවැත්වෙන මෙහි දිනය හා වේලාව වෙන්කරගෙන කල් ඇතිව ලියා පදිංචි වන්න. විමසන්න 0776552545



කැපුන්ගොඩ දෙව්මැඳුරේ කන්‍යමරිය රාජේශ්වරියගේ ජ්‍යෙෂ්ඨ කාන්තා ප්‍රසිඩියමට වසර පනහක් පිරීම නිමිත්තෙන් තුති පිදීමේ දිව්‍ය යාගයක් කැපුන්ගොඩ සා. අන්තෝනි මුණිඳුන්ගේ දෙව්මැඳුරේදී පැවැත්විය. එයට හවුල්වූ තුඩැල්ල දිසා මරිය හමුදා අධ්‍යක්ෂ ගරු නික්ලස් බටේපොල කැපුන්ගොඩ මීසම් පාලක ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමන්ලා සමඟ එම මරිය හමුදා ප්‍රසීඩියමේ සහෝදරියන් සේයාරුවෙන් දැක්වේ.

බෙන්ජමින් කිරිහෙට්ටි

## දොන් බොස්කෝ ධාතු වැඩම කරවීමට ඥානාර්ථ ප්‍රදීපය සහාය ජනතා පැසසුමට

සා. දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු ශ්‍රී ලංකාවට වැඩම කරමින් රටවටා යන ගමනේ සලාපුර පදවියට වැඩම කරවීම පසුගියදා සිදුවිය. පැය 15 ක් පුරා දංකොටුව කටුකෙන්ද දොමිනික් සාවියෝ ආධුනිකාරාමයේ තැන්පත් කර තිබූ ශුද්ධවූ ධාතුවට ගෞරව දැක්වීමට ලක්ෂය ඉක්මවූ ජන ගඟක් ගලා ආවේය.

එම ජන ගඟ ආගමික උත්සවයක්සඳහා දංකොටුවට ගලා ආ විශාලම ජන ගඟ ලෙස ඉතිහාසයට එක් වෙයි. කිසිවෙකුත් බලාපොරොත්තු නොවූ ආකාරයට මෙතරම් විශාල ජන ගංගාවක් ගැලීම කාහටත් කුතුහලයක් විය. ඒ පිළිබඳව උත්සවය අවසානයේදී කිහිප දෙනෙක්ම අදහස් දක්වමින් කියා සිටියේ දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු ශ්‍රී ලංකාවට වැඩම කරමින් රටවටා යන ගමනේ දංකොටුවට පැමිණීම සහ එය නිමිති කරගෙන එහි සිදුවන දේ පිළිබඳව නොවැම්බර් 20 ඉරිදා ඥානාර්ථ ප්‍රදීප පුවත්පත වාර්තා කිරීම තුළින් ජනතාව දැනුවත් වීම මෙ ජන සංඛ්‍යාව වැඩි වීමට හේතුවූ බවත් දිවයිනේ සතර දිගින් ජනතාව පැමිණීම එය මනාවට පැහැදිලි වන බවත් කීය.

ඩබ්ලිව් ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු



එ.ජා.ප. නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මහතාගේ කිතුනු මඟට දිරියක් වැඩසටහන යටතේ බෝපිටිය මීසමට අයත් වැල්ලබඩ ශුද්ධවූ ජූඩ් මුනිඳුන්ගේ දෙව්මැඳුර සඳහා රු. 50,000/= ක පරිත්‍යාග යක් බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමා වෙත භාරදුන් අයුරුයි මේ.

එස්. කේ. ජේ. කුරේරා.

## වේලන්කන්නි යෑමට බැංකු ණය පහසුකම්

මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය රාජිත සේනාරත්න මහතාගේ සංකල්පයක් අනුව අඩු ආදායම් ලාභීන්ට සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වේලන්කන්නි පුදබිම වැඳ පුදා ගැනීමට කදිම අවස්ථාවක් උදාව ඇත.

මෙම පූජා භූමිය වැඳ පුදා ගැන්ම සිහිනයක්ව තිබූ මෙම අයට එම සිහිනය සැබෑවීමේ ලකුණු දැන් පහලවී ඇත. තමන්ට දැරිය හැකි පහසු මිලකට මෙම වන්දනා ගමන සංවිධානය කිරීමට කටයුතු කරන බවත් ඒවා මීසම් පාලක පියතුමන් හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන බවත් ණය පහසු ලබාගැනීම සහ කොටස් වශයෙන් මුදල් ගෙවීමේ ක්‍රමයක් සඳහා දැනටමත් ධීවර අමාත්‍ය තුමා බැංකු සමඟ සාකච්ඡා කරන බවත් එතුමන්ගේ කතෝලික ආගමික කටයුතු උපදේශක ඩන්ස්ටන් ප්‍රනාන්දු මහතා ප්‍රදීපයට පැවසීය.

## පාතිමා බැතිය වැලිකුරුඳුවත්තේදී

පාතිමා මෑණියන්ට ගෞරවය පිණිස, පාතිමා නුවානය, සුව මෙහෙය හා දිව්‍ය පූජාව, වැලිගම්පිටිය මීසම් සේවක කඳාන දිසානායක ගරු ශ්‍රී ලාල් පොන්සේකා පියතුමාගේ මඟපෙන්වීම යටතේ වැලිකුරුඳුවත්ත පාතිමා පවුල් එකමුතුව මගින් දෙසැම්බර් මස 07 වන දින සිට සෑම බදාදා දිනක ප.ව. 7.00 ට වැලිකුරුඳුවත්ත පාතිමා දෙව්මැඳුරේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

ඩල්සි මෙන්ඩිස්

## වැඩිහිටි උපහාර දිනය උයනේදී

මොරටුව උයන මීසම් සංඝයට අයිති වැඩිහිටි මව්පියවරුන්, මොරටුව වැඩිහිටි නිවාසයේ මව්පියවරුන් හැමදෙනාම උයන ශු. ජුසේතුමාගේ සහෝදර සමිතියේ සාමාජිකයන් විසින් 'බැජ්' එකක් පළඳවා පිළිගන්නා ලදි.

මීසම් සේවක ගරු බර්ට්‍රම් රංජිත් පියතුමා වැඩිහිටි මව්පියවරුන් පිරිවරාගෙන පූජාසනය කරා පිය නඟන ලදි. වෙනදා පාසල් දවුා දරුවන්ට වෙන්ව තිබුණු ඉදිරිපස ආසන එදා වෙන්වූයේ මීසමේ වැඩිහිටි මව්පියවරුන්ටයි. දිව්‍ය පූජාව අවසන ජ්‍යෙෂ්ඨ පුරවැසි සැමදෙනාට සංග්‍රහයක් සූදානම් කර තිබුණි.

කුසට අරහ පමණක් නොව පැරණි ගී සින්දු ගයමින් සිතට මිහිරක්ද, සතුටක්ද ලබාදීමට, ශු. ජුසේ මුනිඳුන්ගේ සහෝදර සමිතියේ සමාජිකයෝ ක්‍රියාකළහ. පැමිණ සිටි සියලු දෙනාට සමරු තිළිණය බැගින්ද ප්‍රදානය කළහ. උත්සව කටයුතු සංවිධානයට මීසම් සේවක, පියතුමාගේ මඟපෙන්වීමද, උයන මීසම් සංඝයේ සමිති සමාගම් වල සාමාජික සාමාජිකාවන්ගේ සහයෝගය නො අඩුව ලැබුණි.

ජීනවලි ස්වර්ණලතා පීරිස්

## ගර්භාවාස දේව මාතා දේවස්ථාන

## ගොඩනැගිල්ලට ආධාර පතයි

පල්ලන්සේන මීසමේ ගර්භාවාස දේව මාතා දේවස්ථානය බිළිඳුන් සඳහා ද, ගර්භනි මාතාවන් සඳහා ද වන්දනා මෙහෙයන් පවත්වන ප්‍රසිද්ධ දේවස්ථානයකි. සෑම දිනම විවිධ ප්‍රදේශවලින් බිළිඳුන් රැගෙන මෙම දේවස්ථානයට පැමිණේ. බ්‍රහස්පතින්දා දින ගැබිනි මාතාවන් සඳහා ද, සෙනසුරාදා දින බිළිඳුන් සඳහා ද නුවාන සහ දිව්‍ය යාගයන් සවස 5.00 ට පැවැත්වේ.

මෙය කුඩා දේවස්ථානයක් වන බැවින් වසර කීපයක සිට එය ප්‍රතිසංස්කරණයට ලක්වෙමින් පවතී. මෙම කටයුතු නිම කිරීමට සැදැහැවතුන්ගේ සහය ගරු මීසම් සේවක පියතුමා හා දේවස්ථාන කමිටුව අයැද සිටී.

මේ සඳහා එවන මුදල් ආධාර හෝ චෙක්පත් කොච්චිකඩේ ලංකා බැංකුවේ ගිණුම් අංක 70942239 ගර්භාවාස දේවස්ථාන ගොඩනැගිලි අරමුදල නමින් බැර කරන මෙන් හෝ මීසම් සේවක පියතුමා, විකෂෝප දේවමාතා දේවස්ථානය, පල්ලන්සේන, කොච්චිකඩේ යන ලිපිනයට එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටී.

මෙල්වින් ද කොස්තා

ඉන්දීය සම්භවයක් ඇති වතු කම්කරු ජනතාවකගෙන් සමන්විත රත්නපුර රදගුරු පදවියේ ගලබඩ මීසමේ පසුගියදා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ශාඛාවක් ආරම්භ කෙරින. මෙම අවස්ථාවට ගලබඩ මීසම් සේවක නිරෝෂන් වාස් පියතුමාද, සභාපති වශයෙන් පත්වූ එස්. අරුලානන්දන් මහතා ඇතුලු සාමාජික පිරිසද මෙහි වෙති.

තියබෝල්ඩ් සමරතුංග



## පලුගස්දමන ජපමාල භාවනා මෙහෙයක්

අනුරාධපුර පදවියට අයත් පලුගස්දමන ශුද්ධවූ ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ විශේෂ ජපමාල භාවනා සර්ව රාත්‍රික මෙහෙයක් පසුගියදා පැවැත්විණ.

මීසමේ මරිය හමුදාව සංවිධානය කළ මේ යැදුම් මෙහෙය අවසානයේදී දිව්‍ය පූජා යාගය පුද කරනු ලැබූ අතර, මීසම් සේවක ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමා විශේෂ අවධානය යොමු කළේ, දේව මාතාවන් වහන්සේගේ පාතිමා දර්ශනය ආශ්‍රිතව කරුණු පැහැදිලි කිරීමටයි.

ජනිත ලක්මාල්

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රි. ව. 2011 දෙසැම්බර් 04 ඉරිදා

# හදවත් ඇත්තන්ට පමණක් දැනෙන කතාවක් !

දුර්ගන්ධය හමන කානු පල්ලේ වැටී සිරුර පුරා තුවාල වලින් සැරව ඕජස් ගලා යද්දි ඒ තුවාල වලින් පණුවන් පවා පිටවෙද්දී මේ දහම් දේශයේ දර්ශනයන් පමණක් කරපින්නා ගත් බොහෝ දෙනෙක් අර කී පුද්ගලයන්ගේ දිගුකාලීන පිටි වහලට ආ බවක් අපට නම් මතක නැත. එක ගෙයි මගුල් කන සම්ප්‍රදායක ඔද්දල් වී ඒ සම්ප්‍රදායෙන් තමන්ගේ සහෝදරිය දූෂණය කොට ඒ අහිංසකාවිය අනාථ වන විට, ගැබ්බරව මහ මඟ ඇද වැටෙන විට දර්ශනයන් පමණක් කරපින්නා ගත් උදවිය ඒ තැනැත්තියන් හට පිටි වහලක් වූ බව අපට නම් මතක නැත. ගබ්සා පෝලිම් සොයා දෙපා ගෙවන තෙක් තැන තැන මධ්‍යස්ථාන කරා දිව ගිය අහිංසක කාන්තාවන්ට මව් පදවියේ උතුම් බව කියා දෙමින් මවක් සුරක්ෂිතව බලා ගත් ආයතන බාරව ක්‍රියාකරන ඒ දර්ශන ආධ්‍යාත්මයන් කරපින්නා ගත් උදවිය පිළිබඳව අපට නම් මතක නැත. මුඩුක්කු ජීවිත වලින් දරුවන්ගේ අනාගතය පමණක් නොව පවුල් පවා අවුල් වන තැනට පොදුවේ ජීවිත ගමන් කරන විට අභිමානයෙන් නැගී සිටින්නට කරුණාවෙන්, දයාවෙන්, සිනහවෙන් කතා කරන, ආදරය කරන දර්ශන මත වාදයන් තුළින් බිහිවූ පුද්ගලයන් සිටි බවක් නම් අපට මතක නැත. ඒ සියලු මනුෂ්‍යත්වයේ කාරණා මුදලට නොව සැබෑ ආධ්‍යාත්මයෙන්ම හෙබිව ප්‍රේමය පෙරදැරිව ඉටුකරන්නට සමූහයක්, කණ්ඩායමක්, සමාජයක් මේ දේශයේ සිටි බවක් නම් අපට මතක නැත.

නමුත් මේ සියල්ල මේ දේශයේ ඉටුකරන්නට සැබෑ මනුෂ්‍යත්වයේ නාමයෙන් හා ආදරයේ බැතිබර හැඟීමෙන් අත්දකින්නට කල්කටාවේ දයාවේ සාන්තුවරියට හැකි වූයේ මනසත් හදවතත් පිරිපුන් කළ ආදරයේ දහමක් අත්දකිමින් එය ජීවිතයෙන්ම ජීවත්කරවන්නට ලත් ශක්තිය නිසාමයි. ඒ දයාවේ මාතාව ආරම්භ කළ ආදරයේ ක්‍රියාදාමය නිසා ඈ පසු ආ බොහෝ දියණියන් තම උපන් දේශය හා මව්පියන් අතහැර දයාවේම සේවාවට මනස, හදවත එක්කළ දහමේ දැඩි ආභාෂයෙන් ඉදිරිපත් වීම මේ දේශයේත් අතරමං වූ මනුෂ්‍යත්වයට යම් අභිමානයක් ගෙන එන්නට සමත් වූ බව නම් කිව යුතු නොවේ. එය දන්නෝ දනිති. ආගම්, ජාති භේදයෙන් තොරව තතු දන්නෝ දනිති. උස් පහත්, උගත් නූගත් භේදයෙන් තොරව මනුෂ්‍යයන්ට ආදරය කරන්නෝ දනිති. දර්ශනයන් පමණක් කරපින්නා ගෙන මනස පමණක් විවෘත කරගෙන හදවත වසා ගත්තන් හට මෙහි යථාර්ථය දැක ගන්නට නොහැකි වීම මනුෂත්වයේ ඛේදවාචකයයි.

මොරටුව රාවතාවත්තේ 'ප්‍රේම් නිවාසය' තෙරේසා මාතාව නම් වූ දයාවේ සාන්තුවරියගේ පැවැදි සොයුරියන්ගේ තවත් එක් නිවාසයකි. පෙර සඳහන් කළ අයුරින්ම මනුෂ්‍යත්වයේ අභිමානය තුළ දෙපයින් නැගී සිටින්නට ජාති ආගම් භේදයෙන් තොරව මනුෂ්‍යයන්ට ආදරය කළ, ආදරය කරන පැවිදි සොයුරියන් ජීවත්වන නිවාසයකි. ගබ්සා කරන්නට හිත් යොමුකළ අම්මාවරුන් හට එහි ආදීනව පවසා ඒ දරුවන් ජීවත් කරවන්නට හා ගෞරවාන්විතව බිහිකරන්නට තෝතැන්නක් වූ නිවාසයකි. කානු පල්ලේ ඕජස් ගලමින් පණුවන් සමඟ ජීවත් වූ අසරණයන් හට අභිමානයෙන් සිනහවක් නගා ජීවිත හුස්ම පිටකරන්නට ක්ෂේම භූමියක් වූ නිවාසයකි. ශ්‍රී ලංකාවේ පවත්නා නීතිරීති අනුගමනය කරමින් පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ ලියපදිංචි දිගු කාලයක් තිස්සේ පවත්වාගෙන ආ නිවාසයකි.

නමුත් එක රැයෙන් එම ආදරයේ නිවස "බේබි ෆාම්" බවට පත් කළේ නින්දිතව හැසිරෙන මේ දේශයේ සමහර ජනමාධ්‍ය ආයතනයි. බුර බුරා නැගෙන කෝපයක් හා ඊර්ෂ්‍යාවක් හදේ තදකරගෙන සිට එය මුදා හරින්නට අන්තවාදීන් ගත් උත්සහයට ඉණිමං බැඳි ඒ ආයතන අපහස කළේ මනුෂ්‍යත්වයේ ආධ්‍යාත්මයටයි. දර්ශන මතවාදයටයි. සත්‍ය කුමක්ද යන්න දැක දැකත් මුසාව පමණක්ම ඉස්මතු කළේ සිල්පද කැඩීමේ කිසිදු බරපතල කමක් හදවතට නොදැනෙන නිසාද යන්න මහාම උභතෝකෝටියකි. සත්‍ය දැක දැක එය වසන් කළ ජනමාධ්‍ය ගැන අනුකම්පාවක් ඇතිකරගත් මේ දේශයේ මනසත් හදවතත් එක්තැන් කළ ආධ්‍යත්මයකින් පිරිපුන් ජනතාව එය ආයතනවල සමහර අඥ බාල ලේඛකයන් කෙරෙහි මෙත් වඩනු නොඅනුමානයි. මන්ද සත්‍ය එළිදැක්වෙන බව ඒ පිරිපුන් ආධ්‍යාත්මය පසක් කර ගත් උදවිය සැබැවින්ම දන්නා බැවිනි.

අවංකත්වයෙන් සේවාව ඉටුකරන ආයතන හොර ගුබ්බෑයන් කරන්නට හා ඒ තලයෙහිලා සලකන්නට අද සමහර ජනමාධ්‍ය ආයතන ක්‍රියාකරන්නේ කළු සල්ලි ඔවුන් අත හුවමාරුවන නිසාදැයි යන්න කුකුසක් මේ හා සමඟ පැන නැගෙයි. "දිවයින" ටම තම මුද්‍රිත ප්‍රකාශන බෙදාහරින සමහර ආයතන හුදු ජාතිවාදය හා ආගම්වාදයම කරපින්නාගෙන ඇත්තේ රහසින් මුදලට තම ආධ්‍යාත්මය විකුණන නිසාදෝ යන විචිකිච්ඡාවත් නිබඳව නැගේ.

සත්‍ය කවදා හෝ එළිදැක්වෙනු ඇත. විමුක්තිදායකයාණන් තුළ සංරක්ෂිත දයාවේ සාන්තුවරියන් ඒ ශක්තියෙන් තවත් ඔද වැඩෙනු ඇත. සිරගෙය තවත් දයාවේ නිවසක් බවට ඔවුන් පත්කරනු ඇත. මනසින් පමණක් තර්ක කරමින් අඳුරු අගාදයේ ලිංමැඩි ජනතා කොටසකට හදවතත් මනසත් සමබර කරන ප්‍රබල ආධ්‍යාත්මයක පිරිපුන් බව කියා දෙන්නට මෙම සාන්තුවරියන් වචනයෙන් තොරව ක්‍රියාවෙන් තව තවත් පන්නරය ලබනු ඇත. එදාට තමන්ගේ සොහොයුරියවත් මෙම නිවසකට මොවුන් රැගෙන විත් පිළිසරණක් ඉල්ලුවොත් ඒ පිළිබඳවද අප පුදුම වන්නේ නැත.

**2011.11.24 වන දා "ගොසිප් ලංකා" වෙබ් අඩවියෙහි "මොරටුවේ බේබි ෆාම් එකකින් බිළිඳුන් 75ක් ගැබිනියන් 20 ක් හමුවෙයි" යනුවෙන් ඇති වාර්තාව සමඟ දක්වා ඇති ප්‍රතිචාර සටහන් 102 ක් ද 2011.11.25 "ලංකා ඊ නිව්ස්" වෙබ් අඩවියෙහි "ළමා නිවසක් මුවාවෙන් පවත්වාගෙන ගිය කුඩා දරුවන් ලක්ෂ ගණන් වලට විකුණන මහා පරිමාණ ජාවාරමක් හෙළි වෙයි" යනුවෙන් ඇති වාර්තාව සමඟ දක්වා ඇති ප්‍රතිචාර සටහන් 09 ක් ද 2011.11.27 වන ඉරිදා ලංකාදීප පුවත් පතේ 3 වන පිටුවේ "මේ ළමයින් විකුණුවා ද" යනුවෙන් ඇති ලිපිය ද අනිකුත් මාධ්‍ය වාර්තා ද අවධානයට ලක් කළ "මීගමුවේ කතෝලික ශාසනාරක්ෂක බලමණ්ඩලය" 2011.11.28 දින නිකුත් කළ ප්‍රකාශයයි මේ.**

# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## ළමුන් සඳහා ම ද ?

ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් "1929" දුරකථන අංකය හඳුන්වා දීමත් සමඟ එම ආයතනයේ සභාපති අනෝමා දිසානායක මහත්මිය පුදුමාකාර ජනප්‍රියත්වයක් කරා ඇදගෙන යාමට ජනමාධ්‍ය ආයතන කිහිපයක් දුන් සහයෝගය ඇය හා ඇගේ අධිකාරියේ සෙසු නිලධාරීන් අගය කරනු නොඅනුමානය. එකී ප්‍රචාරය නිසා ළමුන් අරබයා කම්පාවන ජනතාව ද ඇය වටා රොක් වීම වැළැක්විය නොහැකිය. අසරණ ළමා පරපුර ආරක්ෂා කරන්නට මෙවැනි ආයතනයක් තිබීම කොතරම් අගනේ ද? මතු පරපුර ඉදිරියට ගෙන යන්නට වත්මන් දරුවා ප්‍රබල සාධකයක් වන බව අමුතුවෙන් කිවයුතු ද නොවේ.







එහෙත් මතු පරපුර වන දරුවන් ආරක්ෂා කරන්නේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් පමණක් ද? දරුවන් ආරක්ෂා කර, නඩත්තු කර, නිරෝගී කර, අධ්‍යාපනය ලබා දී සමාජ ගත කරන දෙමාපියන් තම යුතුකම් ඉටුකරන්නා සේම, දෙමාපියන් හෝ භාරකරුවකුගෙන් තොරව අසරණ වන දරුවන් රැකබලා ගෙන දෙමාපියන් අතින් සිදුවිය යුතු යුතුකම් හා වගකීම් ඉටු කරන පුන්‍ය ආයතන කිහිපයක් මෙරට තුළ ක්‍රියාත්මක වන්නේ වසර සිය ගණනක් ඈතට දිව යන ඉතිහාසයකට නෑකම් කියමින් වග හා ඒ බොහෝමයක් පුන්‍ය ආයතන කතෝලික සභාවේ භාරකාරත්වය තුළ පවත්වාගෙන ආ ඒවා බව ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය තේරුම් ගෙන තිබෙනවා ද යන්න සැක සහිතය.

ළමුන්ගේ ආරක්ෂාව ගැන පමණක් සොයා බලන අධිකාරිය මෙවැනි පුන්‍ය ආයතන නඩත්තු කරන්නේ කෙසේ ද කියා හෝ එම ආයතනවල අපහසුතාවයන් ගැන හෝ කැප වී සේවය කරන අය ගැන හෝ නොසලකා කටයුතු කරමින් සිටිනවා පමණක් නොව, එම පුන්‍ය ආයතන වලට ගරහමින් තම පුද්ගලික ජනප්‍රියත්වය හඹා යන්නට ජනමාධ්‍ය උපයෝගී කර ගැනීම නිසා, අනාගතයේ දී අප රට තුළ අසරණ වන දරුවන් ආරක්ෂා කරන්නට ඉදිරිපත් වන පුද්ගලයකු හෝ පුන්‍ය ආයතනයක් නැති තැනට ඇද දමන ක්‍රියා පිළිවෙතක් බව, මෙරට ජනතාව අවබෝධ කරගත යුතුව ඇත. ඊට හේතු වී ඇති කාරණා විමසා බැලීම ද අපගේ කාර්යයක් වනු ඇත.

ඉහත කී 1929 අංකය දොරට වැඩීමත් සමඟ ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ක්‍රියාත්මක වීමේ දී තම ආයතනය වෙත ගලා ආ තොරතුරු පිළිගෙන ඇත්තේ, සිහි බුද්ධියකින් තොරව "කහඹිලියා වැල් රොත්තක් අත මිට මොලවා ගත් අයකු එයින් තම පිට කසා ගත්තා වැනි ව"ය. ලද තොරතුර කුමක් ද? කාගෙන් ද? නිවැරදි ද? දිරච්ච ලණුවක් ද? යන්න හරිහැටි සොයා නොබලා ක්‍රියාත්මක වීම හේතුවෙන්, පිට තුවාල වන තුරු කසා ගන්නට ජනමාධ්‍ය ළං කර ගැනීම කොතරම් කණගාටුදායක ද? එවැනි තොරතුරක් හඹා ගොස් ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මොරටුව රාවතාවත්තේ දී තම අධිකාරියේ සාරධර්ම පසෙකලා සුරක්ෂිත කරගත්තා ද යන්න දන්නේ ඔවුන්ම ය.

මෙම ස්ථානය කුමක් ද? කාගේ ද? යන්න හෙළිදරව් නොකිරීමට සිද්ධිය වාර්තා කළ මාධ්‍ය ආයතන ප්‍රවේසම් වී ඇතත්, පුවත්පත් වල මුද්‍රණය වී ඇති ඡායාරූප හා අන්තර්ජාල වෙබ් අඩවි සටහන් හා මත දැක්වීම් අනුව මෙම ස්ථානය අනාවරණය වී ඇත. මීට වසර 20 කට පෙර භාග්‍යවත් තෙරේසා මව්තුමිය ජීවත්ව සිටි සමයේ අසරණ ළමුන් වෙනුවෙන් සරණය වන්නට මෙම ආයතනය ආරම්භ කර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පානදුර පරිවාස කාර්යාලය සමඟ නීත්‍යානුකූලව සම්බන්ධ වී ඉතා සහයෝගයෙන් කටයුතු කර ඇති මෙම පුන්‍ය ආයතනය ළමුන් හදාවඩාගෙන ඇත්තේ ද නීත්‍යානුකූලව ය. මෙය රහසිගත ආයතනයක් ද නොවේ. මෙවැනි ආයතනයක් සම්බන්ධව කටයුතු කිරීමේ දී ගෞරවාන්විතව පරීක්ෂණ මෙහෙයවීම අධිකාරියේ යුතුකමක්ව තිබුණි. එවැනි සදාචාරාත්මක හැසිරීම් මෙවැනි ආයතනයකට කියා දෙන්ට අවශ්‍යතාවයක් ද නැත.

මෙම ආයතනය හෝ පාලකයන් නිසා කිසිම දරුවකුට අයහපතක් සිදුවී ඇති වගක් දැනගන්නට නැත. නමුත් විවිධාකාර උපකල්පන හා මවාපෑම් ජනමාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කර ඇති ආකාරය නින්දිතය. මස් සඳහා කුකුලන් ඇතිකරන කොටුවක් මවා පා පෙන්වන්නට මෙම මොරටුව පුන්‍ය ආයතනය "බේබි ෆාම්" කර අර්ථ දක්වා ඇති ආකාරයත්, කැපකරු මාපියන් වන්නට ඉදිරිපත් වූවන් දරුවන්ගේ අවයව උදුරා ගන්නන් ද යන සැකය මහා ඉහළින් උළුප්පා දක්වා තිබෙන ආකාරයත්, නුසුදුසු ආකාරයෙන් ගැබ්ගත් මව්වරුන් හා උපදින දරුවන් අසරණ නොකර ආරක්ෂා කිරීම මහා පාප කර්මයක් බව හුවා දක්වා ඇති ආකාරයත් විමසා බැලීමේ දී යම් ගුප්ත

15 පිටුවට »

**මීගමුවේ කතෝලික ශාසනාරක්ෂක බල මණ්ඩලය**



මීසමෙන් මීසමට

# අභිෂේකය තුළින් වගකීමක් පැවරෙනවා! ආලේපය තුළින් ශක්තිය ලැබෙනවා!

## කුරුණෑගල රදගුරු හිමි මල්පිටියේ දී පවසයි

**අභිෂේකය තුළින් වගකීමක් පැවරෙනවා. ආලේපය තුළින් ශක්තියක් ලැබෙනවා. ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් ඕනෑම වගකීමක් කරදර වලට අභියෝග වලට නොසැලී මුහුණදීමට අවශ්‍ය ශක්තිය ලැබෙනවා. ඒ ආලේපය තුළින් ක්‍රිස්තුස් වහන්සේගේ රක්ෂාවරණය ලැබෙනවා. ඒ අනුව සකල ලෝකයා වෙත ගොස් ශුභාරංචිය දේශනා කිරීම ඔබට පැවරෙන බව කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණෝ මල්පිටිය ශුද්ධවූ සෙබස්තියන් මුනිතුමාගේ දේවස්ථානයේදී දරුවන් 65 දෙනෙකු සඳහා අභිවෘද්ධියාලේපය ප්‍රදානය කිරීමේ මෙහෙයේ දී පැවසූහ.**



කුරුණෑගල පදවි භාග්‍යවත් ජුසේවාස් කමිටු අධ්‍යක්ෂ, කුරුණෑගල දිසානායක මල්පිටිය මීසම් සේවක ගරු ජෝර්ජ් ලින්ටන් පෙරේරා පියතුමාගේ සංවිධානයෙන් හා පුහුණුවෙන් මේ අවස්ථාව සංවිධානය කර තිබිණ. දරු දැරියෝ මෙහිදී සක්‍රමේන්තුව ලබාගත්හ.

බී. කේ. ටී. රෙජිනෝල්ඩ්

## සාම මිහිර 10 දා දොරට වඩී

සාම මිහිර ජාතික නත්තල් කලාපයේ 53 කලාපය ඥානාර්ථ ප්‍රදීපය කර්තෘ ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ ප්‍රධානත්වයෙන් දෙසැම්බර් 10 පෙ.ව. 9.30 ට රාගම තේවත්ත, සා. ජෝශප් ළදරු පාසල් රංග ශාලාවේදී දොරට වඩී.

පිටු 52 කින් සමන්විත මෙම නත්තල් වාර්ෂිකය ඔබටත් ගෙන්වා ගැනීමට සංවිධායක, සාම මිහිර ජාතික නත්තල් කලාපය, 'මච්මරි' 822/ ජේ. ධර්මපාල මාවත තේවත්ත, රාගම යන ලිපිනයට රු. 45 ක මුද්දරයක් සහිතව ඔබගේ ලිපිනය යොමුකරන්න.

ජයන්ත ශ්‍රී පද්ම කුමාර



හැඳල නායකකන්ද කානික්ක දේවමාතා දෙව්මැඳුරේ 150 ජයන්තියට සමගාමීව ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ නායකකන්ද ශාඛා සංවිධානය විසින් වෛද්‍ය සායනයක්, රෝද පුටු බෙදා දීමක්, ඇස් කන්නාඩි ප්‍රදානයක් හා වසර 60 ඉක්මවූ වැඩිහිටියන් වෙනුවෙන් හැඳනුම්පත් බෙදා දීමක් පසුගියදා දෙව්මැඳුරු පරිශ්‍රයේදී මාබෝල හා මත්තුමගල සිංහ සමාජවල පූර්ණ අනුග්‍රහයෙන් පවත්වන ලදී. මේ සත්කාරය ආරම්භයේ නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා ආසිරි ගැන්වීම් කල අතර ක්‍රි.ක.ව්‍යා නායකකන්ද ශාඛා සභාපති කිංස්ලි සෙනරත් කළුආරච්චි සිරිමාරගේ ඇතුළු සාමාජික පිරිස මෙය සංවිධානය කළහ.

ඇලොයි කහඳවිට ගමගේ

# පදවිය පුබුදුවාලන විදුලි බලාගාරයක් වන්න

සාමාජික පිරිස අඩුයි කිය අධෛර්ය නොවී ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී යාච්ඥාව හා ප්‍රශංසාව තුළින් පදවිය පුබුදුවාලන විදුලි බලාගාරයක් වන්නැයි කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි රදගුරු හිමිපාණෝ කුලියාපිටිය 'සත්පහන' ශාලාවේ දින දෙක හමාරක් තිස්සේ පැවති කුරුණෑගල පදවි කිතු දන පුබුදු ජනතාවගේ ධර්ම විවේකය ආරම්භ කරමින් පැවසූහ.

ගිහි අපෝස්තලික ව්‍යාපාරවල අඩුපාඩුකම් තිබුණත්, අඩුපාඩුකම් මධ්‍යයේ වවුද කිතු දන පුබුදුව සභාවට විශාල මෙහෙයක් කර තිබෙනවා. විවිධ දුෂ්චරිතවලට ඇබ්බැහිවූ බොහෝ පිරිස් පුබුදුවට සම්බන්ධවී සැබෑ ජීවිත වෙනසක් කරගෙන තිබෙනවා. දේව වචනයෙන් පවුල් ශක්තිමත් කර ගෙන. රෝහල්වල, නිවෙස්වල දුක් විඳින ජනතාව මුණ ගැසෙමින් රැළෙන් ඉවත්වූ පිරිස් නැවත රැළට එක්කර ගෙන මූලධර්මවාදින්ට අභියෝගයක් වන්නැයි රදගුරු හිමිපාණෝ පුබුදු ජනතාවගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටියහ.

මේ අවස්ථාවට කුලියාපිටිය මීසම් සේවක ගරු සුගත් තිසේරා මීසම් සහායක ගරු ජූඩ් ලසන්ත, ගරු ක්‍රිස්ටි කුමාර, උඩුබද්දාව මීස්ම සෙවක ගරු ගාමිණී බෲනෝ යන පියවරුන්ද, සුරදූතික බාලිකා විදුහල්පති ගරු මොරි බ්‍රියට්‍රිස් පැවිදි සොයුරියද සහභාගි වූහ.

කොන්ස්ටන්



තේවත්තේ ලූර්දු දේවමාතා දෙව් මැඳුරේ සාන්ත වින්සෙන්ති ද පාවුලා කොන්පරන්සිය විසින් ලංකා මාතා ඒකකයේ දරුණු පිළිකා රෝගයෙන් පෙලෙන වයස අවුරුදු 17 ක තරුණ දරුවකුට මීසම් සේවක ගරු ප්‍රිය ජයමාන්න පියතුමාගේ අනුග්‍රහය ඇතිව මීසම් වාසීන්ගෙන් රු. 82,300.00 ක මුදලක් එකතු කර පරිත්‍යාග කරන ලදී. ගරු පියතුමා එය පරිත්‍යාග කළ අවස්ථාව.

## ක්‍රිස්තු රාජ මංගල්‍යය සලාපුරදී සැමරේ

"අපි දෙවියන් වහන්සේට ගරුබිය දක්වමින්, තම සහෝදරයාට දයාවත්, ප්‍රේමයත් පෙන්වමින් ජීවත්වීම අවශ්‍ය වේ. එසේම අපි කරන දේ දේව මහිමය සඳහා මිස අපගේම මහිමය සඳහා නොවිය යුතුයි. අවසාන විනිශ්චය දිනදී ක්‍රිස්තුන් වහන්සේ අපෙන් අසන ප්‍රශ්න වලට නිසි පිළිතුරක් දීමට නම් අපගේ ජීවිතය මෙසේ විය යුතුයි."

හලාවත පදවි ගිහිදූත සේවා අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් පියතුමා මෙසේ ප්‍රකාශ කළේ පදවි දිව්‍ය හෘදය සංඝය එක්ව පැවැත්වූ ක්‍රිස්තු රජාණන්ගේ මංගල දිව්‍ය පූජා යාගයේ දී ය.

පදවියේ දිව්‍ය හෘදය සමිති වලින් විශාල සාමාජික පිරිසක් මෙදින මෙම මංගල්‍යයට සහභාගි වූහ. ලංසිගම වැඩිහිටි නිවාසීය රැස්වීම් ශාලාවේදී පැවැත්වූ මෙම මංගල්‍ය අර්ථවත් කරගැනීමට වැඩිහිටි නිවාසය භාර ප්‍රධාන මව්තුමියගේ හා අනිකුත් සොහොයුරියන්ගේ සහය නොමඳව ලැබීම විශේෂත්වයකි.

එලිසබෙත් ඇන්

## වැන්දඹු දිනය ප්‍රශංසාරාමයේ

පසුගියදා දියගල ශ්‍රී ප්‍රශංසාරාමයේ දී වැන්දඹුවන්ගේ දිනය පැවැත්විනි. දාහකට ආසන්න වැන්දඹුවන් පිරිසක් මෙයට සහභාගි වූහ.

දෙවිඳුන්ගේ දයා ප්‍රේමයෙන්, මානසික හා අධ්‍යාත්මික සහන සැනසුම් සුව සමඟින්, කවදාවත්ම තමන් තනිවී නැති බව පිළිබිඹු වෙමින් රංගන, ගැයුම්, ඉදිරිපත් කරමින්, ඉතාමත් සතුටින් මෙම පැය කීපය ඔවුහු ගත කළහ.

එදින දිව්‍ය පූජා යාගය ගරු සිරි ඔස්කා අබේරත්න පියතුමන් අතින් පුදනු ලැබීය.

මිලිනා කොස්තා

## වෙන්නප්පුවේ ලේ දන්දීමේ වැඩසටහනක්

වෙන්නප්පුව සාන්ත ජෝශප් දේවස්ථානයේ විසෙන්තියානු සමිතියේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී ලේ දන්දීමේ වැඩසටහනක් පවත්වන ලදි.

මෙම අවස්ථාවට වෙන්නප්පුව සහයක ගරු ෂෙහාන් පර්ඩිනන්ඩ් පියතුමාද සහභාගි විය. මෙහිදී ප්‍රථමයෙන් ලේ පරිත්‍යාග කිරීම ගරු ෂෙහාන් පර්ඩිනන්ඩ් පියතුමන් විසින් සිදුකරන ලද අතර ප්‍රදේශවාසී විශාල පිරිසක් මෙදින ලේ පරිත්‍යාග කළහ.

කේ. නිහාල් ප්‍රනාන්දු

## වකුගඩුවක් ඕනෑ!



කටුනේරිය, ඉහළ කටුනේරිය, නො. 62 හි පදිංචි චාලට් කොන්සි නම් තිදරු මව දරුණු වකුගඩු ආබාධයකින් පෙලෙන්නීය. ඇයගේ ජීවිතය බේරා ගැනීමට වකුගඩුවක් බද්ධ කිරීම අත්‍යාවශ්‍ය බව කොළඹ මහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් නිර්දේශ කර ඇත.

$B^+$ හෝ $O^+$ යන ලේ වර්ගය හිමි වයස අවු. 25 ත් 50 ත් අතර පරිත්‍යාගශීලි අයකුට ආරාධනා!

මේ අතර ලේ මාරුකිරීම සඳහා දැනටමත් මුදල් වැයවන බැවින් එය සාර්ථක කර ගැනීමට මූල්‍ය වශයෙන් ආධාර කිරීමට කැමති පරිත්‍යාගශීලි අය සිටී නම් වෙන්නප්පුව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම් අංක 1-0029-01-4539-4 යටතේ U.M.C.K Perera නමින් ඇති ගිණුමට මුදල් පරිත්‍යාග කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු. විමසිය හැකි දුරකථන අංක 0312245318, 0774414177



දොන් බොස්කෝ මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු කටාන - හල්පේ ශා. ප්‍රැන්සිස් සාවියර් මුනිඳුන්ගේ දේවස්ථානයට වැඩම කළ අවස්ථාවේ දී කටාන දිසානායක සහ හල්පේ මීසම් සේවක ගරු අමිල ගෝමස් පියතුමා ශුද්ධවූ ධාතු භාරගෙන දෙව්මැඳුර කරා වැඩමවා ගෙන යන අයුරු.

සිසිල් ඩැනීසියස්

# තලාහේන සා. බාර්බරා මුනි දෙව්මැඳුර



සාන්ත බාර්බරා මුනිවරියට ශ්‍රී ලංකාවේ කැපකරණ ලද එකම දෙව්මැඳුර මීගොමු - තලාහේනේ ග්‍රාමයෙහි පිහිටා ඇත.

තලාහේන මුල්ම දෙව්මැඳුර ක්‍රි.ව. 1827 දී ඉදිකරන ලද්දකි. එය පොල් අතු සෙවිලි කරන ලද්දකි. එය ඉදිකරන ලද්දේ තලාහේන, මීගමුව මීසම යටතේ තිබිය දී ය. මීගමුවේ ජෝසේ දෙ ෆ්‍රියාස් ගරු පියතුමාගේ මගපෙන්වීම යටතේය.

ප්‍රදීපයක අසිරිය

දැන් පවතින දෙව්මැඳුර ගොඩනැඟීම අරඹන ලද්දේ 1883 වසරේ දී එවකට තලාහේන පාලනය කරන ලද පමුණුගම මීසම් සේවක ලියෝ රත්නායක පියතුමාගේ මෙහෙයවීම මතය.

එවකට අගරදගුරු (කොළඹ ප්‍රථම අගරදගුරු) අතිඋතුම් ක්‍රිස්ටෝපර් බොන්ජන් නි.ම.නි හිමිපාණන් විසින් මුල් ගල ආසිරි ගන්වන ලද බව සඳහන්වේ. 1884 දී, මෙම අලංකාර දෙව්විමන නිමවන විට, තලාහේන පාලනය වූයේ දූව - පිටිපන මීසමේ පාලනය යටතේය. ප්‍රංශ ජාතික නි.ම.නි ධර්මදූතවරයකු වූ ගරු ලප්ලැක් පියතුමාගේ අධීක්ෂණය යටතේය. මෙම දෙව්මැඳුරට දැනට අවුරුදු 117 ක් සපිරේ.

ප්‍රැන්සිස් ද සිල්වා



මැද කොළඹ දිසාවේ දිව්‍ය හෘදය සමිතිවල සියළුම සාමාජික සාමාජිකාවෝ පසුගිය දා නැසීගිය විශ්වාසකයින් සිහිපත් කිරීම නිමිත්තෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ නැදුම්කරන් ගම්මානයේ යුද්ධයෙන් අසරණ වූ ළමුන් සඳහා පොත් බෑග්, වතුර බෝතල්, පොත් ද වියළි ආහාර ද්‍රව්‍ය ද බෙදා දීමක් සිදුකළ අතර ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය ද ඔවුන් සමඟ සැමරූහ. මේ අවස්ථාවට මැද කොළඹ දිව්‍ය හෘදය සමිති දිසා අධ්‍යක්ෂ, අගරදගුරු පදවි රෝහල් උපාධ්‍ය ගරු දිලීප ජයමහ නි.ම.නි පියතුමා සමඟ කොළොන්නාව සා. ජෝශප් කන්‍යාරාමයේ පැවිදි සොයුරියක් සහභාගි වූහ. බොරැල්ල, කොළොන්නාව, ගොතටුව, කොටිකාවත්ත, සේදවත්ත, දෙමටගොඩ යන මීසම් වාසීහු සහභාගි වූහ.

# අප වෙනුවෙන් මැදහත්වන දේව අම්මා



"උපන් දා සිට කරපු පවු නැත වරක් වැන්දොත් කැළණියේ" යන සැළලිහිණි සන්දේශයේ සඳහන් කවිය කෙසේ වෙතත් දුරුතු පොහොයට කැළණි පෙරහර බැලීමට යාම අපගේ පුරුද්දක් විය. තාත්තා අම්මා ද මා ද මගේ සහෝදර සහෝදරියන් ද කැටුව බියගම පාර දිගේ කැළණිය විහාරයට එක්කරගෙන ගියේය. මෙම ගමනට මා විශේෂ කැමැත්තක් දැක්වූයේ මඟ දෙපස තිබූ සෙල්ලම් බඩු කඩයකින් මා විශේෂයෙන් කැමැත්තක් දැක් වූ සෙල්ලම් කාර් එකක් ලබා ගැනීමට එය හොඳ අවස්ථාවක් වූ බැවිනි. එක් සෙල්ලම් බඩු කඩයක තිබූ රතු පැහැති කාර් එක දෙස මගේ දෙනෙත් ඉබේටම වාගේ යොමු විය. හෙමින් සීරුවේ අම්මාගේ කනට කොඳුර, කථා කළ මා "අම්මේ අර රතු පාට සෙල්ලම් කාර් එක තාත්තාට කියල මට අරන් දෙන්නකො" කියා කීවෙමි. තාත්තාට කතා කළ අම්මා "අර ජේන සෙල්ලම් කාර් එකට පුතා ආසයි කියනව" කියනු මට ඇසිණ. එම කාරය අතට ගත් තාත්තා එයට නියමිත මුදල ගෙවා මට ලබා දුන්නේය.

මෙහිදී අම්මා සිදුකළේ කුමක් ද? ඇය ඒ සඳහා මුදල් ගෙවුවා ද? නැත. ඇය කළේ එම සෙල්ලම් බඩුව ගැනීම සඳහා මා වෙනුවෙන් මැදිහත්වීම පමණයි. ඇයි මා එම ඉල්ලීම අම්මා මාර්ගයෙන් කරනු ලැබුවේ? තාත්තා අම්මාට මහත් ආදරයක් දැක් වූ බැවින් කවර දිනෙකවත් තාත්තා, අම්මාගේ ඉල්ලීම ඉවත නොදමන බව දැන සිටි මා අම්මා මාර්ගයෙන් එම ඉල්ලීම කළහොත් මට අවශ්‍ය දේ ලබා ගත හැකි බව මම දැන සිටියෙමි.

දේව මෑණියන් ද අපගේ අවශ්‍යතාවයන් සඳහා මැදහත් වන්නේ මේ ආකාරයට යි. ස්වකීය මාතෘක ප්‍රේමය කරණකොටගෙන මරිය තුමිය කිතු තුමන්ගේ සහෝදර ජනතාවට බාධක හිරිහැර කරදරවලින් මුදවා තෘප්තිය ලබා දීමට මැදහත් වන්නීය. මරිය තුමිය මැදහත්කාරිය ලෙස හඳුන්වන්නේ ඒ නිසා ය.

> **"**
>
> **ආත්ම ශරීර සහිතව පරලොවට වැඩිය සැනින් ඇය ස්වකීය ගැලවීමේ කාර්යයෙන් ඉවත් වූයේ නැත. ඇය අද දක්වාම මවකගේ මාතෘක ප්‍රේමයෙන් යුක්තව ස්වකීය පුත්‍රයාගේ සහෝදර කිතුනු ජනතාව සතුරාගෙන් අමාරුකම්වලින් මුදවා රැකවරණය දෙමින් පියාණන්ගේ මෝක්ෂ සුගතියට යොමු කිරීමට උත්සුක වන්නීය**
>
> **"**

"ලූමෙන් ජෙන්සියුම්" සසුන් පණිවුඩයේ මෙසේ සඳහන් වේ.

"ජේසු සමිඳුන් තම කුස පිළිසිඳගත් අවස්ථාවේ සිට දරුණු වේදනා විඳ කුරුසියේ උකුත් වූ අවස්ථාව දක්වාම මරිය තුමිය විශ්වාසයෙන් යුක්තව බලාපොරොත්තු සහිතව දැල්වෙන ප්‍රේමයෙන් ආත්මයන් ගලවා ගැනීමේ කාර්යයට හවුල් වූවාය. එහි ප්‍රතිඵලය වූයේ මරිය තුමිය අපේ අම්මා වීමයි. ආත්ම ශරීර සහිතව පරලොවට වැඩිය සැනින් ඇය ස්වකීය ගැලවීමේ කාර්යයෙන් ඉවත් වූයේ නැත. ඇය අද දක්වාම මවකගේ මාතෘක ප්‍රේමයෙන් යුක්තව ස්වකීය පුත්‍රයාගේ සහෝදර කිතුනු ජනතාව සතුරාගෙන් අමාරුකම්වලින් මුදවා රැකවරණය දෙමින් පියාණන්ගේ මෝක්ෂ සුගතියට යොමු කිරීමට උත්සුක වන්නීය. මේ හේතුව නිසාම ඇය අපගේ මැදහත්කාරිය වන්නීය

එදා කානා නුවර විවාහ මංගල අවස්ථාවේ මිදියුෂ හිඟ වූ විට දේව මෑණියෝ එතැනින් මඟ හැර ගියේ නැත. සිදුවන්නට යන අවමානය, ලජ්ජාව ඇය දැන සිටියාය. ජේසු සමිඳුන් වෙත යන ඇය "පුතේ මිදි යුෂ නැහැනෙ" (ජුවාම් 2:3) කියා පවසන්නීය. සිදුවන්නට යන අවමානයෙන් මුදා ගැනීමට ජේසු සමිඳුන්ට හැකි බව ඇය දැන සිටියාය.

"පුතේ මිදියුෂ නැහැනෙ" යන මරියාවන්ගේ කියමන අපට මහත් ධෛර්ය ගෙන දෙන්නකි. එදා එම අවස්ථාවේ තිබූ අඩු පාඩුව ජේසු සමිඳුන්ට පවසා මරිය තුමිය විසඳුමක් බලාපොරොත්තු වූවා නම් අපගේ දුක් කරදර අවස්ථාවල දී ද ජේසු සමිඳුන් වෙත ගොස් "ඔවුන් ඒ දුක් අමාරුකම් වලින් මුදවා සැනසීමක් ලබා දෙන්න" කියා පවසනු නොඅනුමානයි. අපත් අපට මුහුණ දීමට සිදුවන කරදර, බාධක, ලෙඩ දුක්, අමාරුකම් සියල්ල දේව මෑණියන්ට බාර දෙමු. එතුමිය අපට සැනසීම දෙනවා නියතයි. දෙව් මවුගේ උපත සමරන අප, මරිය තුමිය වෙතින් ජේසු සමිඳුන් වෙතට යාම අපේ අරමුණ කරගනිමු.

**එරික් පෙරේරා**
**ඔස්ට්‍රේලියාව**

## ධර්ම සංග්‍රහය

උදාවූ ආගමන සමයත් සමඟ අපි තවත් ජනවන්දනා වසරකට පා තැබුවෙමු. ආගමනය යනු, නත්තලට සූදානම් වීමක් පමණක් නොවේ. අපගේ ඉදිරි අනාගතය සඳහා හැඩගැසෙන්නට කරන ඇරයුමක් ද වෙයි. මෙම කාලය තුළ දී ශු. සභා මාතාව අපේක්ෂා කරන්නේ, සභාවක් වශයෙන් අප තුළ වර්ධනයක් නවතාවයක් ජීවිත වෙනසක් ඇතිකර ගැනීමයි. ක්‍රිස්තුන් වහන්සේ අප ජීවිත වලට ඇතුළු වෙමින් අප තුළ නව උපතක් ඇති කරන කාලය වශයෙන් ආගමන කාලය වැදගත් ය. තවද අනාගතයේ දී තේජාලංකාරයෙන් යුතු වූ ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනයත් මේ සමය තුළ දී විශේෂාකාරයෙන් සැමරේ. ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට පැමිනි බවත් අද ලෝකය තුළ උන්වහන්සේ ජීවමානව වැඩ සිටින බවත් අද ලෝකය තුළ උන්වහන්සේ ජීවමානව වැඩසිටින බවත් උන්වහන්සේ බලයෙන් හා මහිමයෙන් යුතුව යළි වඩිනා බවත් තහවුරු කිරීම කිතුනුවාගේ යුතුකම ය.

# කිතු සමිඳුන් පිළිගන්නට අප සූදානම් ද?

දුක් විඳින අසරණ පීඩිත ජනතාවගේ පිළිසරණය වන්නේ වඩින්නට සිටින මිදුම්කරුවාණන් වන ක්‍රිස්තුන් වහන්සේ ය. උන්වහන්සේගේ අනුගාමිකයින් වන අපි නූතන සමාජයේ අප කොතෙක් දුරට යාච්ඤාශීලිව ආනන්දජනක බලාපොරොත්තුවකින් යුතුව අපගේ මිදුම්කරුවාණන් පිළිගන්නට සූදානම් වෙමු ද?

එදා ස්නාවක ජුවාම් තුමා ජනතාව සූදානම් කළේ කෙසේ ද, උන්වහන්සේගේ දෙවන පැමිණීමට අප සූදානම් විය යුත්තේත් එලෙසමයි. සිත් හැරීමකින්, ජීවිත පෙරළියක් තුළින්, පුද්ගලයින් වශයෙන්, පවුලක් වශයෙන්, සභාවක් වශයෙන් අපි අපගේ ජීවිතයන්හි ඇති සියළු ප්‍රපාතයන් පුරවමු. සියළු කඳුහෙල් සමතලා කරමු. වංගු ඇද හරිමු. රළු මාවත් මට්ටම් කරමු. ගැලවුම්කරුවාණන්ගේ ආගමනය සඳහා එසේ දේව ජනතාව සූදානම් කළ තිදෙනකුගේ ආදර්ශය ආගමන කාලයේ ශු. ලියවිලි තුළින් අපට මතක් කර දෙයි. ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගත වීම කලින් දැන් වූ යෙසායා දිවැසිවරයා ඉන් එක් අයෙකි. "සමිඳාණන් වහන්සේම නුඹලාට ලකුණක් දෙන සේක.

"බලන්න, කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන්නීය එම්මානුවෙල් නම ඔහුට තබන්නීය." (යෙසායා 7:14).

☛ 15 පිටුවට

✍ රීටා සේනානායක

# ආසියාකරයේ දහම් ගිනි සිළුව හා ශ්‍රී ලංකාව

අසේල දසනායක විසිනි

ශු. සභා මාතාව උඳුවප් මස 03 වන දින උත්සවශ්‍රීයෙන් සා. ප්‍රැන්සිස් සාවියර් මුනිඳුන්ගේ මංගල්‍ය සමරන්නීය. ක්‍රි.ව. 1506 අප්‍රේල් මස 07 වන දින ස්පාඤ්ඤයේ, නවාර් නගරයේ රදළ පවුලකට දාව උපත ලැබූ මෙතුමා පැරීසිය, මාර්ඩියුලස් යන උසස් විද්‍යාල වලින් ද පසුව ප්‍රංශයේ පැරිස් විශ්ව විද්‍යාලයෙන් කලා විෂයන් හා දර්ශනාවාදය හැදෑරිය. මෙතුමාගේ ඒකායන අරමුණ වූයේ උසස් වංශවත් රදළයකු ලෙස දිවි ගෙවීම ය. මේ නිසාම එකොළොස් වසරක් එනම් 1525 සිට 1536 දක්වා මෙකී පැරිස් විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරිය. 1529 දී ප්‍රථමයෙන් ශාස්ත්‍රවේදී (B.A.) උපාධිය ද, අනතුරුව ශාස්ත්‍රපති (M.A) උපාධිය ද දිනාගෙන මෙම විශ්ව විද්‍යාලයේ ම කථිකාචාර්ය පදවියකින් පුදනු ලැබුවේ ය. එහි දී එතුමාණෝ දර්ශනාවාදය පිළිබඳ ප්‍රබල දේශකයකු විය. සමාජයේ උසස් තාන්නමාන්න ලබාගෙන, ලෞකිකත්වය, ලෞකික ආශාවන් පසු පස හඹා යන්නට මුල දී එතුමන් සිතුව ද ලොයොලාහි ශා. ඉග්නාසියුස් මුනිඳුන්ගේ ඇසුරට ලක්වීමත් සමඟ



ම එතුමන්ගේ දිවි මඟ සමිඳුන් උදෙසා මුළුමනින් ම කැපකරලීමටත් සරල දැහැමි දිවි පෙවතකින් ඔවුන් වහන්සේට මෙහෙකරලීමට එතුමාණෝ තම අරමුණ කරගත්තේ ය. ඒ අනුව 1534 අගෝස්තු 15 වන දින ජේසු නිකායට බැඳී මෙකී අරමුණ සාක්ෂාත් කරලන්නට අදිටන් කර ගත්තේ ය. ඒ අනුව එකල ශුද්ධාසනය විසින් ධර්මදූතවරුන් පෙරදිග රටවලට යවන්නට ස්පාඤ්ඤ ජාතිකයන්ට හා පෘතුගීසි ජාතිකයන්ට අවසර දී තිබූ හෙයින් පෘතුගීසි අධිරාජ්‍යයාගේ අනුග්‍රහය ඇතිව ෆ්‍රැන්සිස සාවියර් මුනිතුමා ද ක්‍රි.ව. 1541 දී ලිස්බනයට පැමිණ iii වන ජෝන් රජුගේ අවසරය අනුව ශුද්ධාසනීය තානාපතිතුමකු ලෙසින් ක්‍රි.ව. 1542 දී ගෝවා පුරයට සම්ප්‍රාප්ත විය. එතැන් සිට ගෝවා ප්‍රදේශය ද දකුණු ඉන්දීය ප්‍රදේශය ද (වත්මන් චෙන්නායි, බැංගලෝර්, මැන්ගලෝරය,......) ආදී ප්‍රදේශවල ස්වකීය ධර්මදූතික මෙහෙවර ඉතා අසමසම හා අද්විතීය ලෙස ප්‍රචලිත කළේය.

සාවියෙර් තුමාගේ ධර්මදූතික මෙහෙවර ලැබුණු ප්‍රධාන ජනකොටසක් ලෙස දකුණු ඉන්දියානු පරවර ජාතිකයන් නම් කළ හැකිය. ඉන් අනතුරුව මලක්කාවට ද මොලුක්කා දූපත් වලට ද ජපානයට ද අනතුරුව චීනය බලා යන්නට උත්සුක වූ මේ ප්‍රබල දේව සේවයාණන්ගේ අද්විතීය හා අසමසම ධර්මදූතික මෙහෙවර තුළ ලක්ෂ සංඛ්‍යාත ලෙස ජනතාව කිතු දහම කරා ඇදී ආවෝ ය. එනමුදු මේ ලිපිය තුළින් කියා පාන්නට උත්සාහ කරන්නේ සා. ප්‍රැන්සිස් සාවියර් මුනිඳුන් හා ලාංකේය ශු. සභා සංවර්ධනය පිළිබඳව ය. මන්ද ශු. ප්‍රැන්සිස් සාවියෙර් මුනිඳුන් පිළිබඳව වෙනම පුළුල්



විෂයයක් ලෙස ද අධ්‍යයනය කිරීමට හැකිවන්නේ ය. ප්‍රැන්සිස් සාවියෙර් මුනිඳුන් දෙවන වර දකුණු ඉන්දීය පරවර ජනතාව අතරට පැමිණෙද් දී එවකට ලක්දිව මන්නාරම් දූපතේ විසූ කරෙයියාර් ජනයා ද තමන් අතරට පැමිණ සුබ වදන දේශනා කරන ලෙසත්, තමන් කිතුනුවන් වීමට අපේක්ෂා කරන හෙයින්, තමන්වද බෞතිස්ම කරන ලෙස ෆ්‍රැන්සිස් සාවියෙර් මුනිඳුන්ගෙන් ඉල්ලා සිටියහ. එනමුදු මෙකල පරවර ජනයා, විජය නගර රාජ්‍යයේ හේවායන්ගේ දැඩි පීඩනයට පාත්‍රව සිටි නිසා, ඔවුන් ආරක්ෂා කර ගැනීමට සාවියෙර් මුනිඳුන්ට මන්නාරමට ඒමට නොහැකි විය. එම නිසා මන්නාරමේ ජනයාට ප්‍රසාද ස්නාපනය ලබා දෙනු වස්, සාවියෙර් මුනිතුමා මන්නාරමට යවන ලද්දේ ගරු ජුවන් ද ලිසානෝ නම් ස්පාඤ්ඤ ජාතික ජේසු නිකායික පියතුමෙකි. එතුමන් විසින් මන්නාරමේ දී දහසක් පමණ ජනතාවට ප්‍රසාද ස්නාපනය ලබා දෙන ලද බව සඳහන් වේ. මෙලෙස මන්නාරමේ ජනයා දිනෙන් දින කිතුනුවන් වීම තම රාජ්‍යයට ඉමහත් තර්ජනයක් ලෙස සැලකූ යාපනයේ සංකිලි රජ තම සෙබළුන් මන්නාරමට යවා නව ක්‍රිස්තු භක්තිකයන් 600 ක් පමණ "තෝට්ටවේලි" නම් ග්‍රාමයේ දී මරා දමනු ලැබීය.

අදත් ඔවුන් සිහිපත් කරන සොහොන හා ස්මාරකයන් දක්නට ලැබේ. මෙකී ව්‍යවසනය ගරු ජුවන් ද ලියාගෝ පියතුමා ප්‍රමුඛ කාන්තාවන් හා ළමුන් ද පුරුෂයන් ද 600 දෙනකු ගොදුරු වූහ. මේ වසරේ එනම් ක්‍රි.ව. 1544 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සාවියෙර් මුනිඳුන් දකුණු ඉන්දියාවේ බටහිර මුහුදුකරයේ ධර්මදූතික මෙහෙවරේ නිරත වුණි. මෙම ආරංචිය කණ වැකුණු එතුමන්ට "මන්නාරමේ නව කතෝලිකයන් එතරම් ඉක්මනින් දෙවිඳුන් උදෙසා දිවි පිදීම ගැන එතුමා දෙවිඳුන්ට ප්‍රශංසා කළ අතර, සංකිලි වැනි කෲර රජවරුන්ට දඬුවම් නොකළහොත්, ක්‍රිස්තු භක්තිකයන් වීමට කැමති පෙරදිග ජනතාව, ඔවුන්ගේ රජවරුන්ට බියෙන් කිතු සමය වැළඳ නොගන්නා බැවින් කාටත් පාඩමක් වශයෙන් සංකිලි රජතුමන්ට දඬුවම් කළ යුතු යැයි සිතූ එතුමා ගෝවේ පාලකයන්ට ද ඒ ගැන දැන්වීය.

මීළඟට දායකත්වය වනුයේ එතුමාණන් ගාලු පුරයට පැමිණීමේ කථා පුවතයි. ඇතැම් දෙනා මෙය මුසාවක්, මිථ්‍යාවක් සේ සැලකුවද? අද මෙහි ලිඛිත වාර්තා ඒ ආකාරයෙන් දැක්වීමට මා බලාපොරොත්තු වෙමි.

☛ 15 පිටුවට

ජන වන්දනාව



# දෙවියන් වහන්සේ තුළ සුරැකෙමු

**මලින්ත බෝපෙආරච්චි විසිනි**

දෙවියන් වහන්සේ අපට දක්වන ආරක්ෂාව දිව්‍ය සංරක්ෂණය ලෙස හඳුන්වයි. උන්වහන්සේ සියළු අවස්ථාවල දී අප සැමගේ ආරක්ෂාව සම්බන්ධව සොයා බලන සේක. අප දෙවියන් වහන්සේ පිළිබඳව සිතනවාට වඩා දෙවිඳුන් අප පිළිබඳව සිතා බලන සේක. නොපියවෙන දෙනෙත් වලින්, නොමියෙන ආදරයකින් හා රැකවරණයකින් උන්වහන්සේ අපගේ සුබ සිද්ධිය ගැන සිතති. අපගේ ජීවිතය තුළ උද්ගතවන ගැටලු වලදී කරදර වලදී, අවහිරතා වල දී අප දෙවිඳුන් කෙරෙහි අවිශ්වාස කරන බව සැබෑවකි.

එහෙත් උන්වහන්සේ එම දුෂ්කරතා තුළින් පවා අප සවිමත් කරන සේක. උන්වහන්සේට අවශ්‍ය වන්නේ අපගේ අවශ්‍යතා අපට ලබා දීම පමණක් නොව අප සම්බන්ධව අසීමිත ආකාරයකින් රැකවරණයක් ලබාදීම මෙන්ම අවශ්‍යතාවන් ද උපරිම අයුරින් ලබා දීමයි. අප සංතෘප්තියට පත් කිරීමයි. ලෙඩරෝග, මරණ, පරාජයන්, අසාර්ථකත්වයන් පවා අපට පැමිණෙන්නේ දෙවිඳුන් දැනුවත්ව වන බව සිතා බැලිය යුත්තකි. අපට ඒවා නොමැති නම් අප උන්වහන්සේගෙන් ඈත් වී, උන්වහන්සේ අමතක කර වසර ලක්ෂ කෝටි ගණනක් ගත වී තිබෙන්නට පුළුවන. අපගේ දුෂ්කරතා වලදී පවා උන්වහන්සේ අප සවිමත් කරන සේක.

අපගේ ජීවිත ප්‍රශ්න වලදී, අවහිරතාවල දී, දුෂ්කරතා වලදී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ වැඩ වසන කිතු හිමියෝ අප දෙස දයාවෙන් ඇස් දල්වා බලති. අපට සවන් දෙති. එහෙත් අප විවිධ මං මාවත් ඔස්සේ සහනය සොයමින් ගිය ද අපට නතර වන්නට තිබෙන්නේ උන්වහන්සේ ඉදිරිපිටය. දෙවියන් වහන්සේ අපගේ ජීවිතයේ එක්

> **"අප දෙවියන් වහන්සේ පිළිබඳව සිතනවාට වඩා දෙවිඳුන් අප පිළිබඳව සිතා බලන සේක. නොපියවෙන දෙනෙත් වලින්, නොමියෙන ආදරයකින් හා රැකවරණයකින් උන්වහන්සේ අපගේ සුබ සිද්ධිය ගැන සිතති."**

දොරටුවක් වසද්දී තවත් දොරටුවක් විවර කරන සේක. අපගේ ක්‍රියාත්මක විශ්වාසය බවට එය පත්විය යුතුය. අද අපගේ ක්‍රිස්තියානි ජීවිත මංමුලාවී ඇත. වල්මත් වී ඇත. ඒ අප දෙවි සමිඳුන්ගේ නොමියෙන, ස්ථිරසාර රැකවරණය පිළිබඳව නොසිතන නිසාය.

දෙවිඳුන් හැර වෙනත් දේවල් කෙරෙහි ස්වාමිත්වය ලබාදීම නිසාය. එහෙත් උන්වහන්සේ අප කෙතරම් උන්වහන්සේ අමතක කළ ද ලුහු බඳින ආදරයකින්, මුවෙක් දිය සොයා ගමන් කරන්නාක් මෙන්ම සූරියකාන්ත මලක් හිරුදෙස බලා සිටින්නාක් මෙන් අප දෙස ඇස් දල්වා බලා සිටිති. අපව අමතක නොකරති. එසේ වුවද අප සුළු වේදනාවක දී පවා උන්වහන්සේට බැණ වදිති. දෝෂාරෝපණය කරති. වෛර කරති. මැසිවිලි නඟති. අවිශ්වාස කරති. එය අපට ආවේණික පාපයයි.

අප දෙවිඳුන්ගේ දයා, කරුණාව, රැකවරණය නොපතා සිටින්නේ නම්, නොඅදහන්නේ නම් එය බත් දුන් අත සපා කෑමකට උපමා කළ හැකිය. වැදූ මවට ද්‍රෝහි වීමක් වැන්න. අප දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බැති සිතින් යුතුව අනුභව කරන විට උන්වහන්සේ ජීවමාන අත්දැකීමක් වෙමින් ක්‍රියා කරන සේක. දිව්‍ය අභිමුඛය හෙවත් දෙවියන් වහන්සේ අප ඉදිරියෙහි වැඩ සිටීම, ජීවමාන වැඩ සිටීම සත්‍ය සම්මුඛභූතිය ලෙස හඳුන්වයි. දෙවියන් අපට මෙලොව ජීවිතය ලබා දී ඇත්තේ අපට අවශ්‍ය නිසා නොව උන්වහන්සේට අපව අත්‍යවශ්‍ය වන හෙයිනි.

ජීවිතය යනු නොකළ වරදකට වන් දි ගෙවීමක් බැව් ඇතැමෙක් සිතති. එහෙත් එය අර්ථශුන්‍ය අදහසකි. පදනම් විරහිත අදහසකි. දෙවියන් වහන්සේ අපගේ වුනවමනා ඉෂ්ට කරන්නේ සරල රේඛාවක් මෙන් නොව වක්‍ර රේඛාවක් මෙන් ය. පඩි පෙළක් මෙන් ය. එම උදාරාර්ථය අවබෝධ කර ගැනීමට අපට ඇඩි දේව ඇදහිල්ලක් පැවතිය යුතුය. සල මුතු (ස්ථිර) ආදරයක් අප දෙවියන් වහන්සේ කෙරෙහි දක්වන්නේ නම් උන්වහන්සේ මතු දිනෙක අපට උන්වහන්සේ දර්ශනය කිරීමේ පරමානන්දය ලබා දෙති.

# ආගමන කාලයේ දෙවන ඉරුදින

★ **පළමුවන කියවීම**
**(යෙසායා 4:1-5; 9-11)**

යෙසායා දිවැසිවරයාගේ පොතේ දෙවන කොටසෙන් ගත් මෙම පාඨයෙන් සමිඳාණන් වහන්සේගේ සැනසිලිදායක පණිවුඩයක් බැබිලෝනි විප්‍රවාසයේ සිටි ජුදෙව් ජනතාව වෙත ඉදිරිපත් කර ඇත. එනම් විප්‍රවාසයට ගෙන යනු ලැබූ ඔවුන්ට උන්වහන්සේ සමාව දී ආපසු තම දේශයට පැමිණීමට ඉඩ සලසන බවයි. මෙම කරුණ විචිත්‍රව ඉදිරිපත් කර ඇත්තේ කාන්තාරය මැදින් මහා මාවතක් තනා උන්වහන්සේ එඬේරකු තම බැටලුවන් තණබිමක් කරා ගෙන යන සේ ඔවුන් තම දේශය කරා රැගෙන එන ආකාරයට ය. එමඟින් සියලු ජනතාවන් උන්වහන්සේගේ බල පරාක්‍රමය මෙන් කරුණාව ද අත් දකින ඔවුන් බලාපොරොත්තුවක් ගෙනෙන එම පණිවිඩයේ දක්වා ඇත.

★ **දෙවන කියවීම (2 පේදුරු 3:8-14)**

පේදුරු තුමා මුල් කිතුනු ජනතාවට පවසන්නේ සමිඳාණන්ගේ පැමිණීමේ දිනය අප බලාපොරොත්තු නොවන මොහොතක, අප බලාපොරොත්තු නොවන ආකාරයකට උදාවිය හැකි හෙයින් දැහැමි ලෙස දිවි ගෙවමින් සූදානමින් සිටීම යෝග්‍ය බවයි. ඒ සමඟම එදින සියලු අයහපත් දේ අහෝසිවන අතර, දහමින් හා සාමයෙන් පිරි නව ලොවක උදාව සම්බන්ධ බලාපොරොත්තුවක් පුරාණ ගිවිසුමේ දිවැසිවර සංකේත මඟින් ඉදිරිපත් කෙරේ.

★ **ශුභාරංචිය**

සමිඳුන්ගේ මඟ සූදානම් කරන ස්නාවක ජුවාම් තුමා, යෙසායා හා මලාකි දිවැසිවරුන්ගේ ඉගැන්වීම් ආශ්‍රයෙන් ඉදිරිපත් කර ඇත. එතුමා සමිඳුන්ගේ මඟ සූදානම් කරන්නේ මනස්ථාපනය සඳහා වූ බෞතිස්මය දේශනා කරමින් හා ශුද්ධාත්මයාණන්ගේ බෞතිස්මය ගෙනෙන ජේසුස් වහන්සේ



ඉඟි කරමින් ය. එතුමන්ගේ සරළ දිවි පෙවෙත සිය පණිවුඩය ප්‍රකාශ කිරීමට බලවත් ආයුධයක් විය. ඒ නිසාම විවිධ ජන කොටස් වැල නොකැඩී උන්වහන්සේ වෙතට පැමිණියේ ය.




★ **මෙනෙහි කිරීම**

පව්කරුවන් හට දෙවියන් වහන්සේගේ කරුණාව අප්‍රමාණය. එම නිසා අප කිනම් පාපතර තත්ත්වයක සිටියත් සැබෑ සිත් හැරීමක් තුළින් උන්වහන්සේ වෙතට ළඟා විය හැකි බවත් තවද උන්වහන්සේ අප පුනරුත්ථාපනය කිරීම පිළිබඳ යෙසායා දිවැසිවරයා බලාපොරොත්තුවක් ඉදිරිපත් කරයි. ජේසුස් වහන්සේගේ දෙවන පැමිණීම අවධාරණය කරන ආගමන කාලයේ අපට ඇති අවස්ථාව ජීවිත වෙනසක් නොවේ ද?

දෙවියන් වහන්සේ අන්‍යයන් වෙත අපගේ වගකීම් ඉෂ්ට කිරීම මඟින් දැහැමි ජීවිතයක් ගත කිරීම ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීමේ දී නව ලොවක කොටස්කරුවන් වීමේ බලාපොරොත්තුව ඉටුකර ගත හැකි බව ඔබ විශ්වාස කරන්නෙහි ද?

ස්නාවක ජුවාම් තුමා ක්‍රිස්තුන් වහන්සේගේ පෙරමඟ සූදානම් කළසේම ඔබත් එතුමන් මෙන් දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය බව ඔබ පිලිගන්නෙහි ද? එය කළ හැක්කේ නිහතමානී හා සරළ ජීවිතයක් මඟින් බව ඉතා පැහැදිලිය.

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 14

# උත්පත්ති පොත



**ලෝකය**

මිනිසාට මෙන්ම සතුනටද ආහාර වශයෙන් නිල් පලා දෙනු ලැබේ. (උත්. 1/29-30). මෙයින් අදහස් කෙරෙන්නේ මැවිල්ල තුළ පවතින පූර්ණ සංහිඳියාවයි. කිසිවකු මරණයට පත් කිරීමක් නොමැත. කිසියම් හෝ ආකාරයක ප්‍රචණ්ඩකාරීත්වයක් ද නොමැත. මැවිල්ල තුළ මෙම සාමය හා සංහිඳියාව සුරැකීම මිනිසා විසින් කරනු ලැබිය යුතු වෙයි. මෙසියානික රාජ්‍යය තුළ පවතින සංහිඳියාව පිළිබඳවද මෙම අදහස දැකිය හැකි ය. යෙසායා 1146-9 'වෘකයා බැටළුවා සමඟ වාසය කරන්නේය... සිංහයා හරකා මෙන් පිදුරු කන්නේය." උත්. 1, 29-30 හි ගැටළුව මස් කෑම හෝ නොකෑම පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. දෙන පණිවුඩයක් වනුයේ මැවිල්ල තුළ සාමය, සංහිඳියාව සුරැකීම මිනිසා ඉටු කළ යුතු කාර්යයක් බවයි.

**සබත :-**

දෙවියන් වහන්සේ වෙනුවෙන් දිනයක් හෝ කාලයක් වෙන් කළ යුතුය. "ෂබටු" යන්න අසිරියානු - බැබිලෝනියානු වචනයකි. එහි අදහස වැඩ වලින් විවේක ගැනීමය. පූජක සම්ප්‍රදාය, කැප කිරීම යන අදහස මෙයට එකතු කළේය. (එම දිනය ශුද්ධවත් කිරීමයි ) යාවිස්ත, එලොයිස්ත වැනි පැරණි සම්ප්‍රදායයන් සඳහන් කරන්නේ වැඩ නවතා විවේක ගැනීම පමණකි. (නික්ම 34, 21 ජේ) නික්ම 23, 12 (ඊ)) සබත පිළිබඳ ද්විතීය නීති සම්ප්‍රදායයෙහි (ඩී) ඇත්තේ සංස්කරණයකි. (ද්විති. 5, 13-15)

## 3. මැවීම පිළිබඳ දෙවන කථා පුවත

**(උත් 2: 4 ආ - 25)**

**මූලාශ්‍ර**

පළමුවන පරිච්ජේදයෙහි දෙවියන් වහන්සේ හැඳින්වෙන්නේ එලොහිම් යන නාමයෙනි. එහෙත් දෙවන පරිච්ජේදයෙහි දෙවියන් වහන්සේගේ නාමය දෙවි සමිඳාණන් වහන්සේය. නැතහොත් යාවේ එලොහිම් ය. (යාවේ දෙවියන්වහන්සේය.) උත්තමපූජකවරයාහැරඅන්කිසිවකුවිසින් හෝයාවේයනනාමයඋච්චාරණයනොකළයුතුදෙයක්විය.නායක පූජකවරයාද එම නාමය උච්චාරණය කළේ අවුරුද්දකට එක වතාවක් පමණි. එනම් වන්දි ගෙවීමේ දිනයේ දීය. දැනුදු ඉශ්‍රායෙල් සිනගෝගවල දෙවියන් වහන්සේගේ නාමය උච්චාරණය කිරීම සිදු නොකෙරේ.

දෙවන පරිච්ජේදයෙහි දෙවියන් වහන්සේ ඉදිරිපත් කෙරෙන්නේ මානව රූපාකාරයෙන්ය. එලෙස දෙවියන් වහන්සේ පොළොවෙන් දුවිලි ගෙන ඉන් මනුෂ්‍ය රූපයක් නිර්මාණය කර එය තුළට හුස්ම හෙළන සේක. ඒ ආකාරයෙන් මෙම පරිච්ජේදය තුළ කුඹල්කරුවකු ලෙස (2,7), උයන් ගොව්වකු ලෙස (2,8), ශල්‍ය වෛද්‍යවරයකු ලෙස යනාදි වශයෙන් දෙවියන් වහන්සේ ඉදිරිපත් කෙරේ. එලෙස දෙවියන් වහන්සේ ක්‍රියාකාරී වීම පැහැදිලි කිරීම සඳහා භාවිත වන පාරිභාෂිත වචනය මානව තත්වාරෝපණය නම් වෙයි.

වෘත්තාන්ත ශෛලීය කථාන්තර ස්වරූපිය, විස්තරාත්මකය. "... පොළොවෙහි හටගත් පැළෑටියක් වත් පැලවුණු බීජයක් වත් නොවිය. එසේ වුයේ දෙවි සමිඳාණන් වහන්සේ පොළොවපිට වැස්ස නොඑවු නිසාත්, භූමිය වගා කිරීමට කිසිවෙකු නොසිටි නිසාත්ය." යන ව්‍යවහාරයෙන් අපට සිතා ගත හැකි වනුයේ එය, ජෙරුසලමට නුදුරු වියළි කෘෂිකාර්මික පරිසරයක් බවය. මේ සියල්ලෙන්ම අප යොමු කරනුයේ මෙම කථා පුවත සාමාන්‍යයෙන් 'ජේ' අකුරෙන් අඟවන යාවිස්ත සම්ප්‍රදායයේ නිමැවුවක් නැතහොත් කෘතියක් බව නිගමනය කිරීමටය.

## 1. ඓතිහාසිකත්වය

**ගැටළු**

අ. දෙවියන් වහන්සේ ඉදිරිපත් කෙරෙන්නේ මානුෂික ආකාරයෙනි.නැතහොත් ඔවුන් වහන්සේ මිනිසකු පරිදි ක්‍රියා කරන සේක.
කුඹල්කරුවකු පරිදි - මිනිසා තැනීමේදී (2, 7)
උයන් ගොව්වකු පරිදි - බිම වගා කිරීමේදි (2,8)
ශල්‍ය වෛද්‍යවරයකු පරිදි - මුල් මිනිසාගෙන් ඉල ඇටයක් ඉවත් කිරීමේදි (2, 21)
කැටයම්කරුවකු පරිදි - මිනිසාගෙන් ගත් ඉල ඇටයෙන්

ස්ත්‍රියක නිර්මාණය කිරීමේදී.
මෙය දෙවියන් වහන්සේ පිළිබඳව ඓතිහාසික ඉදිරිපත් කිරීමක් නොවේ.

**ආ. උයනෙහි පිහිටි ගංගා**

පිෂොන්, ගිහොන්, යුප්‍රටිස්, ටයිග්‍රිස් අතර අප දන්නේ යුප්‍රටිස් හා ටයිග්‍රිස් යන ගංගා දෙක පමණකි. ඒවා ගලන්නේ ඉරාකය මැදිනි. ජෙරුසලමෙහි ප්‍රධාන ගංගාව ගිහොන් වන අතර පිෂොන් කොහෙත්ම අප නොදන්නා නාමයකි. දී ඇති විස්තරයට අනුව පිෂොන් පිහිටිය යුතු වනුයේ සෞදි අරාබියේ වන නමුත් එවැනි ගංගාවක් එහි හමු නොවේ. එබැවින් සතර දිශාවෙන් ගලන ගංගා හතර පොළොවේ

සශ්‍රීකත්වය පිළිබඳ සංකේතයන්වේ. ඒ නිසා මෙම කථා පුවත මැවීම පිළිබඳ ඓතිහාසික විස්තරයක් නොවන බව කිව යුතුය.

(තවත් කොටසක් ලබන සතියේ...)

# ළමා ප්‍රදීපය ප්‍රචලිත කිරීම අප සැමගේම වගකීමකි

**කතුතුමනි,**

ඥානාර්ථ ප්‍රදීපයේ සිඟිති පුවත් පත 'ළමා ප්‍රදීපය' ආරම්භ කොට තෙවසරක් සම්පූර්ණ වූ බැව් පසුගියදා පළවිය. තවද එය සමස්ථ ආසියාවේම සිසු සිසුවියන් වෙනුවෙන් පලවන එකම ළමා පුවත් පත බැව් ඇසීමද සතුටට කරුණකි. එය ප්‍රදීප සංස්කාරක මණ්ඩලය ඇගේ අනාගතය භාරග න්නට වෙරදරන දරු දැරියන් නිසි මග ගන්නට, ඔවුනගේ දැනුම වර්ධනය කර දෙන්නට කොතරම් දුරට සිතනවද? කෙතරම් වෙහෙසක් දරනවද යන්නට කදිම නිදසුනකි. ළමා ප්‍රදීපයේ සහාය සංස්කාරක කුමර නයනජිත් මහතා පවසන අයුරු "තම පාසලේ තොරතුරු පළකරවා ගැන්මට පමණක් ළමා ප්‍රදීපය මිළදී ගන්නා පාසල්" ඇති බවත්, සමහර ඉතාම ජනප්‍රිය කතෝලික පාසල් පුවත් පතක් හෝ විකිණීමට / මිළදී ගැනීමට දායක නොවන බැව්ද කණගාටුවෙන් සඳහන් කර ඇත.

ළමා ප්‍රදීපය දැයේ දරුවන් වෙනුවෙන්ම ඔවුනගේ ස්ව නිර්මාණ, චිත්‍ර, කවි, සින්දු, ප්‍රහේලිකා, දහම් දැනුම මෙන්ම අ.පො.ස (සා./පෙළ) සහ (උ/පෙළ) සඳහා වූ ඉංග්‍රීසි පාඩම් සහිත නවාංග රැසක් සහිත දැයේ කිතුනු දරුවන් අතට තිළිණ කිරීම පිළිබඳව ළමා ප්‍රදීප කර්තෘ මණ්ඩලයට සමස්ත ජාතියේම ප්‍රණාමය පුදකළ යුතු අතර, මෙවැනි පුවත් පතක් පාසල් දරුවන් අතර ප්‍රචලිත කිරීම යනු ඔවුන්ගේ දහම් දැනුම, භාෂා දැනුම මෙන්ම ඔවුනගේ විවිධ කුසලතා ශීඝ්‍රයෙන් වර්ධනය කර ගැන්මට මහඟු පිටුවහලක් වනු නොඅනුමානය.

මේ නිසා ළමා ප්‍රදීපය දරු දැරියන් අතර ජනප්‍රිය කරවීම සැම මීසම් භාර පියවරුන්, පැවිදි සොයුරියන්, දහම් ගුරුවර ගුරුවරියන් මෙන්ම දෙමාපියන්ගේ ද පූර්ණ වගකීමකි. එම වගකීමෙන් මගහැරයන්නට බෞතිස්මය ලද කිසිදු කිතුනුවෙකුට ඉඩක් නොලැබෙනු ඇත. එමනිසා ළමයින් අතර ළමා ප්‍රදීපය ප්‍රචලිත නොවීම පිළිබඳව දරුවන් පිටම වරද පටවා වැඩිහිටියන් ලෙස අපට අත සෝදා ගත නොහැකි අතර ළමා ප්‍රදීපය දරුවන් අතර ප්‍රචලිත කිරීම පිළිබඳව ඉහත කී සියලුම කොටස් ඒකරාශී විය යුතු අතර, ළමා ප්‍රදීපයෙන් වැඩිහිටියනටද ඉගෙනගත හැකි පාඩම් එමට බැව් මාගේ පෞද්ගලික වැටහීමයි.

**එම්. ජෝ. පාරිස්**
වැලිවිට

# මහළු මිනිසාගේ කථාවෙන් ඔබ්බට........

**කතුතුමනි,**

කලකින් අසන්නට නොලැබෙන කෙටිකතාවක් බඳු මනෝරම්‍ය ලෙස චිත්‍රනය වූ අපූරු කතාවක් අතිග රු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමන් 'ඥානාර්ථ ප්‍රදීපය' දහම් මණ්ඩපය පිටුවෙන් අපට අනුශාසනා කළේය.

'අධ්‍යාත්මික වාළුකාවේ තනිනොවන්නට' යන මැයෙන් ක්‍රි.ව. 2011 නොවැම්බර් මස 13 වන ඉරිදා ඥානාර්ථ ප්‍රදීපය පත්‍රයේ 12 වන පිටුවේ එය මැනැවින් පළකර තිබුණි. එම ලිපියේ අන්තර්ගතය පුනර් ප්‍රකාශනයක් කිරීම මේ ලිපියේ අරමුණ නොවන අතර, එහි සඳහන් කරුණු කෙරේ ආපසු හැරී බැලීමට අපට ආරාධනා කරයි. එම අදහස් සැබෑවක් වන අතර එවන් දීර්ඝ ලිපියක් සැපයූ සැමට දෙවි ආසිරි පතමු. ඥානාර්ථ ප්‍රදීපය අප පත්‍රය විවිධ මාතෘකා යටතේ සැදැහැවතුන් දැනුවත් කරයි. අවදි කරයි. ඒ හුදෙක් වැරදි නිවැරදි කරනු පිණිසය. එවන් තවත් දුර්වල තැනක් පෙන්වාදීම මේ ලිපියේ අරමුණයි.

කතෝලික ජනවන්දනා මෙහෙය අතරතුර වැදගත් අවස්ථාවකි, විශ්වාසිකයන් ගේ යාච්ඤා අදාල දින කියවීම් හා ශුද්ධ වූ සභාව, අප දේශය, රටේ සාමය, අවැසිතාවන් ආදිය ගොනු කර ගනිමින් විශ්වාසිකයින් යාච්ඤා ඔප්පු කෙරේ.

මීට අමතරව විශේෂ අදහස් ද සිහිපත් කෙරේ. එය වාචික ලෙසින් හෝ ගායනය ලෙසින් ඉදිරිපත් කරන අවස්ථා ද ඇත. එහෙත් අවාසනාව නම් විශ්වාසිකයින් යාච්ඤා ගායනයෙන් ඉදිරිපත් කිරීමේදී බොහෝ ගැටළුකාරි තැන් ඉස්මතු වීමයි. සාමාන්‍යයෙන් අප අසා පුරුදු, සහභාගි වී ඇති සරළ ගායන ක්‍රම වෙනුවට විශේෂාකාරයේ දේව මෙහෙයන් වලදී යොදා ගන්නා විශ්වාසිකයින් ගේ යාච්ඤා ගායනය තුළ ඇති අන්තර්ගතය එම අවස්ථාවට කොතරම් උචිතදැයි විමසා බැලිය යුතුය. වරක් ගැයීම දෙවරක් යැදීමක් යැයි සම්මත කියමනක් ඇත.

එහෙත් ඇතැම් විශ්වාසිකයින්ගේ ගායනා යාච්ඤා තුළ ඇත්තේ එකිනෙකට පරස්පර හරසුන් යැඳුමකට නුසුදුසු අලංකාර වචන ගොඩකි. පද උච්චාරණය ද අපැහැදිළිය. බොහෝවිට තනු ජනප්‍රිය ගීතයකින් උපුටා ගැනුනකි. උදාහරණ ලෙස 'සඳපානක් සේ ඇවිදින් ගම්මානෙන් මේ නගරෙට' 'රත්තරන් දුවේ මගේ රත්තරන් දුවේ ඔබයි දිවිය අර්ථවත් කළේ' "දකුණු ලකේ අගනගරේ ගාලු පුරේ සිරි" ආදි ගී තනු දැක්විය හැකිය. එහිදී සැදැහැවතුන් ගීතය තුළ ගත කරනවා විනා විශ්වාසිකයින්ගේ යාච්ඤාවන්ට අවධානයක් නොවේ.

එවිට සභා ශ්‍රේෂ්ඨ උතුමන් ගෙන් පටන් ගෙන කුඩා දරුවා දක්වා ද ගත කරන්නේ මානසික ව්‍යාකූල භාවයෙනි. එම අවස්ථාව ඇතැම් විට යොදා ගැනෙන්නේ කෙනෙකුගේ සංගීත දක්ෂථාවයන් පෙන්වීමටය. නැත්නම් ගායන ශෛලිය හෝ රචනා ශෛලිය පෙන්වමින් තමන් ඉස්මතුවන්නටය. එහෙත් අවසානයේ සිදුවන්නේ සැදැහැවතුන් අසරණ වීමයි. විටෙක විශ්වාසිකයින් ගේ යාච්ඤා ආරම්භ වූ බවක් හෝ අවසන් වූ බවක් නොදනිති. ඊට හේතුව නම් ඉදිරිපත් කරන පුද්ගලයා තුළ ද නිසි සූදානමක් නොමැති කමයි.

මේ වරද නිවැරදි කර ගැනීම අපටත් මතු පරම්පරාවටත් යහපතකි. මේ රැල්ල කෙරේ නිසි අවධානයක් යොමු නොවුන හොත් 'කපිරිඤ්ඤා' තාලයට ද විශ්වාසිකයින්ගේ යැඳුම් වාතලයට මුසුවන්නට ඉඩ ඇත.

**මංගල ජයවර්ධන**
ගිංතොට

# අපරාධයකින් ගැලවීමක් නොමැති බව පූජාවේ දී සිහිපත් කර දෙන්න

**කතුතුමනි,**

ලෝකය දියුණුව කරා දිනෙන් දින පියවර තබා ඇත. ශ්‍රී ලංකාවේ දියුණුව, සංවර්ධනය, යුද්ධය ජය ගැනීමත් සමඟම උදා විය. අද උපදින දූ පුතුන් වාසනා මහිමය ලද්දෝ යයි අප කීවත්, වත්මන් ශ්‍රී ලංකාවේ විවිධ වූ අපරාධ හා හිංසනයන් වර්ධනයේ සීමාවන් නොමැති තරම්ය. උඩබලා කෙළ ගැසුවත්, මේ අපරාධ අතරට කිතුනුවන්ගේ දායකත්වය ද හා කිතුනු අසල්වාසීන් ද කිතුනු බව ලැබුවෝ ප්‍රමාණය ඉක්මවා ඇත. ඒ බැව් මෙතෙක් සිදුවී ඇති පීඩනයන් හිංසනයන්, අපරාධ සමීක්ෂණ වලින් හෙළිවේ, වාර්තාවේ.

ඇතැමුන් මීසම් සභාවල දායකයෝය. නැතිනම් ඒ අයගේ දූ පුතුන්ය. පූජක පැවිදිවරුන්ගේ පැවිදිවරියන්ගේ පවුල්වල සමාජික හා ඥාතින්ය. දෙව්මැඳුරුවල යම් යම් අංශයන්හි සේවය කරන්නවුන්ය. නැතිනම් බැතිමත් කිතුනු පවුල්වලනි. බොහෝ දුරට දෙව්මැඳුරක යම් යම් සේවාවන් හි යෙදෙන අය තුළින් අපරාධයන්, හිංසනයන් සිදුවීමත් අපේක්ෂා විය නොහැකි තරම්ය.

මේ කරුණු මෙසේ පැවතිය ද දිනපතා ඉරිදා දිව්‍ය පූජාවේදීත්, දහම් පාසල් පූජාවලිදීත් අපරාධ කිරීමෙන් වැලකී සිටින ලෙසත්, හිංසනයනට, අපරාධයනට සම්බන්ධ වූ කිසිම පුද්ගලයකුට කිසිදු ගැලවීමක් නොමැති බවත්, වටහා දීම අද අපේ පූජක වගකීමකි. ඉතා දිගු කථාවක් නොවී ඉතාමත් හරවත් ලෙස සංක්ෂිප්ත කොට ලොකු කුඩා සැමටම සිතට තදින්ම කාවැදී තිබීම ද මතකයන් සේ පවතින අයුරින්, අපරාධ හිංසා කරනවුන්නට කිසිදු මෙලොව තුළ කිසිදු සැඟවිල්ලක් හා ගැලවීමක් නොමැති බවත්, කිසිදු අපරාධයකින් ගැලවී සිටීමට නොහැකි, නිර්දෝෂ ලෙස නීතියට හසුනොවී සිටියත් දෙවියන් වහන්සේගේ නීතිය එය එසේ නොවන බව අවසන් හුස්ම ගෙවෙන අවසාන තත්ත්පරයක දී වුවද දරුණු ලෙස එය ගෙවා දැමීමට සිදුවන බව සැමදා දිව්‍ය පූජාවේදී කෙටි පණිවුඩයකින් හෝ පසක් කර දීමට පියවර සලසා ගන්නේ නම් අද පරපුරටම හොඳ රූපියල් සතවලට බාහිර පුහු ආටෝපවලට ලොල්වී වහල්වී බුද්ධියට නොව හැඟීම්වලට හා සුඛ විහරණයට පමණක් ඉඩදීමේ සිතිවිලි වලින් ද පළිගැනීමෙන් මිදීමට පැහැදිළිව ඔවදනක් දීමට හැකිනම් සුඛිත මුදිත යහපත් අනාගත පරපුරක් බිහිකිරීමට හැකි බැව් සැම කාන්තාවක්ම තරුණ දියණියක්ම දරුවෙක් තම සොයුරියක, මවක හෝ මෙන් ගරු කිරීමෙන් කටයුතු කළ යුතු බව ද වටහාදෙන්න. සිරිලක වෙසෙන කුමන මට්ටමේ වයසේ පසුවුවද කාන්තාව සුරැකීම දේශයේ වෙසෙන සැම අයෙකුගේම අගනා යුතුකමක් බව පහදා දිය හැකිවීම කෙතරම් අගනේද?

ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය නම් කාන්තාවන්ට කාන්තාවන්ම පීඩාකරන යුගයන් බවට පතවී ඇත. අපේ ක්ෂා නොතැබිය හැකි සර්ව සුබවාදි යයි කියන්නාවු පිරිමින් විසින් ද කතුන් දූෂණයට පීඩනයට හිංසනයට පත්කොට ඇත. ඒ සිරිලක් බිමේ අද පවතින පසුබිමක් වී ඇත.

**ටෙස්මා රෝස් ශ්‍රියන්ති**
නයිනමඩම

# තිත්ත ඇත්තෙන් පාදක වන දේ ක්‍රියාවට නැංවිය හැකිනම්!

**කතුතුමනි,**

පසුගිය වතාවක, කැමිලස්ගේ 'තිත්ත ඇත්ත' කාටුනයක, මීසමේ ගීතිකා කණ්ඩායමක් සර්පිනා මාස්ටර් එහි මුල් ඇදගෙන සිටින ආකරය අපට දක්නට ලැබුණා. ඒ වෙනුවෙන් අපි එතුමන්ට ස්තුති වන්ත වෙමු. එය එපමණක් නොව, අදටත් මීසම්වල අනිකුත් සමිති සමාගම් තුළත්, වීශේෂයෙන් මීසම් ධර්මසේවා සභාවන් තුළත් අවුරුදු විසි තිස් ගණන් හෝ ඊටත් වැඩි අය එහි තනතුරු හොබවමින්, එහි මුල් ඇදගෙන සිටින ආකාරයක් අපට පෙනෙන්නට ඇත.

මීසම් ධර්ම සේවා සභාවේ සාමාජිකත්වය, අවුරුදු 05 කට සීමාවෙතත්, දෙවන වරට ද තෝරා පත් කළ හැකිය. අඛණ්ඩවම තෙවන වරට ද පත්කළ නොහැකිය. එය එසේ තිබියදී, එවැනි නායකත්වයන් තවදුරටත් එම තනතුරුවල රැඳී සිටින්නේ, පියතුමන්ලාගේ අවශ්‍යතාවන් නිසා ද, නැතහොත්, වෙනයම් කාරනාවන් සඳහා ද නොදනී. එය කෙසේ වෙතත්, මීසමේ දියුණුවට එය බාධාවක් සේ පෙනේ. එවැනි දීර්ඝ කාලයක් එහි තනතුරුවල රැඳී සිටීමෙන්, ඔවුනට මීසමේ වර්ධනයට අළුතෙන් යමක් එක්කිරීමට තවත් ඉතිරිව නැත.

අළුත් නායකත්වයන් බිහිවීමට තිබෙන දොරටු වැසීයනු ඇත. ඔවුන් තුළ තිබූ කැපවීම, උත්සහය, සේවයට තිබෙන ලැදියාව ක්‍රම ක්‍රමයෙන් හීනවී ගොස්, සාමාන්‍ය තත්ත්වයට වැටීම වැලැක්විය නොහැක. එවැනි පරිසරයක් තුළ ඉතිරිව පවතින්නේ ඇල්මැරුණු තත්ත්වයක් හා ඒකාකාරි ස්වභාවයක් පමණි. එමගින් මීසම් ජනතාවට සිදුවන පාඩුව අති විශාලය. එය මඟහරවා ගන්ට නිසි පියවර ගත හැකි නම්!

**රිචඩ් වික්‍රමසිංහ**
බටගම

# වැරැදි මතයක් ප්‍රචලිත කිරීමක් !

**කතුතුමනි,**

දහනම වන සියවසේ දී මෙලොව ජීවත් වූ සාන්තුවරයකු වන ශුද්ධ වූ ජෝන් බොස්කො මුනිතුමන්ගේ ශුද්ධ වූ ධාතු සියැසින් දැක වන්දනා ගරු බුහුමන් දැක්වීමට සමස්ත ශ්‍රී ලංකාවාසි ජනතාවට අවස්ථාව ලැබිණ.

කිතුනුවන් අන්‍ය ආගමිකයන් ද මෙම මහඟු අවස්ථාව සඳහා සහභාගි වූ අතර ඒ නිමිත්තෙන් සමරු කාඩ් පත් ද නිකුත් කර තිබිණ. එම චිත්‍රය රැගත් කාඩ් පතේ ජේසු තුමා ශුද්ධ වූ ජෝන් බොස්කෝ මුනිතුමන්ගේ ජීවිතය බවත්, මරිය තුමිය ඔහුගේ සහකාරිය බවත්, තරුණයින් ඔහුනේ පිපාසය බවත්, කරුණාව ඔහුගේ ආදරය බවත් පළකර ඇත.

කිතුනුවන්ගේ පමණක් නොව අන්‍ය ආගමිකයන්ගේද අතට පත් කළ මෙම කාඩ් පත්‍රයේ මරියතුමී ඔහුගේ සහකාරිය වශයෙන් ප්‍රකාශකර කිරීම මවිතයට හේතුවකි. මෙය පැහැදිළිව පරිවර්තනයේ දී සිදුව ඇති අඩුපාඩුවකි.

මෙවන් පත්‍රිකා මුද්‍රණය කර නිකුත් කිරීමට පෙර අවම වශයෙන් ඒ ඒ මීසම් සේවක පියතුමන්ගේ වත් අනුමැතිය ගැනීම අනිවාර්යය විය යුතුය. මෙවන් වැරදි ක්‍රියා



මගින් මරිය මව්තුමිගේ ගෞරවයටත් නිමල නාමයටත් කැළැල් නොවීමට පියවර ගත යුතු බවද පෙන්වා දෙමි.

**ප්‍රැන්සිස් ජයසුන්දර**
ලුණුපොකුන



සමි,

ත්

නොව කිතුනු
පහර ගැසීමක්
ඩා භයානක
මෙම සිංහල
ත් රටේ
ළිබඳව ඇස්කන්
අය වෙත
එම භයානක
ත රැක ගෙන
ාවේ සේවාවක්
ලට මඩ ගැසීම
කෙන්ද කන්ද
න්නට උත්සාහ
නිසි ලෙස
වැරදි කිරීමට
ය. එබැවින්
ධාරණ ක්‍රියාව
මේ සඳහා
වා! කියා අපි
රදි කිරීමට
ඇතැයි අපි
වෙමු.

ල මණ්ඩලය

ෝ

සති

සිටින්නේ
ඳු නිවහන් ය.
ාල වියේ දැරියන්
මෙන් මතුවන
වේ ඒ දැරිය
මුළු පවුලම
ත් අසීරුතාවයකට
අසරණ වූ එවැනි
න්‍යතාවය හෙළි
නු වෙනුවට
වන්නේ මඩේ
ා වූ පිළිවෙත්
වා තලු මර
, ප්‍රේක්ෂකයන්ට
විකාරයෙන්
රන අවස්ථා
එවැන්නෝ
ටයුත්තක් වුවද
මන්ගේ මනෝ
තත්ත්වයෙනි. ඒ

ජයෙන්
න ළමා
න අපචාරයන්
ර්යේ පෙරේදා
තකින් දූ දරුවන්
දුවන අතවර
වසා ගත
බැව් ඔවුහුම
නෙක අසරණ වූ
අපයෝජනයට
ම් ය. මේ සියල්ල
ද්ධි දාමයන්
ාපිට සිද්ධවෙන,
නට ලැබෙන දැය.

ය තුළින් එබඳු
වා වාර්තා
පුවත්පත්
න් කරුණු
ක්වා යහපත්
සතුටක් ලබා
දරයි. මේ හා
තවාදීහු මඩ ගසා
හත් හැරී බලද්දී
තට ගැනීම නිසා,
තැතිව සිටින්නේ
නාව ඔවුන්ම ය.
ඩන්ම වැනසෙති.

මෙත්‍රි



# "ප්‍රේම් නිවාසයේ" දරුවන් දේශීය හෝ විදේශීය පුද්ගලයන්ට විකිණීමක් කිසිදු විටෙක සිදු නොවන බව තමන් ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරනවා

## පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් ජනරාල් සරත් අබේගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි




**මොරටුව රාවතාවත්ත ප්‍රදේශයේ පිහිටි "ප්‍රේම් නිවාසය" නමින් පවත්වාගෙන යන ළමා නිවාසය රජයේ ලියාපදිංචි ළමා නිවාසයක් වන අතර එහි දරුවන් දේශීය හෝ විදේශීය පුද්ගලයන්ට විකිණීමක් කිසිදු විටෙක සිදු නොවන බව තමන් ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරන්නේ යැයි පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් ජනරාල් සරත් අබේගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය.**

මෙම නිවාසය "මදර් තෙරේසා" ලෝක සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව බවත්, නීත්‍යානුකූල පීතෘත්වයක් නැතිව ගැබ්ගත් කාන්තාවන්ට සහ නිසි භාරකාරත්වයක් නැති දරුවන්ට මෙ මඟින් රැකවරණය සලසන බවත් සරත් අබේගුණවර්ධන මහතා පැවසීය.

ගර්භනී කාන්තාවන්ට සිය දරුවා ලැබෙන තෙක් අවශ්‍ය පහසුකම් මෙමඟින් සලසන අතර ඇය සිය දරුවා හදා වඩා ගැනීමට අකමැති නම් අදාළ දරුවා පරිවාස භාරයට ගන්නා බවත් හෙතෙම කීය. ළමා නිවාසගතව සිටින දරුවන් වෙනත් ළමා නිවාසවල මෙන්ම සාමාන්‍ය ක්‍රමවේදය යටතේ දරුවන් නොමැති දේශීය හා විදේශීය මව්පියවරුන්ට භාර දෙන බව ද හෙතෙම කීය.

දේශීය මවුපියවරුන්ට අමතරව විදේශීය මවුපියවරුන්ට ද මෙම දරුවන් හදාවඩා ගැනීම සඳහා දීමට කුලවද්දා ගැනීමේ ආඥා පනත යටතේ පරිවාස කොමසාරිස්වරයාට බලතල දී ඇති බවත් එහිදී ද දරුවන් භාරකාරත්වයට පමුණුවන්නේ දිසා අධිකරණයේ නියෝග මත බවත් සරත් අබේගුණවර්ධන මහතා පැවසීය. එහිදී අදාළ විදේශීය රටවල නීත්‍යානුකූල කටයුතු සඳහා ඔවුන්ට මුදල් වැයවෙන නමුත් ළමා නිවාසය විසින් ඔවුන්ගෙන් මුදල් අයකර නොගන්නා බවත් කොමසාරිස්වරයා අවධාරණය කළේය.

ළමයින් හදාවඩා ගැනීමට සිය භාරයට ගැනීමේ දී විදේශිකයන් විසින් ඇතැම් අවස්ථාවල යම් යම් පරිත්‍යාග කරන නමුත් මුදල් අය කර ගැනීමක් පිළිබඳ කිසිදු තොරතුරක් ලැබී නැතැයි ද හෙතෙම කීය. කෙසේ වෙතත් මෙම ක්‍රියාවලියේ දී මුදල් අයකර ගැනීමක් වන්නේ ද යන්න පිළිබඳව තවදුරටත් පරීක්ෂා කර බලන බව ද කොමසාරිස් ජනරාල් සරත් අබේගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය.

**මෙම ළමා නිවාසය පරීක්ෂා කරන අවස්ථාවේ දී දරුවන් ලබා ගැනීම සඳහා එහි පැමිණ සිටි ජර්මන් හා ඇමරිකන් ජාතික යුවළ දෙකකින් ප්‍රකාශ සටහන් කර ගත්තා. එම ප්‍රකාශ වලට අනුව දරුවන් ලබාගැනීම සඳහා ඔවුන් පරිවාස දෙපාර්තමේන්තුව හරහා නීත්‍යානුකූලව ලියකියවිලි සාදා ගෙන ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය තුළ කුල වද්දා ගැනීමේ නඩු ගොනු කර ඇත.**

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වැඩබලන ස්ථානාධිපති පොලිස් පරීක්ෂක බී. ඩබ්ලිව් බෝපිටිගොඩ මහතා 2011 නොවැම්බර් 28 දා කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ඉවෝන් ප්‍රනාන්දු මෙනෙවිය හමුවේ දී පැවසුවේය.**

# කොටහේනේ පළමු සහ දෙවැනි දෙව්මැඳුරු

**කොළඹ අගරදගුරු වසමේ ආසන දෙව්මැඳුර පිහිටා ඇති කොටහේන ඉතා රසවත් ඉතිහාසයක් ඇති ප්‍රදේශයකි. එහි ආසන දෙව්මැඳුරේ ඉතිහාසය ද එසේ ම රුචිජනක ය.**

කොළඹ නුවරක් සැටියට දියුණු වූයේ කෝට්ටේ යුගයෙන් පසුව යි. ඉන් පෙර අද කොළඹ කොටුව ලෙස හැඳින්වෙන ප්‍රදේශය සහ ඇතැම් මුහුද අද්දර ප්‍රදේශ හැර අන් පළාත් හද්ද කැලෑ පෙදෙස් ලෙස පැවැතීය. කොළඹ 7 හෙවත් කුරුඳුවත්ත කුරුඳු කැලයක් විය. මරදාන පාළු බිමක් මෙන් ම රාත්‍රි කාලයේ සොරුන් ගේ පාරාදීසයක් විය. කොටහේන - කොට්ටන් ගස් වැවුණු හේනක් වූ නිසා කොට්ටන්-හේන යනුවෙන් ප්‍රසිද්ධ විය. එය උස් කඳු ගැට්ටක් වූ අතර එය වටා වූයේ පහත් බිමෙකි. අද බ්ලූමෙන්ඩෝල් ලෙස හඳුන්වනු ලබන්නේ එය යි. එහි පොල් ගස් කිහිපයක් ද වැඩුණු බව කියැවේ.

පෘතුගීසින් ද කොට්ටන් - හේන යන නම බොහෝ දුරට රැකගෙන එය "කොටචේන" යැයි හැඳින් වූ අතර ඕලන්දයෝ එය "කොටන්චේන" ලෙස හැඳින්වූහ. එහෙත් ඉංගිරීසින්ගේ පාලනය ආරම්භ වීමත් සමඟ මෙය "කොට්ටන් චීනය" ලෙස ද, තවදුරටත් "කොට්ටන්චීන" ලෙස ද විකෘති වුණි. වාසනාවකට මෙන් ක්‍රි.ව. 1870 පමණ වන විට මේ ප්‍රදේශය යළි කොටහේන" ලෙස ම හැඳින්වීම ආරම්භ විණ.

කෙසේ හෝ කොටහේනේ මෙම කඳුකරය ආදියේ සිට ම කතෝලිකයන් වාසය කළ පෙදෙසක් බවට පත් වී තිබුණි. ඕලන්ද පීඩනය කොතරම් දරුණු වුවත් මෙහි විසූ කතෝලික පිරිස තම ආගමික විශ්වාසයවත් බිම් පෙදෙසවත් පාවා නුදුන්හ. ඕලන්ද රජය ඉදිරියේ ඔවුන් කොපමණ ශක්තිමත් වූහයි ද කිවහොත්, පීඩනය මෙල්ල කිරීමත් සමඟ ම මේ ඉඩම් ප්‍රමාණය සඳහා ඔහු ඕලන්ද රජයෙන් නීත්‍යානුකූල ඔප්පුවක් ලබා ගත්තෝ ය.



## යටගිය දවස

විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ

**90**

ක්‍රි.ව. 1779 අප්‍රේල් 21 දාතමින් වන මේ ඉඩම් ඔප්පුව අනුව අද සා. ලුසියා ආසන දෙව්මැඳුර පිහිටා ඇති බිම අයිති වන්නේ (කොළඹ) රදගුරු හිමිපාණන්ට යි. මෙම බිම් ප්‍රමාණය අක්කර 10 ක් පමණ වූ අතර දෙපසක් මායිම් වූයේ මහා මාර්ගයන් ගෙන් ය.

මේ ප්‍රදේශයේ පැරැණි ම දෙව්මැඳුර කොළඹ කොච්චිකඩේ ශු. අන්තෝනි දෙව්මැඳුර යි.

කෙසේ වෙතත් ක්‍රි.ව. 1782 දී කොටහේනේ පළමු ගලෙන් හුණෙන් සමන්විත දෙව්මැඳුර ඉදිකිරීමේ වැඩකටයුතු අරඹන ලදි. එහෙත් මෙය කොටහේනේ පළමු දෙව්මැඳුර නො වේ. ආදියේ සිට ම එහි කුඩා දෙව් මැඳුරක් පිහිටි බව වාර්තා වන්නේ ය. එය ලෑලිවලින් සාදා තිබුණ අතර පොල් අතු සෙවිලි කරන ලද්දකැයි සටහන් ය. මේ වන විට පැරැණි වී තිබුණු එම දෙව්මැඳුරු ගොඩනැගිල්ල කඩා දමා, ක්‍රි.ව. 1782 දී එම ගෙපළේ ම නව හා දෙ වැනි දෙව්මැඳුරු ගොඩනැගිල්ල ආරම්භ විය.

නව දෙව්මැඳුර ඉදිකිරීම සඳහා පුරෝගාමීව කටයුතු කළෝ ගරු කොස්මෙ ඇන්ටෝනියෝ පියතුමෝ ය. එතුමෝ එවකට දිවයිනේ සේවා කළ ඔරතෝරියාන නිකායේ ලංකා ශ්‍රේෂ්ඨාධිපති මෙන් ම දිවයිනේ සභා කටයුතු එවකට පාලනය වූ දකුණු ඉන්දියානු කොච්චින් රදගුරු වසමේ අනුනායක පියතුමෝ ද වූහ. මේ සමඟ ම පෙරමුණ ගෙන ක්‍රියා කළෝ ගරු මයිකල් පියතුමෝ ය. මෙතුමන් ගේ සම්පූර්ණ නම අපැහැදිලිය. ක්‍රි.ව. 1811 සුරලෝ සැපත් මෙතුමන් භූමදාන කැර ඇත්තේ දෙව්මැඳුර තුළම ය. දෙව්මැඳුර ඉදිකිරීම සඳහා එතුමන් දායක වූ වග එහි සඳහන් ය. මෙම දෙ වැනි දෙව්මැඳුර එකල සෑහෙන ප්‍රසිද්ධියක් දරා ඇති අතර ක්‍රි.ව. 1796 ඕලන්දයින් සහ ඉංගිරීසින් කොළඹ අවසාන සටන සඳහා කැලැණි ගං ඉවුර දෙපස රැස් වූ විට ආරක්ෂාව පැතූ සිවිල් ජනතාව දිව ගොස් ඇත්තේ කොටහේනේ මේ දෙව්මැඳුරට යි.

ක්‍රි.ව. 1779 සිට දෙව්මැඳුර වඩාත් විශාල කරන ලදි. මේ සඳහා පෙරමුණ ගත්තෝ ගරු නිකොලාඕ රොඩ්‍රිගස් පියතුමෝ ය. මේ සඳහා ඉමහත් වෙහෙසක් දැරූ එතුමා ගමින් ගමටත් ගෙදරින් ගෙදරටත් ගොස් මුදල් එකතු කළේ ය. අවසානයේ දී දෙව්මැඳුර සතු ඉඩමෙන් කුඩා කොටසක් ද විකුණන ලදැයි වාර්තා වන්නේ ය.

දෙව්මැඳුර සඳහා අවශ්‍ය වූ දැව ලබා ගැනීම් වස් පෙරමුණ ගෙන ඇත්තේ ගරු ගේබ්‍රියෙල් පචේකෝ පියතුමන් ය. ආර්නල්ඩෝ නමැති එතුමන් ගේ මිතුරකු මඟින් ගස් කැපීමේ අවසරය ලබා ගත් පියතුමන් දැවැ ගෙනැවිත් ඇත්තේ අළුත්කුරු කෝරළේ සිට යි. ගස් කැපීම සඳහා ද දැව ප්‍රවාහනය කිරීම සඳහා ද අළුත්කුරු මුදලි සහ කොටහේනේ ම කතෝලික පිරිස සහාය වූ බව වාර්තා වන්නේ ය.

මෙම දැව ප්‍රවාහනය කැර ඇත්තේ පැරැණි ඕලන්ද ඇල මාර්ගයේ ය. අප පැරැණි දෙව්මැඳුරු කිහිපයක් මෙම ඇලට හෝ හැමිල්ටන් ඇලට හෝ මුහුණ ලා ඉදිකැර ඇත්තේ ද මේවා එ කල ප්‍රධාන ප්‍රවාහන මාර්ග වූ හෙයිනි. මෙයට නිදසුන් වශයෙන් බෝපිටිය දෙව්මැඳුර සහ තලාහේනේ ශු. රෝච් මුනිඳුන්ගේ දෙව්මැඳුර දැකගත හැකි ය. ඉතා මෑතක් වනතුරු කඳාන නගරයේ සිට එහි දෙව්මැඳුර ඉදිරියෙන් ඇල දක්වා දිවෙන මහා මාර්ගය "දැව කඳන් තොටුපොළ"ට යන පාර ලෙස හැඳින්විණි. මේ මාර්ගය වන ප්‍රදේශයන්හි සිට ඇල දක්වා දැව ප්‍රවාහනය කිරීම සඳහා ඕලන්දයින් විසින් පුළුල් කරන ලදැයි වාර්තා වේ.

මේ කාලයේ දී ම හෙවත් ක්‍රි.ව. 1807 නොවැම්බර මස 17 වැනි දින, රොඩ්‍රිග ස් පියතුමන් දිවයිනේ ශ්‍රේෂ්ඨාධිපති ලෙස පත්කරන ලදි. මෙය දෙව්මැඳුරු ඉදිකිරීම් කටයුතු සඳහා ද විශාල අස්වැසිල්ලක් වූ බව රහසක් නො වේ. මෙයින් පහසුව ලැබූ රොඩ්‍රිගස් පියතුමෝ ධනවතුන් ගෙන් මුදල් ආධාර ද සෙසු පිරිස ගේ ශ්‍රම ආධාරය ද ලබා ගෙන දෙව්මැඳුරේ ගොඩනැගිලි කටයුතු නිම කොට එය දේව මෙහෙයන් පැවැත්වීම සඳහා කැප කළෝ ය.

කොටහේනේ මෙම සාන්ත ලුසියා (දෙවැනි) දෙව්මැඳුර සමස්ත ලංකා කතෝලික ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් රැසකට සම්බන්ධ වී තිබේ. (මේවා ගැන මතු ලිපියක සඳහන් කරමු.) මෙම දෙව්මැඳුර ක්‍රි.ව. 1873 අගෝස්තු මස 18 වැනි දා සිට කඩා ඉවත් කරන ලදි. අනූ වසරක් පමණ පැවැති මුල් ගොඩනැගිල්ල දිරාපත් වීම නිසාත් වහල කඩා වැටෙන තරමට ම පත් වී තිබුණ නිසාත් මෙය ඉවත් කොට නව ගොඩනැගිල්ලක් අනිවාර්යයෙන් ම ඉදිකළ යුතු විය. එය එසේ කරන ලදි.

මේ අනුව අද අප ඉදිරියේ ඉතා මහේශාක්‍ය පෙනුමෙන් යුත් සා. ලුසියා ආසන දෙව්මැඳුර එහි පිහිටා ඇති තෙ වැනි දෙව්මැඳුර යි. එහි ඉතිහාසය ද රුචිජනකයි. එය ආරම්භ වනුයේ ක්‍රි.ව. 1881 අගෝස්තු 5 වැනි දා ආසන දෙව්මැඳුරක් වශයෙන් එහි ප්‍රධාන කොටස ආසිරි ගන්වා දේව මෙහෙයයන් සඳහා විවෘත කිරීමත් සමඟ යි.

**(මෙම ලිපිය සඳහා ඩී. ජේ. බී. කුරුප්පු වියතාණන් විසින් ලියන ලද ග්‍රන්ථයෙන් ද දත්ත ලබාගත් බව කෘතඥ පූර්වකව සඳහන් කරමි.)**

# 2011 කතෝලික සාහිත්‍ය තිළිණ හා සම්මාන ලාභීහු

ජාතික කතෝලික ලේඛක හවුලේ 26 වන සංවත්සර උලෙළ හා සමගාමීව පැවැති කතෝලික සාහිත්‍ය තරගාවලියේ දී තිළිණ හා සම්මාන ලැබුවෝ මෙසේය.

**ජ්‍යෙෂ්ඨ විවෘත කෙටිකතා**
**පී. එල්. ලෙනාර්ඩ් කුරේ, එම්. ජෝ. පාරිස්, ඊ. ඩී. ශ්‍රීමාල්**

නව නිර්මාණ (පද්‍ය)
චන්ද්‍ර නිශ්ශංක හපුආරච්චි, ඩබ්ලිව්. ඒ. ඩී. මෙලිෂා ඇන්ජලා පෙරේරා, කුසුම් එපිටවල

වසරේ කිතුනු කවියා
පස්කල් ජයමාන්න,

වසරේ කිතුනු පුවත් කලාවේදිය
කැලිස්ටස් ජයමාන්න

වසරේ හොඳම පාඨක චින්තනය
ඥානාර්ථ ප්‍රදීපය, ලක්ෂාන් ප්‍රනාන්දු
වසරේ හොඳම පාඨක චින්තනය
කැතලින් මෙසෙන්ජර්
ලලිත් මෙන්ඩිස්

සභාපති ගෞරව සම්මානය
ලෙනාර්ඩ් කුරේ

වසරේ කිතුනු ඡායාරූප ශිල්පියා
(බෙනඩික් හපුආරච්චි අනුස්මරණ සම්මානය) සී. ආර්. ඩික්සන් ඇන්ටනි

ගිහි අනුශාසක මොරිස් බොල්ලෑගල සම්මානය
ආර්. ජෝශප් ප්‍රිය
කැමිලස් පබ්ලිකේෂන්ස්
කැමිලස් පෙරේරා
විශේෂ සම්මානය
(දිවියෙන් සමුගත්) ඇලෙක්සිස් ප්‍රනාන්දු

ගිහි අනුශාසක
මැක්ෂිමස් රෝයි පෙරේරා
සම්මානය
වින්ස්ටන් පෙරේරා

ලිව්සුරු සම්මානය
බැසිල් ෆොන්සේකා

කිවිසුරු සම්මානය
ලිලී ඇග්නස් සියඹලාපිටිය

කලාසූරු සම්මානය
මර්සි එදිරිසිංහ

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**


ලිව්සුරු සම්මානය - බැසිල් ෆොන්සේකා


කිවිසුරු සම්මානය - ලිලී ඇග්නස් සියඹලාපිටිය


කලාසූරු සම්මානය - මර්සි එදිරිසිංහ



*කතෝලික සභාවේ සිග්නිස් උත්තමාචාර උලෙළට මේ වසරේ ප්‍රථමවරට ඇතුළත්කර තිබූ කෙටි චිත්‍රපට අංශයෙන් කැපුන්ගොඩ මීසමේ තරුණ කලාකරුවකුවන සුහද ජයමාන්න අගය කරනු ලැබීය. 2007 වසරේ කැපුන්ගොඩ මීසම විසින් ඉදිරිපත් කරනු ලැබූ "වැළපෙනු නොව ගැලවෙනු පිණිස" පාස්කු දැක්ම සජීවීකරණය කරමින් දෙබස් හා පසුබිම් ශබ්ද මෙහෙයවූ සුහද ජයමාන්න ඉදිරිපත් කළ "ජේසුස් නම් ඔහු* HE WHO CALLED JESUS" *වශයෙන් නම්කර තිබූ ඔහුගේ කුළුදුල් කෙටි චිත්‍රපටය මෙසේ සිග්නිස් කුසලතා සම්මානයෙන් අගය කරනු ලැබීය.*

**බෙන්ජමින් කිරිහෙට්ටි**

## නව ග්‍රන්ථයක් එළිදකී

දේශීය සිනමාවේ මුල් යුගයට දායක වූ අය අතුරින් නිෂ්පාදකයන්, අධ්‍යක්ෂවරුන්, සංගීතඥයන් කීපදෙනෙකු පිළිබඳව සටහන් මෙහි ඇත. චිත්‍රපට ගැන හදාරන දැනටමත් විශ්ව විද්‍යාලයන්හි සිනමාව ජන සන්නිවේදන අංශයන්හි සාකච්ඡාවට භාජන වන හෙයින් ඒ සඳහා උනන්දුවක් දක්වන සිසු පරපුර සිනමාවේ ඉතිහාසය හාර අවුස්සා බැලීම සඳහා අවශ්‍ය කරනු ලබන ආරාධනයකි.

සුනිල් ලීනස්ගේ අළුත්ම සිනමා ග්‍රන්ථය සිංහල චිත්‍රපට සහ මුල්යුගයේ පුරෝගාමියෝ දෙසැම්බර් 08 බ්‍රහස්පතින්දා සවස 3.30 ට කොළඹ 7, නිදහස් මාවතේ, ජාතික පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවනාගාරයේ දී එළිදකී. ප්‍රධාන දේශනය සිනමාව පිළිබඳව කථිකාචාර්ය සිනමා විචාරක නුවන් නයනජිත් කුමාර මහතා පවත්වන අතර තවත් විද්වතුන් රැසක් සහභාගි වේ.

## පිය පුතු දෙපළගෙන් සාමකුමරු ගී තැටියක්




වේග රිද්ම ජනප්‍රිය ගුවන් විදුලි ගායක සුනිල් කළුබෝවිල තම පුතු නායකකන්ද දෙව්මැදුරේ කන්තාරු කණ්ඩායමේ සමාජික රුවන් කළුබෝවිල සමඟ එක්ව ලඟ එන නත්තල් උත්සවය සඳහා නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාගේ මඟපෙන්වීම යටතේ 'සාම කුමරු' මැයෙන් සී. ඩී. තැටියක් දෙසැම්බර් මස 01 දින දොරට වැඩීමට සියලු කටයුතු සූදානම් කර තිබේ.

මේ සී. ඩී. තැටිය අමුතු ආරක් ගන්නා අතර එය වේග රිද්ම හා සරළ ගී සංකලනයකි. මෙවැනි ගී තැටියක් කළ එළි බසින ප්‍රථම අවස්ථාව මෙය බැව් පැවසේ. සියලු ගීත සංකල්ප හා ගායක දෙපල රචනාකර තිබීම විශේෂ සිද්ධියකි.

**ජූලියන් ගුණවර්ධන**

## දීදුලන කිතුනු තරු

### ඇලෝයි කහඳවිට



සම්පූර්ණ නම - ඇලෝයි කහඳවිට ගමගේ
ලිපිනය - 10ඒ, ඇන්ටන් සුබුද්ධි මාවත, පල්ලියවත්ත පටුමග, වැලිවේරිය
උපන් දිනය - 1945 - නොවැම්බර් - 07 දින
දුරකථනය - 0718178563

කවියටත්, කෙටිකථාවටත්, ශාස්ත්‍රිය නිර්මාණකරණයටත්, ඡායාරූපකරණයටත් වෙසෙස් ඇල්මක් දක්වමින් දක්ෂතා දක්වන ඇලෝයි කහඳවිට මහතා දේශිය සංස්කෘතික උරුමයන් හා කිතුනු සාහිත ඓතිහාසික තොරතුරු කෙරේ විශේෂ අවධානයක් යොමුකරන, වසර ගණණාවක් තුළ තම නිර්මාණකරණයෙන් කිතුනු ලෝකය බැබැලවූ දීප්තිමත් ප්‍රවීන ලේඛකයෙකි. සැබවින්ම ඔහුගේ විශේෂත්වයක් වන කවිය තුළ දක්වන ප්‍රතිභාව නිසාම ඔහුගේ කවි ලෝකයේ නොමැකෙන සටහන් තැබීමට සමත්ව ඇත.

පුංචි සංදියේ ඇලෝයි පාසල් ගියෙ මුලින්ම වත්තල සා. අන්තෝනි විදුහලටය. එම පාසල් මුල් අකුරු ඉගෙන ගත් ඔහු 1962 දි අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයත් 1965 දී අ.පො.ස (උසස් පෙළ) විභාගයද සමත්විය. පසුව ඔහු බොරැල්ල සා. ඇලෝසියස් පූජක හලටත්, ගම්පහ මහ විද්‍යාලයටත්, ගම්පහ බණ්ඩාරවත් විද්‍යාවංශ පිරිවෙනටත් ඇතුලත්ව උසස් අධ්‍යාපනය ලැබීය. 1961-1964 වසර වල පාසලේ දී ජවන හා පිටිය මලල ක්‍රීඩාවල දී මිටර් 100, 200, 400 තරගවල දි ප්‍රථම, දෙවැනි, ස්ථාන දිනා ඇත. එලෙසම ප්‍රාදේශීය සාහිත්‍ය තරගාවලි වලදි කාව්‍ය, කෙටිකථා තරගවලින් ප්‍රථම ස්ථාන 9 වතාක්ම දිනාගන්නට සමත් වී ඇත.

1962 ඔක්තෝබර් 28 දා, ලේඛන ලෝකයට අවතීර්ණවූ ඇලෝයි ප්‍රදීපය, ජනතා, යොවුන් ජනතා, දවස, සවස, ශ්‍රී, රසවාහිනි, නවයුගය තුළින් තමා ජාතික ලේඛකයකු වශයෙන් දස්කම්පාන බව පෙන්නුම් කළේය. මෑත කාලයේ ඔහුගේ ප්‍රවීන ලේඛක අත්දැකීම් මත ඥානාර්ථ ප්‍රදීපය, දිවයින හා ලංකාදීප පුවත් වලට නිර්මාණ සපයයි.

තම ග්‍රාමයේ සමාජ සේවා කටයුතු සඳහා පූර්ණ කැපවීමෙන් කටයුතු කරන ඇලෝයි කහඳවිට ගමේ විසෙන්ති පාවුලා සමිතියේ ලේකම් ලෙස ද මහළු නිවාසයේ සංවිධායක ලෙස ද ප්‍රජා සමිතියේ උපලේකම් ලෙස ද ක්‍රියාකර ඇත. දැනුදු සමාජ සේවා කටයුතු වල නියැලෙන ඔහු ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය, ජාතික කතෝලික ලේඛක හවුල, සියනෑ කවි සංවිධානය, ගම්පහ ලේඛක හවුල සංවිධාන වල විවිධ තනතුරු දරමින් ස්වෙච්ඡා සේවයේ නියැලී සිටියි.

ජාතික කතෝලික ලේඛක හවුල මගින් පැවැත්වූ සාහිත්‍ය තරගවලදි 2003 - 2004 - 2005 වසර වලදි කෙටිකතා වලින් තරග 4 ක හා දීපව්‍යාප්ත කෙටිකථා 5 කින්ද ප්‍රථම ස්ථාන තරග ජය ලබා ගැනීමට සමත් වී ඇත. 2004 දී කිතුනු කවියා සම්මානය ඇතුළු සම්මාන රැසක් ජාතික කතෝලික ලේඛක හවුලෙන් දිනාගත් අතර, 2008 වසරේ දිනාගනු ලැබීය.

ලේඛන කලාවට මෙන්ම ගොක්කලාවට විශේෂ දක්ෂතාවක් දක්වන ඇලෝයි නිදහස් ලේඛකයකු ලෙස අද කරනා මෙහෙයද අගේය. ඥානාර්ථ ප්‍රදීපය විශේෂාංග ලිපි ලියා සේයාරූ සැපයීමෙන්ද අගනා මෙහෙයක් කිතුනු ලේඛක ලෝකයට සිදුකරයි. 1972 වසරේදී ග්‍රන්ථකරණයට පිවිස ඔහු 'කඳුලින් උපන් මිනිස්සු' නම් කෙටිකථා සංග්‍රහයත්, 2005 වසරේදී 'ප්‍රාග් පෘතුග්‍රීසි හෙළ කිතුනු උරුමය' ග්‍රන්ථයද ලිවේය.

ලේඛන කලාවට අතදුන් අය අතර, විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්වත්, පූජ්‍ය අමිතිරිගල ඥානවංශ හිමිපාණන්වත්, මහාචාරිති වේ. වි. අභයගුණවර්ධන හා නිව්ටන් ගුණසේකර මහතුන් ආදරයෙන් සමරයි.

පවුලේ එකම දියණියකගේද සෙනෙහස, ආදරය, සතුට ලබමින් යහපත් දිවියක් ගෙවන ඇලෝයි මහතාගේ 'පන්හිඳේ' විර්යය තුළ අප කිතුනු ලේඛක ලෝකය තව තවත් බබලවන්නට හැකිවේවා!

**මැක්ෂිමස් රෝයි පෙරේරා**

## පිලීෂන් අබයකෝන්ගේ සුබස 190

### භක්ති ප්‍රබෝධනය

1899 දී ආරම්භ වූ භක්ති ප්‍රබෝධනය සඟරාවේ නාමයේ 'බො' අකුරට හල්කිරීම නැත්තේ ඇයි?

සංස්කෘත හෝඩියේ ඒ හා ඕ දීර්ඝස්වර මිස සිංහලේ මෙන් ලඝු එ හා ඔ ස්වර නැත. 1950 ගණන් වනතුරු සිංහල ලේඛනයේ දීර්ඝ ඒ හා ඕ ස්වර සහිත සකු වදන් සඳහා හල්කිරීම නොයෙදීම සම්ප්‍රදාය විය. එහෙත් ඒ ස්වර දෙක දීර්ඝ කොට උච්චාරණය විය. කිතුනු වහරේ ඇති නෙෂ්ටුර දමිළ ශබ්දකෝෂවල ඇත්තේ නිෂ්ටුර ලෙසය. රොමේශ් නම් ප්‍රකට පුද්ගල නාමය ශබ්දය අනුව සකු වදනක් විය නොහැකිය. රෝමේශ් කීවිට අර්ථය විකාරයකි. රෝෂන්, රෝහන්, මෝහන් ලංකාවේ වරදවා ශබ්ද වේ. එහි ස්ත්‍රීවාචී රෝෂිණී, රෝහිණී, මෝහිනී නිවැරදිය.

කාව්‍යශේඛර, ශ්‍රේෂ්ඨ, ම්ලේච්ඡ, ස්වේච්ඡා, ලෝකෝපකාරය, යථෝක්ත, සමෝච්ච ඇදලා කිවයුතුය. කිතුනු වහරේ නිතර හමුවන පාපෝච්චාරණය. මාංසෝත්ථානය, ශුද්ධෝත්තම ඇදලා කීම නම් බොහෝවිට නොඇසේ. අංක, රංග, චංචල, රංජන ආදිය සංස්කෘත භාෂාව අනුව නොලීමද දමිළ බසේ නම් එසේ නොවේ. විකාර විධියකට ලිවූ ද්වීප, බුද්ධ, සමර්ථ, සූර්ය ආදිය මාතෘ භාෂාව අනුව දැන් හරිහැටි ලියැවේ. අවබෝධ, ප්‍රබෝධ විනා දැන් වහරේ ප්‍රබෝධනය නැත. ප්‍රබෝධනීය විටක හමුවේ. ප්‍රබෝධ කරනවා/ වෙනවා හා අවබෝධ කරනවා/ වෙනවා වියත්වහරයි. ප්‍රබෝධයෙන් මල් පිපීමත්, නින්දෙන් නැගිටීමත්, උද්යෝගයත් ගම්‍ය වේ. බුධ, බෝධි, බුද්ධ, බුද්ධි, ප්‍රබුද්ධ, ප්‍රබෝධිත එකම ක්‍රියා ධාතුවකින් නිපැදේ.

පැරණිතම පවුත්පත වන ඥානාර්ථ ප්‍රදීපයේත්, පැරණිතම සඟරාව වන භක්ති ප්‍රබෝධනයේත් නාමවල අක්ෂර වින්‍යාසය ඒවාවල පැරණිකමට දෙස් දෙයි. යමක සුල මුල හා වතගොත සෙවීමේ දී වචන භාවිතය හා විලාසය නියතයෙන් වැදගත්ය. ගණ දෙවි හැල්ලේ පරාල නම් එක ප්‍රතිකාල් වචනයම ඒ කවි පොත පෘතුගීසි යුගයේ හෝ ඉන්පසු සම්පාදිත බවට සාධකයක් විය. සමහර ගීතිකාවල ඇති 'ඇප්' යන පරණ පියකරු වදන විකෘත නොවිය යුතුය. ලංකා අප ස්වාමිදුව නාමයේ ශ්‍රී නොමැතිවීම ඒ නාමේ ඉතිහාසය වෙත අප යොමුකරයි.

152



ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු

පව් දාහක් කරපු එකා සුද්දවන්න    වෙලා
අනික් උන්ට කඬේ යනව බලූ කුක්කන්    වෙලා
සිල් බිඳගෙන හොර රහසින් යළුත් බලේ    බලා
එන උන් යට කරපල්ලා පස් ගොඩකින්    වසා

බලයට කෑදර උනාම නෑ හිරිකිත    හිතේ
බොරු වීරයො වෙනව පොඩි උන් ලඟ    ඉදිරියේ
එන්දෙ දි බලූ වැඩ කර කර ගිය හැටි හරි    අගේ
දැන් සිල් අරගත් උන් බොරු උපාසකයො    වගේ

ගායනය : (කළුවා) මෝදර කලුපහන

## පමුණුගම ඉතිහාසය

**සංස්කාරක - ජෝ ජයමාන්න**




පමුණුගම මෙරට කතෝලික වංශ කතාවේ අසිරිමත් උරුමයන්ගෙන් හැඩවූ කතෝලික ග්‍රාමයකි. ඒ අනුව පමුණුගම ඉතිහාසය අළලා ග්‍රන්ථයක් සම්පාදනය වීම මේ කිතුනු උරුමයේ අසිරිය ලොවට කියාපෑමේ අනගි අවස්ථාවකි.

පමුණුගම ඉතිහාසය, පැරැණි මීසම, මුල් පදිංචි කරුවන්ගේ පටන් වත්මන් යුගය දක්වා තොරතුරු ඒකරාශි කිරීමත්, ඒවා නිසි පරිදි ගොනුකරමින් සකස් කිරීමත් ලේසි පහසු කර්තව්‍යයක් නොවේ. ඒ අසීරු කටයුත්ත අපූරුවට සකසා පාඨකයාට කිසිදු වෙහෙසක් නැතිව කියවාගෙන යෑමට හැකිවනසේ ග්‍රන්ථය සම්පාදනය කර තිබේ. ජෝ. ජයමාන්නට ප්‍රදීපයෙන් සුපැතුම්!

**මෛත්‍රී**

බැසිල් ෆොන්සේකා විසිනි

# ජංගම දුරකථනයෙන් 'ජේසුස් ක්‍රිස්තුස්' වදන තහනම්




"ජේසුස් ක්‍රිස්තුස්" යන වදන ජංගම දුරකතන ඔස්සේ පාවිච්චි කිරීම තහනම් බවට පකිස්තානයේ ජනසංනිවේදන අධ්‍යක්ෂ විසින් නියෝගයක් පනවා ඇති බැව් "වතිකාන ඉන්සයිඩර්" ප්‍රවෘත්ති සේවය වාර්තා කරයි.

ඉස්ලාම් දහමට එරෙහි දූෂිත වදන් වශයෙන් දක්වා ඇති වදන් 1600 ක සංඛ්‍යාවට "ජේසුස් ක්‍රිස්තුස්" යන අමරණීය නාමය ද ඇතුළත් කොට ඇත. ඒ අනුව "ජේසුස් ක්‍රිස්තුස්" යන වදන් ජංගම දුර කතනයන් තුළින් සඳහන් නොකළ යුතු බවට නියෝගයක් නිකුත් කරත. දෙසතියක් තුළදී එම නියෝගය ක්‍රියාත්මක කළ යුතු යයි ද ජනසංනිවේදන අධ්‍යක්ෂ විසින් නියෝග කර තිබේ.

මෙම අත්භූත නියෝගය ගැන පකිස්තානයේ කතෝලික ජන සංනිවේදන කොමිෂන් සභාවේ මහ ලේකම් ජෝන් ෂකීර් නදීම් පියතුමා මෙලෙස පවසයි. "වසර 2000 කට වැඩි කළක් සැමදා ලෝ දනා තුළ සදා ජීවත්වන "ජේසුස් ක්‍රිස්තුස්" යන වදන් දූෂිත වදන් ලෙසින් නම් කළ හැක්කේ කාට ද? එම වදන් ජංගම දුර කතනයෙන් හෝ අන් අන්දමකින් හෝ භාවිතා කිරීම තහනම් යයි පැවැසීම ලෝක ජනතාවගේ අයිතියක් පැහැර ගැනීමක් ද වෙයි. එමෙන්ම එවැනි තහනමක් කිරීමෙන් පකිස්ථානයේ ව්‍යවස්ථාව කඩ කරමින් කිතුනුවන්ගේ මිනිස් අයිතිවාසිකම් ද බිඳදැමීමක් වේ. එබැවින් අප රජයෙන් ඉල්ලා සිටිනවා මේ දුර්දාන්ත තීරණය වහා ඉවත් කරනා ලෙසට "මිනිස් අයිතිවාසිකම් සුරැකීමේ සංවිධානයන් විසින් ද එකහෙළා ප්‍රකාශ කර ඇත්තේ, රජය විසින් "ජේසුස් ක්‍රිස්තුස්" යන වදන් තහනම වහා ඉවත් කළ යුතු බවය. නොඑසේ නම් තමන් දේශිය හා විදේශිය නීති සරණ සොයනා බවය. විරෝධතා රැල්ල නිසා පකිස්තාන රජය විසින් එම තීරණය ඉවත් කැරෙනු ඇතැයි අපේක්ෂිතය.

## කයිරෝවේ කිතුනුවන්ගේ විරෝධතා පා ගමනට ප්‍රහාර



නොවැම්බර් මස 17 වැනිදා ඊජිප්තුවේ කයිරෝ නගරයේ දී විරෝධතා පා ගමනක කිතුනුවෝ යෙදුණෝය. එසේ කළේ ඊට කලින් හමුදා භටයන් විසින් කොප්ටිස් කිතුනුවන්ට පහර දීමේ දී මරණයට පත් කිතුනුවන් 25 ක පමණ පිරිස වෙත සාධාරණය ලබා ගැනීම සඳහාය.

එහෙත් සාධාරණය ඉල්ලා සාමකාමි පා ගමනේ යෙදුනු කිතුනුවන්ට යළි පහර දුන් බව ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් වාර්තා කරත. පහරදීමෙන් යළිත් කිතුනුවන් 25 කට වැඩි සංඛ්‍යාවක් මාරාන්තික තුවාල ලබා ඇත. මෙම පහරදීමට ලඟදී පැවැත්වීමට නියමිත මැතිවරණයේ දී තරග වදින මුස්ලිම් දේශපාලඥයකු ද නායකත්වය ලබා දී ඇතැයි ද වාර්තා වේ. ඊජිප්තු අර්බුදයෙන් හොස්නි මුබාරක් ජනාධිපති වරයා බලයෙන් පහ කිරීමෙන් පසුව කිතුනුවන්ට එල්ල වූ පහර දීම් කීපයක්ම විය. ඔක්තෝබර් මාසයේ දී හමුදා භටයන් විසින් දේවස්ථානයට පහරදීම හේතුවෙන් ඔක්තෝබර් මස 09 වැනිදා විරෝධාත පා ගමනක් පැවැත්විණි. එහිදී හමුදා භටයන් ඔවුන්ට පහරදීමේ දී විශාල පිරිසක් මරණයට පත් වී බොහෝදෙනා දරුණු තුවාල ලදහ. මෙම හිංසාකාරී තත්ත්වය හමුවේ ඊජිප්තුවේ කිතුනුවෝ බියෙන් හා සැකෙන් පසුවෙති. ඊජිප්තුවේ ජනගහනය මිලියන 80 ක් වන අතර ඉන් 80% ක් ඉස්ලාම් බැතිමත්තු වෙති. කිතුනුවෝ 10% ක් පමණ වෙති.

## සිරගත කිතුනුවන්ට අගති සැළකිලි

පකිස්ථානයේ සිරගතව සිටිනා කිතුනුවන්ට සිර ගෙවල් පාලකයන් ගෙන් ලැබෙන්නේ කුඩම්මාගේ සැළැකිලියයි මොෂාම් ඉස්ලාම් බාති නම් කතෝලික නීතිඥවරයා කතෝලික මාධ්‍යයට පවසයි.

ආහාර පානාදිය ද ඇඳුම් පැළැඳුම් ද බෙහෙත් වර්ග ද ලබාදීමේ දී කිතුනු සිරකරුවන්ට අඩුවෙන් ලබාදෙන බැව් ද ඔහු පවසයි. තව ද සිය කිතුනු පැවැත්මට අනුව ආගමික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අවස්ථාව නොලැබෙන බැව් ද වාර්තා වේ. බොහෝ කිතුනු සිරකරුවන් දිළිඳු කමින් පෙළෙනා බැවින් නීතිඥ සහය ලබා ගැනීමට බැරි තත්ත්වයන් ඇත. ඒ පිළිබඳව කිතුනු ජනතාවගේ අවධාරණය යොමු විය යුතු බැව් ද ඉස්ලාම් බාති නීතිඥවරයා දක්වා සිටී. "දිළිඳු කිතුනුවන් මෙන්ම අනෙක් සිරකරුවන් විශාල සංඛ්‍යාවක් දඩ මුදල් ගෙවීමට බැරිකම නිසා දිගින් දිගට සිරගතවී සිටිනවා.

ඒ අයගේ අසරණ තත්ත්වය ගැන ද අවධානය යොමු කළ යුතුව තිබෙනවා." එළෙස ප්‍රකාශ කරන්නේ බාති නීතිඥවරයා සමඟ සිරකරු සේවාවේ යෙදී සිටිනා ඉෆව් කාර් මුන් නැමැති දොමිනිකාන නිකායික පූජක තුමාය. ප්‍රකාශිත සංඛ්‍යා ලේඛන අනුව ෆයිසල්බාද් කතෝලික පදවියේ පමණක් සිරකරුවෝ 5000 ක් පමණ වෙති. ඉන් සියයකට වැඩි සංඛ්‍යාවක් කිතුනුවෝය. කුරානයේ පිටු ගිණි බත් කළේය යන බොරු චෝදනාව යටතේ දිවි ඇති තාක් සිරබත් කන කතෝලික ඉම්රාම් මෂීෂ් නම් ව්‍යාපාරිකයා ද ඒ අතරේ වෙයි.

ඔහුට මහත් හිරිහැර විඳින්නට සිදු වූවත් තවමත් ඇඳැහිල්ලේ රැඳී සිටී. "මා අධ්‍යාපනය ලැබුවේ එංගලන්තයේය. එරටේ මුදල් හම්බ කළ හැකි රැකියාවක් කළ හැකි වූවත්, මා යළි පකිස්ථානයට පැමිණියේ විශේෂයෙන් අවැසි කිතුනුවන්ට සේවය කිරීමටයි. කිතුනුවන් නිරන්තරයෙන් පීඩාවට පත් කැරෙන වාතාවරණයක් තුළ ඔවුන්ට සේවය කිරීමට ලැබීම ගැන මා දෙවිඳුන් පසසනවා." මෙළෙසින් සාක්ෂි දරන්නේ, මෂීෂ් බාති නීතිඥවරයාය. ඔහුගේ සාක්ෂිය සියලු වෘත්තිය වේදීන් වෙත යොමු කරන්නක් යයි කිතුනු පුවත් වාර්තා කරයි.

## වතිකානයේ අයර්ලන්ත තානාපති කාර්යාලය වැසේ

ශුද්ධාසනයේ පවත්වා ගෙන ගිය අයර්ලන්ත තානාපති කාර්යාලය 2012 ජනවාරි මාසයේ සිට වැසෙන බැව් අයර්ලන්ත විදේශ ඇමැති ඊමොන් ගිල්මෝර් නොවැම්බර් මස 02 දා විදෙස් මාධ්‍යයට පැවැසුවේය. තව ද ඉරානයේ හා නැගෙනහිර තිමෝරයේ තානාපති කාර්යාලය ද වසා දමන බැව් ඔහු විසින් ප්‍රකාශ කොට ඇත.

ද්විපාර්ෂික තානාපති සබඳතා ඔස්සේ ක්‍රියාත්මක වන මූල්‍ය දායකත්වය පදනම් කොට ගෙන එම තීරණය ගත් බැව් අයර්ලන්තය ප්‍රකාශ කරයි. මේ වසරේ මුල් භාගයේදී ළමා අපචාරයන් පිළිබඳව ශුද්ධාසනය හා ඇතිවූ තර්ක විතර්ක මෙම තීරණයට කිසිඳු ආකාරයකින් බලපා නැතැයි ද වාර්තා වේ. උදාවී ඇති තත්ත්වය කෙරෙහි අයර්ලන්තයේ කාදිනල් සීන් බ්‍රැඩි හිමිපාණන් මෙලෙස පවසයි. "ජාත්‍යන්තර සම්බන්ධතා සම්බන්ධයෙන් ශුද්ධාසනය විසින් ගන්නා ක්‍රියාමාර්ගයන් ගැන අයර්ලන්තය විසින් කිසිදු තැකීමක් කර නොමැත. ශතවර්ෂ ගණනාවක් තුළ අයර්ලන්ත ජනතාව හා ශුද්ධාසනය අතර පවත්නා ගෞරාන්විත සම්බන්ධතාවය සැලකිල්ලට ගෙන එලෙස නොකළ යුතුව තිබුණා. එබැවින් අයර්ලන්ත රජයේ නිගමනය කෙරෙහි අපේ ඇඩි ශෝකය ප්‍රකාශ කරනවා." අයර්ලන්ත රජය විසින් ප්‍රතිචාර දක්වා ඇත්තේ, ශුද්ධාසනයේ අයර්ලන්ත කාර්යාලය වසා දමනු ලැබුවත් දෙරටේ සම්බන්ධතාවන් පත්කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිළධාරියකු විසින් පවත්වාගෙන යනු ලබන බවයි.

## දිව්‍ය යාගයේ දී කඩා වැද නිගරු කරයි

වියට්නාමයේ හැනෝ හි දෙව් මැඳුරක් තුළ පූජකවරයා දිව්‍ය යාගය සිදු කරමින් සිටිනවා. දිව්‍ය යාගයට සහභාගි වෙමින් සිටියේ දිව්‍ය සත්ප්‍රසාද සංගමයේ පාසල් දරුවන්ය. එවෙලේ එහි කඩා වැඳුණු නිල ඇඳුමෙන් සැරැසී සිටි එක් පොලිස් නිළධාරියෙකු දිව්‍ය යාගය කඩාකප්පල් කරමින් පූජකවරයාට පරුෂ වචනයෙන් පරිභව කරමින් යාගය නවතාලුයේය.

බියට පත් දරුවන් තව තවත් සන්තාපයට පත්වීම වළකා ලමින් ඔහු දෙස නිහඬව බලා උන්නා පමණි. තවත් භට පිරිසක් විසින් දේවස්ථානය වටකොට ඇති බැව් දක්නට ලැබිණි. එවිට අවට ජීවත් වන ගිහියෝ එතැනට රැස්ව පූජක තුමාට හා දරුවන්ට රැකවල් සළසමින් පොලිස් නිළධාරියට දේවස්ථානයේ පිටතට යන ලෙස ඉල්ලා සිටියෝය. ඔවුන් ඉවසිළිවන්තව කටයුතු කිරීම නිසා ගැටුමක් ඇති නොවීය. මෑත කාලයක සිට ප්‍රදේශයේ බලධාරීන් අදාල දෙව් මැඳුර සම්බන්ධයෙන් පූජක තුමා හා සැදැහැවතුන් සමඟ ගැටුමක නිරතව සිටී. ප්‍රදේශයේ පාලකයෝ දෙව් මැඳුර සතු කුඩා භූමි භාගය බලයෙන් අත්පත් කර ගැන්මේ ක්‍රියාවලියක නිරතව සිටිති. අපද්‍රව්‍ය පවිත්‍ර කිරීමේ පිරිපහදුවක් තැනීම සඳහා එම කුඩා භූමි භාගය අත්පත්කර ගැනීමට උත්සාහ දරන්නේ වෙනත් තැනක් නොමැති නිසා නොවේ. එලෙස පිරිපහදුවක් ගොඩ නැගුණහොත් දෙව් මැඳුර පවත්වා ගෙන යාම කළ නොහැකි වනු ඇත.

## නොවැම්බර් 21 දා ලෝක ධීවර දිනය සමරයි



ලෝකයේ විසිරී සිටින ධීවරයෝ වර්ෂයක් පාසා නොවැම්බර් මස 21 දා සිය දිනය වශයෙන් පවත්වති. එම දිනයේදී ධීවර ජනතාව ද විවිධ ධීවර සමිති සමාගම් ද එක්ව ධීවරයන් අත් විඳිනා අභියෝගාත්මක ජීවිත පැවැත්ම ලොවට හඬගා කියති. ධීවර රැකියාව තුළින් තම අඹු දරුවන් නඩත්තු කරන්නාවූ දහස් සංඛ්‍යාත ධීවර ජනතාවක් ලෝ පුරා විසිරී සිටිති.

එක්සත් ජාතීන්ගේ සංඛ්‍යා ලේඛන අනුව මිලියන 15 වැඩි ධීවරයෝ සංඛ්‍යාවක් දිවි රැකුම සඳහා මහ මුහුදේ ධීවර යාත්‍රා තුළ වෙහෙසෙති. ඔවුන්ගෙන් විශාල සංඛ්‍යාවක් නොදියුණු රටවල් වල ජීවත් වන ධීවරයෝ වෙති. කුඩා බෝට්ටු වලින් දෛනිකව ජීවිතය ගැට ගසා ගැනීමට යත්න දරනා ඔවුහු කවදා දුගී බවින් මිදිය හැකිදැයි සිහින දකිති.

ආරක්ෂා විරහිත කුඩා බෝට්ටු තුළ දින ගණනාවක් ගෙවමින් රැකියාවේ යෙදී සිටිනා ඔවුන්ගේ ජීවිත නිරන්තරයෙන් අවදානමේ පවතී. ධීවර රැකියාව ලෝකය තුළ අතිශය අවදානම් රැකියාවක් බවද ප්‍රකාශ වේ. මේ කරුණු කාරණා ධීවර දිනය තුළදී යළිත් ලෝකයට මතක් කර දෙනු ලබන්නේ, ශුද්ධාසනයේ සංක්‍රමිකයන් පිළිබඳ සංසදය මඟින් පාලනය වන "සාගරික අපෝස්තලික සේවාව" යන සංවිධානයන් විසිනි. ධීවර දිනය වෙනුවෙන් එම සංවිධානය මෙලෙස ඉල්ලා සිටී.

සියලු ජාත්‍යන්තර සංවිධානයන් හා ඒ ඒ රටවල් විසින් ධීවරයන් හා ඔවුන්ගේ පවුල් හා දරුවන් දුප්පත් කමින් මුදවා ගැනීමේ ක්‍රියාමාර්ගයන් ගත යුතුයි. එක්සත් ජාතීන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති අංක 108 දරණ ධීවර ප්‍රඥප්තිය සියලු රටවල් විසින් පිළිගෙන ක්‍රියාත්මක කළ යුතු වෙයි. ජනතාවට ආහාර සපයන ධීවර පවුල් වල සුබ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීම කිතුනු ජනතාවගේද විශේෂ කාර්යයක් වෙති.

## එක් දිනකදී 34000ක් අලුතින් බෞතිස්ම ලබති

ලෝකය පුරා සියක් කෝටි දසලක්ෂ එකසිය හැටක් කතෝලික සංඝයේ සාමාජිකයෝ වෙති. එම සංඛ්‍යාවට දිනපතා තවත් 34000 ක සංඛ්‍යාවක් ලෝකයේ විවිධ රටවල් වලින් එක්වෙති. එහෙත් ලෝක ජනතාවගෙන් බිලියන දෙකක සංඛ්‍යාවක් වෙත දේව පණිවුඩය ළඟා වී නොමැත. එමෙන්ම තවත් බිලියන දෙකකට වැඩි ජනතාවක් විසින් දේව වචනය අසා දැන ඇතත්, බෞතිස්මය ලබා නොමැත.

මෙම සංඛ්‍යා ලේඛන හෙළි දක්වා ඇත්තේ 2011 වර්ෂයේ කැරුණු විශ්ලේෂණයක් මගිනි. කතෝලික සභාවෙන් බැහැරව පවත්නා කිතුනු සභාවන්ගේ සංඛ්‍යාව 42000 ක් බව ද වාර්තා වේ. මේ වසරේ ලෝකය පුරා ජනතාව වෙත බෙදා හරින ලද බයිබල් සංඛ්‍යාව මිලියන 71 කි. වර්ෂයක් පාසා මිලියන පහක් පමණ දහම් සේවක සේවිකාවන් තමන්ගේ රටවල්වලින් බැහැරව ගොස් ධර්මය පතුරුවාලන බැව් ද දැක්වේ.

## සංවාද මණ්ඩපය

# අපරාධ මර්දනය ද? අපරාධ වර්ධනය ද?

ඩී. ඇන්ටනි වික්‍රමසිංහ විසිනි

***"ඉන්දියන් සාගරයේ මුතු ඇටය", "පෙරදිග ධාන්‍යා ගාරය" සහ "දහම් දිවයින" අප ආදරණීය මව්බිම වන ශ්‍රී ලංකාව කලින් හැඳින් වූ ප්‍රශංසනීය මෙන්ම ගෞරවාන්විත විරුදාවලීන් අතර වේ. මේවායින් ශ්‍රී ලාංකික ජනතාවගේ සංස්කෘතියත්, සමාජ ජීවිතයත් මනාව පිළිබිඹු විය.***

සිංහල රජ දවස සමස්ත ජනතාවම එකම අණසකට අවනත වූ අතර ඊට අකීකරුවීමක් හෝ පිටුපෑමක් කිසිවිටෙකත් සිදු නොවුණි. එසේ වුණි නම් අද මෙන් මාස ගණන්, අවුරුදු ගනන් නඩු ඇසීමක් සිදුනොවූ අතර දඬුවම රාජ සභාව රැස්වී එක් දිනකින් හෝ දෙදිනකින් ක්‍රියාත්මක විය. එය දංගෙ ඩියට හිස තබා ගහලයා විසින් හිස ගසා දැමීම හෝ අලියකු විසින් පාගවා මරා දැමීම හෝ පුවක් ගස් දෙකක බැඳ පසුව එම ගස් දෙක මුදා හැරීම මගින් බදින ලද අපරාධකරුවා දෙකට ඉරී යාමට සැලැස්වීම ආදිය විය. දඬුවම ක්‍රියාත්මක කරනුයේ ප්‍රසිද්ධියේ මහජනයා ඉදිරිපිට වූ අතර අපරාධකරු මිය යන විට බලා සිටින්නන් හට ද එය ඉතා බලවත් කම්පනයක් ඇතිකරනු ලැබීය. අපරාධ ගණයට ගැනෙන ක්‍රියාවලට සම්බන්ධ වීමට තබා ඒ ගැන සිතීමටවත් පොදු ජනයා එකල බිය විය. ඒ හේතුවෙන් රජතුමාගේ මුළු බල ප්‍රදේශය තුළ පොදු ජන විනය ඉතා ඉහළින් ක්‍රියාත්මක විය. විනය නීති උල්ලංඝනය කළ හොත් රාජ උදහසින් ලැබෙන දඬුවම සෑම අයෙක්ම හොඳින් දැන සිටි හෙයිනි.



අද දක්වා මැද පෙරදිග රටවල ක්‍රියාත්මක වන්නේ ද රාජ නීතියට සමාන නීතියකි. එම නිසා එහි සොරකම් මැරකම් මිනිමැරුම් අසන්නට ලැබෙනුයේ ඉතා කලාතුරකිනි. සොරකමක් අසුවුවහොත් පැය ගණනක් ඇතුළත අත කපා දමා හෝ ඊට දඬුවම් ලැබේ.

ඒ අනුව සළකා බැලීමේ දී ලොව ශ්‍රේෂ්ඨ ආගම් හතරකින් දිනපතා පෝෂණය කෙරුණත් අද අප දහම් දිවයිනේ තත්ත්වය අතිශයින් කණගාටුදායක ය. පහළ උසාවි වලින් දඬුවම් දෙනු ලබන වැරදි පිළිබඳව වූ නඩුවලින් ඒවා පිරී ඇති අතර ඒවායින් දෙනු ලබන දඬුවම් අභියාචනා වලට යටත් ව එලෙසින්ම ක්‍රියාත්මක වේ. එම උසාවි වලට ජනතාවගේ ගෞරවාන්විත බිය පෙන්නුම් කරනුයේ ඒ නිසා ය.

පළමු පෙළ අපරාධ ගණයට ගැනෙන අපරාධ නඩු විභාග කරනුයේ මහාධිකරණය විසිනි. සුදුසු ලෙස සමහර දඬුවම් අභියාචනා අධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ යොමු කිරීමෙන් පසු මෙවැනි අපරාධවලට දෙනු ලබනුයේ මරණීය දණ්ඩනය ය. මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර හා මංකොල්ල කෑම් ආදිය මෙවැනි අපරාධ ගණයට ගැනේ.

අද මිනිමැරුම්, සමූහ මිනිමැරුම්, ස්ත්‍රී දූෂණ අසන්නට නොලැබෙන එකදු දවසක් හෝ නැත. ඒවා කෙතරම් බහුල වී ඇත් ද යත් අද එවැනි පුවත් වලට ජන තා අවධානය පවා එතරම් යොමු නොවේ. ඒ ඒවා එතරම් ම සුලභ නිසා ය.

පහළ උසාවි මගින් නියම කරනු ලබන විශාල දඩ මුදල් අවුරුදු ගණන් සඳහා වූ බරපතල වැඩ ඇතිව හෝ නැතිව සිර දඬුවම් කණට ඇසෙන විට දඬුවම් ලබන අපරාධකරුවන් තැති ගනී. ඒ එම දඬුවම් විඳීමේ දී ඇතිවන ගැහැට නිසා ය. මා මෑතක දී පුවත් පතක දුටු ලෙස, මරණ දඬුවමට නියම වූ එක් අපරාධ කරුවකු දඬුවම ඇසෙන විට සිනහවෙමින් සිට ඇත. ඇත්ත වශයෙන්ම එසේ වීම ගැන කිසිවෙක් පුදුම විය යුතු නැත. මක්නිසාද යත් ක්‍රියාත්මක කරනු නොලබන හෝ නැතිනම් ක්‍රියාත්මක කළ නොහැකි හෝ මොන මට්ටමේ දඬුවමක් වුවත් දඬුවම් ලබන්නා තුළ කිසිම චකිතයක් ඇති නොකරයි. මන්දයත් නියත වශයෙන් ම එම දඬුවමින් සිදුවනුයේ මහජන වියදමින් අවශ්‍ය ප්‍රමාණයට පමණක් ආහාර ලැබී "ආණ්ඩුවේ බෝඩිමේ" කල්ගෙවීම පමණක් හෙයිනි. බරපතල වැඩ ඇතිව වසර ගණන් සිරදඬුවම් ලබන සිරකරුවන්ගේ දඬුවම් තරම් මරණ දඬුවම අපහසු නැති හෙයිනි.

"ලොව ශ්‍රේෂ්ඨ ආගම් හතරකින් දිනපතා පෝෂණය කෙරුණත් අද අප දහම් දිවයිනේ තත්ත්වය අතිශයින් කණගාටුදායක ය.අද මිනිමැරුම්, සමූහ මිනිමැරුම්, ස්ත්‍රී දූෂණ අසන්නට නොලැබෙන එකදු දවසක් හෝ නැත. ඒවා කෙතරම් බහුල වී ඇත් ද යත් අද එවැනි පුවත් වලට ජන තා අවධානය පවා එතරම් යොමු නොවේ. ඒ ඒවා එතරම් ම සුලභ නිසා ය."

අද දිනපතා වැඩිවන මිනීමැරුම් වැනි අපරාධ මර්ධනය කිරීමට අවශ්‍ය නම් නීතිඥ සංවිධාන, ආගමික සංවිධාන සහ සමාජ සංවිධාන එකා මෙන් නැගී සිට කිසිදු සැකයකින් තොරව තහවුරු වූ මිනීමැරුම් සඳහා දෙනු ලබන මරණීය දණ්ඩනය වහාම ක්‍රියාත්මක කරන ලෙස අදාළ බලධාරීන්ට බලකර සිටිය යුතුය. මොන තරම් දහමින් පෝෂණය කළත් මෙසේ අපරාධ වැඩිවුවහොත් කලින් ලබා තිබූ "දහම් දිවයින" වැනි විරුදාවලිය ලොප් වී "මිනිමරු දූපත" හෝ අපරාධ දිවයින" යන අදහම් විරුදාවලි ශ්‍රී ලංකාවට ලැබීමට බොහෝ දුරට ඉඩකඩ ඇත.

මේ නයින් බලන කළ ජනතාව දහමින් පෝෂණය කිරීමට සහ විනයෙන් සන්නද්ධ කිරීමට කුමන පියවර ගෙන ඇතත්, අවසානයේ දී සිදුවී ඇත්තේ අපරාධ මර්ධනයක් නොව අපරාධ වර්ධනයක් පමණක් බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

# කිතු දහම පීඩිතයාගේ දහමයි

කිතුනුවන් ලෙස කිතු දහමේ විමුක්ති හරය විමර්ශනය කිරීමේ දී ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත දැක්ම සහ උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය හා ඒ තුළ දෙවියන් වහන්සේගේ මැදිහත්වීම තේරුම් ගැනීම ඉතා වැදගත් වනු ඇත.

ගාබ්‍රියෙල් නම් දේව දූතයා ක්‍රිස්තුන් වහන්සේගේ මව වීම සඳහා මරිය තුමියව දෙවියන් වහන්සේ විසින් තෝරා ගත් බව දැනුම් දීමේ දී ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව දෙවියන් වහන්සේගේ පොරොන්දු පහක් දැනුම් දුන්නේ ය.

1. උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක.
2. පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණන් වන සේක.
3. ක්‍රිස්තුන් වහන්සේට දාවිත්ගේ සිංහාසනය පිරිනමන සේක.
4. උන්වහන්සේ සදහටම රජකම් කරන සේක.
5. උන්වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ ය. (බලන්න ලූක් 1:32-33)

කිසිදාක අවසන් නොවන රාජ්‍යයක ශ්‍රේෂ්ඨත්වයට පත්වෙන රජෙක් ඉපදෙන්නේ කොහේ ද? වංශවත් ධනවත් පවුලක ද, නායක පූජකයකුගේ විනයධරයකුගේ, ප්‍රජා මූලිකයකුගේ පවුලක විල්ලු ද පලස්මත ද?

දෙවිපියා ඒ සඳහ තෝරා ගන්නේ දුප්පත් වඩුවකු වන ජුසේ තුමාගේ පවුලයි. ඉපදෙන්නේ වඩු මඩුවකයි. වැඩෙන්නේ ජුසේ තුමාගේ දුප්පත් පවුල තුළයි. පැරණි ගිවිසුම තුළ දෙවිපියාගේ මැදිහත්වීම සිදුවන්නේත් මේ ආකාරයටම යි. පාරාවෝ රජ යටතේ දුක් විඳපු වහලුන් පිරිසක් වහල් බවින් මුදවා ගැනීම සඳහා තෝරා ගන්නවා. ඒ සඳහා නායකත්වය දීමට තෝරා ගන්නේත් වහලෙක්වමයි. ඒ මෝසෙස් තුමාවයි.

ජේසු සමිඳුන් මෙලොවට වැඩියේ ඇයි ද යන්නත් දෙවියන් වහන්සේගේ කැමැත්ත කුමක් ද යන්නත් උන්වහන්සේ දැන සිටියා. දින හතළිහක් සාගින්නේ පාලුකරයේ සිටිමින් සාතන්ට දෙවි පියාගේ කැමැත්ත පහදා දෙනවා. "නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේට නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න කියා ලියා ඇතැයි වදාළ සේක." (ලූක් 4:8) නැවත උන්වහන්සේ ගලීලයේ දී ද තමන්ගේ දූත මෙහෙවර ලෙස ප්‍රකාශ කළේ ද දෙවියන් වහන්සේගේ කැමැත්තයි. "ස්වාමින් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසා ද දිළිඳුන් හට සුභාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද, අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්ටත්, පීඩිත වූවන් මුදන්ටත්, ස්වාමින් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්ටනත් මා එවා වදාළ සේක." (ලූක් 4:18-19).

ජේසු සමිඳුන්ගේ දූත මෙහෙවර පීඩිත වූවන් සඳහා වූ දූත මෙහෙවරක් වුණා. එම දූත මෙහෙවර ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රාවකයින් ලෙස ජේසු සමිඳුන් තෝරා ගත්තේත් පීඩිත, දුප්පත් ශ්‍රාවකයින් පිරිසක් මිස උගත්, ධනවත් පිරිසක් නොවෙයි. ධීවරයින්, අයකැමියන් වැනි පිරිසක් තෝරා ගන්නවා.

"බිය නොවන්න. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇතැයි වදාළ සේක. ඔවුහු තමන්ගේ ඔරු වෙරළට ඇද දමා, ඒ සියල්ල හැර දමා උන්වහන්සේ අනුව ගියහ." (ලූක් 5:10-11).

ඉන්පසු ජේසු සමිඳුන් දූත මෙහෙවර ඉදිරියට ගෙන ගියා. කානාන් නුවර මඟුල් ගෙදර දී වතුර වයින් බවට පත් කළා. ගලීලයේ දී අශුද්ධාත්මයක් ආවේශ වූවකු සුව කළා. ලාදුරු රෝගියාට සුවය දුන්නා, වැන්දඹුවගේ මළ පුත්‍රයාට පණ දුන්නා. මහලේ රෝගයෙන් පීඩා විඳි ස්ත්‍රියට සුවය දුන්නා. ජෙරිකෝ නුවර අන්ධ මිනිසාට පෙනීම ලබා දුන්නා. මී මැස්මොර රෝගී දරුවා සුව කළා. දහ අට වසරක් කුදුව සිටි ස්ත්‍රිය සුව කළා. දිය උදර රෝගියාට සුවය දුන්නා. මේ ආකාරයට දහස් සංඛ්‍යාත රෝගීන් සුව කළා. අසරණයින්, දිළින්දන්, පීඩිත වූවන් ඇතුලු මහජනකායක් උන්වහන්සේ පසුපස ආවා. මෙන්න ජේසු සමිඳුන් පීඩිත වූවන් පෙළන ජුදා නීති හා සම්ප්‍රදායන් පිළිබඳව ද ප්‍රශ්න කරන්නට පටන් ගන්නවා. උන්වහන්සේ ඔවුන්ට කතා කොට "සබත පිහිටුවන ලද්දේ මිනිසා උදෙසා ය. මිනිසා සබත උදෙසා නොවේ." (මාක් 2:27-28)

මිනිසුන්ට වඩා නීති හා සම්ප්‍රදායන් වලට මුල් තැන දුන් පූජකයින්ට, විනයධරයන්ට ජේසු සමිඳුන්ගේ ඒ වචන අකුල් පහරක් වැදුණා. නමුත් පීඩිතයින්ට සැනසිල්ලක් වුණා. "ඔබ අත කිසි පවක් නැති තැනැත්තා පළමු කොට ඇට ගලක් ගසත්වා" යි වදාරා නැවතත් සිය ඇඟිල්ලෙන් බිම ලියූ සේක. ඔවුන් ඒ වචන ඇසූ විට වැඩිහිටියන්ගෙන් පටන් ගෙන එකෙකා බැගින් යන්නට ගියේ ය. (ජොහාන් 8:7-9). ජේසු සමිඳුන්ගේ මේ වචන නිසා පව්කාරයන්ට ගල් ගසා මැරීමේ නීතිය අභියෝගයට ලක් වුණා. එපමණක් ද? එම නීතිය ක්‍රියාත්මක කරන්නන් ද අභියෝගයට ලක් වුණා. නමුත් පව්කාරයින්ට සැනසීමක් ගෙන දුන්නා. මනස්ථාප වන පව්කාරයන්ට සැනසීම ලැබුණා. ඔවුන් ජේසු සමිඳුන්ට ආදරය කරන්න වුණා. "ඔබ අතර යමෙක් නායකයා වන්නට කැමැත්තේ නම් ඔබේ සේවකයා වන්නේ ය. ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්නට කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේ ය." (මතෙව් 20:26-27).

මෙන්න ජේසු සමිඳුන් සේවක බවේ නායකත්වයක් ගැන, දාස බවේ මූලිකයෙක් ගැන කථා කරනවා. ලෝකයට පළමු වරට ඉදිරිපත් වූ අලුත් අදහසක් වුණා. පීඩිත වූවන්ට නැවුම් බලාපොරොත්තු ඇති කරන අදහසක් වුණා. නමුත් පීඩිත වූවන් සැමදා තම අණසකට යට වී සිටිනු දුටු ආණ්ඩුකාරවරුන්ට, නායක පූජකයින්ට, ප්‍රජා මූලිකයන්ට මෙය ප්‍රතිගාමි අදහසක් වුණා. මාගේ ගෘහය සියලු ජාතීන්ට යාච්ඤාවේ ගෘහය කැ යි කියනු ලබන බව ලියා නැද්ද? ඔබ එය හොරුන්ගේ ගුහාවක් කර ඇතැයි වදාළ සේක. ඒ අසා නායක පූජකයෝ ද විනයධරයෝ ද උන්වහන්සේ නසා දැමීමට මඟක් සෙවූහ." (මාක් 11:16-18). නායක පූජකයෝ සහ විනයධරයෝ දේව මාලිගාව මුදල් උපයන තැනක් කරගෙන තිබුණ. වෙළෙඳපලක් බවට පත් කරගෙන තිබුණා. ලන්සු තබන වෙළඳපලක් බවට පත් කරගෙන තිබුණා. ජේසු සමිඳුන් එයට විරුද්ධ වුණා. ඒ නිසා ඔවුන් එතුමන්ව මරා දමන්න මඟක් හෙව්වා.

මේ දේව මාළිගාව කඩා දමා තෙදිනකින් මම එය ගොඩ නගන්නෙමි"යි වදාළ සේක. (ජුවාම් 2:19). හතළිස් හය වසක් තිස්සේ ගොඩනැගූ දේව මාලිගාව කඩා දමා, තුන් දිනකින් යළි ගොඩනඟන බව ජේසු සමිඳුන් පවසනවා. මිනිස්සු පුදුම වුණා. නායක පූජකයින්, විනයධරයන් තවත් කුපිත වුණා. ජේසු සමිඳුන් මරා දැමීමට ප්‍රධාන සාක්ෂිය ලෙස එය යොදා ගත්තා. "දේව මාලිගාව කඩා දමා තුන් දිනකින් ගොඩනඟන්න මට පුළුවන් කියා මොහු කීවේය. එවිට උත්තම පූජකයා නැගිට ඔබ කිසි උත්තරයක් දෙන්නේ නැත් ද? මොවුන් ඔබට විරුද්ධව ගෙනෙන මේ සාක්ෂිය කුමක්දැයි උන්වහන්සේගෙන් ඇසීය." (මතෙව් 26:61-62). පිලාත් ඉදිරියේ ජේසු සමිඳුන් එතුමන්ගේ රාජ්‍යය පිළිබඳව විවරණයක යෙදෙනවා.

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති නැත. මාගේ රාජ්‍යය මේ ලෝකයට අයිති වූවක් නම් ජුදෙව්වන් අතට භාර නොදෙන පිණිස මාගේ සේවකයන් සටන් කරනු ඇත. (ජුවාම් 18:36).

ජේසු සමිඳුන්ගේ රාජ්‍යය මොලොව ලෞකික රාජ්‍යයක් නොවන බව පෙන්වා දෙනවා. මෙන්න නායක පූජකයෝ ද විනයධරයෝ ද ප්‍රජා මූලිකයෝ ද එක්ව ජේසු සමිඳුන් මරා දමනවා. එහෙත් ශුද්ධ ලියැවිල්ලේ සඳහන් පරිදි තුන් දිනකින් උන්වහන්සේ උත්ථාන වෙනවා.

උන්වහන්සේ මරණින් නැගිටවනු ලැබූ පසු ශ්‍රාවකයෝ උන්වහන්සේ මේ දේ කී බව සිහිකොට ශුද්ධ ලියවිල්ල ද උන්වහන්සේගේ වචනය ද විශ්වාස කළහ. (ජුවාම් 2:21-22)

මෙන්න ජේසු සමිඳුන් මිනිසුන්ගේ ද ශ්‍රාවකයන්ගේ ද ඇදහිල්ල හා විශ්වාසය තුළ සදාතනිකත්වයට පත් වෙනවා. අලුත් දේව මාළිගාව ගොඩනැඟෙනවා. ඔබ දෙවියන් වහන්සේගේ මන්දිරය බවත් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් ඔබ තුළ වැඩ වසන බවත් නොදන්නහු ද? කිසිවෙකු දේව මන්දිරය වැනසුවොත්, දෙවියන් වහන්සේ ඒ තැනැත්තා වනසන සේක. දෙවියන් වහන්සේගේ මන්දිරය විශුද්ධය. ඒ මන්දිරය නම් ඔබය. (1 කොරින්ති 3:16-17). දෙවියන් වහන්සේගේ මන්දිරය අපය. උන්වහන්සේ අපව ආරක්ෂා කරන්නේ ය. ඒ ඇදහිල්ල තුළ පීඩිත වූ අප ජීවත් විය යුතුය.

නමුත් අප ඉදිරියේ අලුත් කතිකාවකට මුල පුරණ ගැටළුවක් තිබේ. ජීවිතය උදෙසා නූතන කතෝලික සභාවේ කාර්යභාරය කුමක් ද?

**ග්‍රේෂන් ගොඩ්ප්‍රි විජේරත්න**
**උස්වැටකෙයියාව**

# මිශ්‍ර විවාහයෙන් බොඳවන කිතුනු ඇදහිල්ල



“ කිතු දහම විශ්වාසයේ දහමකි. ජීවන මාර්ගයකි. අඛණ්ඩව ගලා යන දිය පාරක්සේ දෙවිඳුන් හා බැඳුණු ජීවිතයකි. එහෙත් අප හා මිශ්‍රවන අන්‍යාගමිකයන්ගේ ආගමික පැවතුම්, පිළිවෙත් මතිමතාන්තර අපගේ විශ්වාසයන්ට හා ඇදහිල්ලට ඉඳුරාම වෙනස්ය. යහපත් ජීවිතයක් සඳහා අපට මෙන්ම ඔවුන්ටද පිළිපැදිය යුතු ශීල ධර්මයන් ඇත. වත් පිළිවෙත් ඇත. යහපත් සිතුවිලි වඩන ක්‍රම වේදයන් ඇත. භාවනා ක්‍රමද ඇත. කෙසේ වුවද ඒවා කිතුනු ඇදහිල්ලට හා විශ්වාසයට සමාන කළ නොහැක. මිශ්‍ර විවාහයකදී තරුණයා අන්‍යාගමිකයෙකු වූ විට කිතුනු තරුණියගේ ආගම කෙරෙහි ඇතිවන බලපෑම් අනන්තය. ”

**විවාහය ශුද්ධ වූ සංස්ථාවකි. එය දෙවියන් වහන්සේ විසින් ලොව ආරම්භයේ දී ම ස්ථාපිත කළ සේක. මැවුම්කාර දෙවිඳුන් අති පරිශුද්ධව ස්ථාපිත කරන ලද විවාහ ජීවිතයන් ද පරිශුද්ධ විය යුතුය. දෙවියන් වහන්සේ ආදම් මවා ඔහුගේ ඉල ඇටයෙන් ඒව නිර්මාණය කරන ලද්දේ, පිරිමියක හා ගැහැණියක ලෙස දෙදෙනෙක් වු ව ද විවාහයේදි ඔවුහු එක්කෙනෙක්ම වන බැවිනි.**

වර්තමානයේ තරුණ දු පුතුන් සිටින කතෝලික / ක්‍රිස්තියානි පවුල් මුහුණදෙන අර්බුදකාරි ප්‍රශ්නයක් වන්නේ ඔවුන්ගේ විවාහයන් සඳහා සුදුසු සහකරුවකු සොයාගන්නේ කෙසේද යන ප්‍රශ්නයයි. එය කිතුනු අප මුහුණ දෙන සංකීර්ණ ප්‍රශ්නයකි. කතෝලික තරුණයෙකුට තරුණියකුත්, තරුණියකට, තරුණයෙකුත් සොයාගැනීම අද සමාජය තුළ බරපතල ප්‍රශ්නයක්ව ඇත. ඔවුන්ගේ සම වයස, උගත්කම, හැදියාව, රැකියාව, පවුල් තත්ත්වය, ආගමික නැඹුරුව හා ආගම මේ හැම කරුණක්ම විවාහය සඳහා අත්‍යාවශ්‍යය නොවුවත්, ඔවුනොවුන්ගේ ආගම දහම පිළිබඳ කිසියම් සැලකිල්ලක් කළ යුතුව ඇත. එය දෙදෙනාගේ පවුල් ජීවිතයට මෙන්ම මතු උපදින දරුවා කෙරෙහිද බලපාන්නක් බැවිනි. සමහර විට එම දරුවා හෝ දරුවන් කතෝලික හෝ ක්‍රිස්තියානි වන්නට පුළුවන. නැතිනම් තම පියාගේ හෝ මවගේ ආගම (අන්‍යාගම) වැලඳගන්නට ඉඩ ඇත. එසේ වූ විට කිතුනු අපගේ ඇදහිල්ල හා විශ්වාසය බිඳ වැටී අප මංමුලාවූවන් බවට පත්වනු ඇත. මිශ්‍ර විවාහය තුළ එසේ වූ අය කොතෙකුත් දැකිය හැක.

තරුණයකු හෝ තරුණියක ප්‍රේම සම්බන්ධතාවයකට යොමු වීමේ දී ජාතිය, ආගම, කුලය පිළිබඳ විශේෂිත සැලකිල්ලක් නොදක්වයි. දුටු පමණින් තම සිත්ගත් තරුණයාට හෝ තරුණියට ආදරය කිරීමට තුරුණු විය ඔවුන් පොළඹවනු ලබයි. එය ඔවුන්ගේ වරදක් ද නොවේ. ලාංකීය සමාජය තුළ බහුතර ආගමිකයන් වූ බොදුනුවන් ජනගහණයෙන් 76% පමණකි. කතෝලික ක්‍රිස්තියානි අප 7% පමණ ප්‍රමාණයකි. අප ජීවත්වන පරිසරය තුළ, නිවසේ ආශ්‍රිතව. වැඩපල, කාර්යාල තුළ, දුම්රිය, බස්රිය තුළ ඔවුන්ගේ ඇසුර, ගති පැවතුම්, සංස්කෘතිය, කථා බහ, ආගමික පැවතුම් මේ හැම අංශයක්ම අප නෙත ගැටෙනු පමණක් නොව ඔවුන් හා මිශ්‍රවීමට ද අපට සිදුවෙයි. සමහර විට අන්‍යාගමිකයන්ගේ මිත්‍යා මතවලට පවා කිතුනුවන් ඇබ්බැහි වී සිටිනු දැකිය හැක. මෙවන් මිශ්‍ර විවාහයන් තුළ සිටින පියා සහ මව ආගම් දෙකකවීම පවුලේ දරුවන් ද නන්නත්තාර කරවන්නකි. දෙදෙනාගේම ආගම්වලට ගරු කිරීම යහපත් ක්‍රියාවකි.

එහෙත් ඔවුන්ගේ ආගමික පැවතුම් පිළිගැනීම හා පිළිපැදීම, අනුබලදීම වැනි දේ තුළින් අපගේ ඇදහිල්ල හා විශ්වාසය බොඳවීමට හෝ පලුදුවීමට බොහෝ ඉඩකඩ ඇත. දෙදෙනාගේ ආගම, දහම ගැන අවබෝධයක්, දැනීමක්, ඉගෙනීමක් කිරීමේද වරදක් නැත. මිශ්‍ර විවාහය තුළ එය ඔවුන්ට අත්‍යාවශ්‍යය සාධකයක් වනු ඇත.

කිතු දහම විශ්වාසයේ දහමකි. ජීවන මාර්ගයකි. අඛණ්ඩව ගලා යන දිය පාරක්සේ දෙවිඳුන් හා බැඳුණු ජීවිතයකි. එහෙත් අප හා මිශ්‍රවන අන්‍යාගමිකයන්ගේ ආගමික පැවතුම්, පිළිවෙත් මතිමතාන්තර අපගේ විශ්වාසයන්ට හා ඇදහිල්ලට ඉඳුරාම වෙනස්ය. යහපත් ජීවිතයක් සඳහා අපට මෙන්ම ඔවුන්ටද පිළිපැදිය යුතු ශීල ධර්මයන් ඇත. වත් පිළිවෙත් ඇත. යහපත් සිතුවිලි වඩන ක්‍රම වේදයන් ඇත. භාවනා ක්‍රමද ඇත. කෙසේ වුවද ඒවා කිතුනු ඇදහිල්ලට හා විශ්වාසයට සමාන කළ නොහැක. මිශ්‍ර විවාහයකදි තරුණයා අන්‍යාගමිකයෙකු වූ විට කිතුනු තරුණියගේ ආගම කෙරෙහි ඇතිවන බලපෑම් අනන්තය. අන්තවාදි පවුල් පරිසරයක් තුළ තරුණයාගේ පමණක් නොව තරුණයාගේ පවුලේ අයගේ බලපෑමද තරුණිය වෙත එල්ලවීම වැලක්විය නොහැක. එහෙත් තරුණයා කිතුනුවකු වී, තරුණිය අන්‍යාගමිකයෙකු වු විට ඇයට එම ආගම ඇදහීමේ නිදහස ඔහු දානය කරනු ලබයි. සමහර විට කාලය ඉකුත් වෙද්දි විශ්වාසයේ හා ඇදහිල්ලේ බීජය ඇය සිත තුළ රෝපණය වෙද්දි කිතු දහම වැලඳගැනීමේ ඉඩ කඩ සහ පැහැදීම ඇය සතුවනු ඇත. තරුණිය අන්‍යාගමිකයෙකු වු විට තරුණයා කිතුනුවකු වුවත් තම විශ්වාසය හා ඇදහිල්ල අත්හැර තරුණියගේ ආගම වැළඳ ගන්නා අවස්ථාද දැක ඇත. කෙසේ වුවද අන්තවාදි අදහස් දරන අන්‍යාගමිකයන් නම් විවාහකරගත් තරුණියට පමණක් නොව දරුවෙකුටවත් කිතු දහම කෙරේ ලැදියාවක් ඇතිවන්නට ඉඩක් නොදෙනු ඇත. තමන් කැමති ආගමක් ඇදහීමේ නිදහස මානව අයිතියක් වුවද, විවාහයේදි එය නොසලකා හරින්න තරම් මෙම අන්තවාදි අන්‍යාගමිකයන් සාහසික වී ඇත.

මිශ්‍ර විවාහයන් තුළ වුව ද එකිනෙකා වෙනුවෙන් කරනු ලබන ආදරය, පරිත්‍යාගය, කැපවීම, වැයවීම, පූජාවීම අගය කළ යුතුය. පැසසිය යුතුය. එමෙන්ම අපගේ දහම, විශ්වාසය ඇදහිල්ල ආරක්ෂා කර ගැනීමට අප එඩිතර විය යුතුය. ප්‍රේමය, බැඳීම වර්ධනය වෙද්දි මේ පිළිබඳව සාකච්ඡාවකට යොමුවීමට ද මතක තබාගත යුතුය. ආගම දහම කෙරේද, ඔවුන්නොවුන් සාකච්ඡා කර නම්‍යශිලි ප්‍රතිපත්තියකට පිවිසිය යුතුවන්නේ එය පවුල් ජීවිතයට බලපාන ප්‍රශ්නයක් වන බැවිනි. දරුවකු ඉපදුන විට එය අලුයට ගිනි පුපුරක් සේ මතුවිය හැක. එය පවුලේ අර්බුදයක් නොවන්නට නම් කල්තියා සැලසුමක් තිබිය යුතුය. අපගේ කිතුනු දෙමාපියන්ද මේ පිළිබඳව සැලකිලිමත් විය යුතුය. තම පුතාට හෝ දුවට අන්‍යාගමික සහකරුවකු සොයන්නේ නම් ඔවුන්ගේ පාර්ශවයන් හා සාකච්ඡා කර දරුවාගේ ආගම ඇදහීමේ අයිතියවත් රැකදෙන ලෙස ඉල්ලා සිටිය යුතුය. උපදින දරුවන් කෙරෙහිද නම්‍යශිලි ප්‍රතිපත්තියක පිහිටා කටයුතු කිරීමට අදාල පිරිස් වගබලා ගත යුතුය.

මිශ්‍ර විවාහයන් සිදුවු ඇතැම් නිවෙස්වල ක්‍රිස්තු ප්‍රතිමාව ඉදිරියෙන්, බුද්ධ ප්‍රතිමාව ඉදිරියෙන් පහන් පත්තුවනු දැකිය හැක. එයද තම ඇදහිල්ලට හා විශ්වාසයට බාධාවක් නොවන ආකාරයෙන් සිදුවන්නේ නම් සුබදායකය. දරුවාට ඉඳුල් කටගාද්දි, දියණිය වැඩිවිය පත්වෙද්දී, නිවසේ මුල්ගල තැබීමේදී, විවාහ මංගල්ලවලදි හඳහන, වේලාව, නැකැත් පොරොන්දම් ගලවන්නට, අසනීපයකදි බෝධි පූජා තබන්නට අනුබලදීම ඒ අනුව ක්‍රියාකිරීම අපගේ කිතුනු විශ්වාසයට පටහැනි බව දැනගත යුතුය. මිශ්‍ර විවාහයක් නොවුවද ඇතැම් කිතුනු පවුල් මෙවැනි මිත්‍යා මත හිස දරා සිටීම කණගාටුදායකය. මෙවැනි ක්‍රියා කිතුනු අපට කිසිසේත්ම අනුමත කළ නොහැකිය. දේවස්ථානයේ දී දෙවිඳුන්ට වන්දනා කිරීමත්, වෙහෙර, විහාර, කෝවිල් ආදියේදි අන්‍යාගමික වත් පිළිවෙත් සිදුකිරීමටත් ඔවුන් පෙළඹී සිටින්නේ කුමන අරමුණකින් ද? ඇතැම් කිතුනුවෝ වසරකට වරක් කතරගම යන්නේ කුමන පිහිටක් බලාපොරොත්තුවෙන්ද? අප අදහන්නේ ද විශ්වාස කරන්නේ ද ජීවමාන දෙවිඳුන් බව අප අත් නොදකින්නේ ද? ජන අනුපාතය අනුව කිතුනු අප සුළු පිරිසක් වුව ද අපගේ කිතුනුකම රැකගැන්මට අප එඩිතර විය යුතුය. අපගේ කිතුනුකමට නිගා නොකළ යුතුය. අප කිතුනුවකු වීම සුවිශේෂි වරප්‍රසාදයකි.

ඉතාමත්ම අසීරු අවස්ථාවකදි හැර අප මිශ්‍ර විවාහයන්ට නොපෙළඹිය යුතුය. කිතුනු තරුණයෙකු හෝ තරුණියක සමඟ විවාහ වීමේදී සියයට සියයක්ම ඔහු හා සම්බන්ධ කරුණු සැසඳීමට නොයා යුතුය. අත්‍යාවශ්‍ය යයි හැඟෙන කරුණු කීපයක් පමණක් සලකා බලා ඔහුගේ හෝ ඇයගේ කිතුනුකම වෙනුවෙන් පරිත්‍යාගිවන්නට පෙළඹෙන්නේ නම් දෙවිඳුන්ද අප කෙරේ ප්‍රසන්න වනු ඇත. විවාහය පරිත්‍යාගිවීමේ, ඇපවීමේ, කැපවීමේ, පූජාවීමේ ජීවිතයකි. එය බලගැන්විය යුත්තේ අධ්‍යාත්මික ගුණයන්ගෙනි.

සහකරුවා හෝ සහකාරිය වශයෙන් අප හා එක්වන්නේ මිනිස් ගති පැවතුම් ඇති ඇට, මස්, ලෙයින් සැදි මිනිස් ප්‍රාණයක් බව අප සිහි කළ යුතුවෙමු. කුමන හෝ අඩුවක් දුබලකමක්, නොගැලපෙන තත්ත්වයක් ඔහු හෝ ඇය සතුව පවතින්නට පුළුවන. අප එහිදි එය දරාගත යුතුවෙමු. ඉවසිය යුතු වෙමු. කමා කළ යුතු වෙමු. අපද නිවැරදි පරිපූර්ණ මිනිසුන් නොවන බවද සිහිකළ යුතුවෙමු. විවාහය හුදු ලිංගිකත්වය මතම පිහිටන්නක් නොවන බවත්, එය අධ්‍යාත්මිකත්වයෙන් ද පිරිපුන්විය යුතු ජීවිත පැවත්මක් බවත්, දැනගත යුතුය. විවාහය තුළ අධ්‍යාත්මිකත්වය නොමැතිවූ විට ඔහු හෝ ඇය කායික අවශ්‍යතාවයකට පමණක් සීමාවුන ලිංගික මෙවලමක් බවට පත්වනු ඇත. වහලෙකුගේ හෝ වහලියකගේ තත්ත්වයට පත්වන්නේ අප අධ්‍යාත්මය තුළ නොපිහිටා සිටින හෙයිනි.

එමෙන්ම මිශ්‍ර විවාහය තුළ එකිනෙකා පිළිබඳ මනා අවබෝධයක් නම් තිබිය යුතුමය. මිශ්‍ර විවාහයකදි කිතුනු අප හා එක්වන්නේ හින්දු, මුස්ලිම් භක්තිකයනට වඩා සිංහල බොදුනුවන්ය. ඔවුන් හා එකතුවීමේදී අප වෙනස් වන්නේ ආගම දහමින් හා සුළු සංස්කෘතික වෙනසකිනි. එහෙත් අපගේ ඇදහිල්ල විශ්වාසය, වරප්‍රසාද ලත් ජීවිතය, ප්‍රසද නිධානමය පැවැත්ම, දිව්‍ය සත්ප්‍රසාදිය බැතිය මේ ආදි කිතුනු වටිනාකම් කෙසේ නම් බොඳකර දමන්න ද? කෙසේ නම් දියකර හරින්න ද? අපගේ අධ්‍යාත්මික පැවැත්මට කිතුනු ජීවිතය වරප්‍රසාදයකි. කිතුනු අපි අපගේ සහෝදර අන්‍යාගමිකයන් අවතක්සේරු නොකරමු. හැල්ලුවට ලක් නොකරමු. ඔවුන්ගේ ධාර්මික පැවැත්ම අගය කරමු. එහෙත් මිශ්‍ර විවාහය තුළ අපගේ අදහිල්ල හා විශ්වාසය බොඳකර නොගනිමු.

**රංජිත් නෝනිස්**

## පවුල් සංස්ථාවේ විකාශනය

**ඉෂාරා නිශාලි පාරිස්**

# සමාජානුයෝජන ක්‍රියාවලිය සිදුවන ආකාර



සමාජ විද්‍යාඥයින් හා මානව විද්‍යඥයින් ලෝකය පුරා විවිධ සමාජ වල සිදුකරන ලද පර්යේෂණ ඇසුරින් මෙම ක්‍රියාවලියේ ස්වභාවය හඳුනාගෙන ඇති අතර ‘ඉයන් රොබට්සන්’ (Ian Robertson) නම් සමාජ විද්‍යාඥයා, ඔහුගේ “SOCIOLOGY” නම් කෘතියෙන් සමාජානුයෝජනය, සිදුවන ආකාරය අනුව කොටස් කිහිපයකට බෙදා දක්වයි.

ඒවානම්

ප්‍රධාන වශයෙන් ප්‍රාථමික සමාජානුයෝජනය, ද්විතියික සමාජානුයෝජනය

ඊට අමතරව අපේක්ෂිත සමාජානුයෝජනය, සංවර්ධන සමාජානුයෝජනය, පුනර් සමාජානුයෝජනය, දුස් සමාජානුයෝජනය.

**සමාජානුයෝජන වර්ග**

**ප්‍රාථමික සමාජානුයෝජනය**

සමාජානුයෝජන ක්‍රියාවලියේ පදනම වන්නේ ප්‍රාථමික සමාජානුයෝජනයයි. පුද්ගලයා මුල්වරට සමාජය පිළිබඳව හා තමා අවට පරිසරය පිළිබඳව දැනුමක් ලබාගෙන ඒ අනුව හැඩගැසීමේ ක්‍රියාවලිය ප්‍රාථමික සමාජානුයෝජනයයි. මෙම ක්‍රියාවලිය සිදුකරන මූලිකතම ආයතනය වන්නේ පවුලයි. මවගේ චිත්තවේගී පෝෂණයත්, පියාගේ උපයෝගී නායකත්වයත් තුළ තම සංස්කෘතියට අදාල භාෂාව, හොඳ නරක, සිරිත් විරිත්, ආදිය ඉගෙන ගැනීම මෙන්ම පුද්ගල චර්යාවත් තීරණය කරන මනෝභාවයන්, අධ්‍යාතමික ගති ලක්ෂණ, සිතුම් පැතුම්, ආකල්ප, විශ්වාස, පෞරුෂ ගති ලක්ෂණ ආදිය හැඩ ගැස්වීම සිදුවන්නේ මේ තුළිනි. සමාජ විද්‍යාඥයින්, මනෝ විද්‍යාඥයින් පෙන්වා දෙන පරිදි සමාජානුයෝජන ක්‍රියාවලියේ වැදගත්ම අවධිය වන්නේ ප්‍රාථමික සමාජානුයොජ්නයයි.

**ද්විතියික සමාජානුයෝජනය**

පවුලෙන් පරිබාහිරව සමාජය පිළිබඳ ඉගෙනීම ද්විතියික සමාජානුයෝජනයයි. පවුල තුළින් සමාජීයය ජීවිතය පිළිබඳ මූලික අවබෝධය ලබාගත් දරුවාගේ ජීවිතාවබෝධය වැඩිදියුණු කිරීම මේ තුළින් සිදුවේ.

**තව කොටසක් මීළඟ පහන් කැදැල්ලෙන්**

## පුංචි ඇත්තක්

# නිර්මාතෘත්වයේ මාතෘ



යමක් ආරම්භ කිරීමට මුල් වූ තැනැත්තා, එහි නිර්මාතෘය.

බුදු දහමේ නිර්මාතෘ, බුදු රදුන් ය.

කිතු දහමේ නිර්මාතෘ, කිතු සමිඳුන් ය.

ඉස්ලාම් දහමේ නිර්මාතෘ, මොහොමඩ් නබි නායක තුමන් ය.

මාර්ක්ස්වාදයේ නිර්මාතෘ, කාල් මාර්ක්ස් ය.

නූතන තාරකා විද්‍යාවේ නිර්මාතෘ, නිකලස් කොපර්නිකස් ය.

පරිණාමවාදයේ නිර්මාතෘ, චාල්ස් ඩාවින් ය.

ශ්‍රී ලංකා සිතියමේ නිර්මාතෘ, ක්ලෝඩියස් ටොලමිය.

ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘ, ආනන්ද සමරකෝන් ය.

මේ ආදී වශයෙන්, ලොවට, රටකට, සමාජයකට හෝ ජන කොට්ඨාශයකට, නව දර්ශනයක්, චින්තනයක්, නිෂ්පාදනයක් හෝ නිර්මාණයක් වැනි යමක් හඳුන්වා දීමට මුල් වූ තැනැත්තා, එහි නිර්මාතෘ ලෙස ලොව ජනතාවගේ, පිළිගැනීමට, පැසසුමට, නැමදුමට ලක්ව ඇත.

නිර්මාතෘවරුන් ලොව කොපමණ ඇත්දැයි ප්‍රශ්න කළහොත්, ඔබ නොපැකිලව, අතලොස්සකැයි, පිළිතුරු දෙනු ඇත.

නැත, ලොව මුල්ම මානවයා ආරම්භ වු මොහොතේ සිට, මේ දක්වා බිලියන, ට්‍රිලියන ගණනින්, ගණන් කළ නොහැකි තරමට නිර්මාතෘවරුන් බිහි වී ඇත.

ලොව උපදින සෑම මිනිසකුගේ ම දිවියේ නිර්මාතෘවරයා, තමා ම ය.

අප හැමකෙක් ම ලොව නිර්මාතෘවරයෙකි. අන්‍යයන්ට කළ හැක්කේ, අපට මඟපෙන්වීම පමණි.

ලොවට වැඩදායි හෝ අවැඩදායි මිනිසෙකු බිහි කිරීමේ නිර්මාතෘ කාර්යයේ වගකීම පැවරී ඇත්තේ තමා වෙතමය.

අර්ථවත් දිවිය, නිර්මාතෘවරයකු බිහි කරයි.

**ජූඩ් අයිවන්**

# යුක්තිය, සාමය හා සංහිඳියාව උදෙසා ව්‍යාපාරයේ වාර්ෂික වාර්තාව නිකුත් වේ

උගත් පාඩම් සහ ප්‍රතිසංවිධානය සඳහා වූ රාජ්‍ය කොමිසම හමුවේ යුක්තිය සාමය හා ජාතික සංහිඳියාව ආශ්‍රිතව පැවතියා වූ හා අනාගතයේදී උද්ගත විය හැකි ගැටළු අසීරුතා අසහනයන් පිළිබඳව ලිඛිත හා වාචික නියෝජනයක් ලබා දීම පිණිස විශේෂ කාර්ය සාධක ක්‍රියාකාරී කමිටුවක් ස්ථාපිත කරන ලද අතර එහි සාමාජිකයන්ගේ විශාල කැප වීම හා මහත් පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් වූ පැමිණිලි හා යෝජනා රැගත් සන්දේශ පත්‍රිකා සංග්‍රහයක් එම කොමිසමට භාර දෙන ලදී. එදිනම වාචික සාක්ෂි සැසිවාරයක් කොමිසම් සභා ගර්භයේ පැවැත්වීමට ද ඔවුහු සමත් වූහ. සංවිධානයේ මෙම දායකත්වයන්ට එම කොමිසමෙන් ගෞරවාන්විත පිළිගැනීමේ ඇගයීමක් ප්‍රකාශ වීයැයි යුක්තිය, සාමය හා සංහිදියාව උදෙසාවූ ශ්‍රී ලාංකීක ව්‍යාපාරයේ 2010 / 2011 වාර්ෂික වාර්තාවේ දක්වා ඇත. ප්‍රධාන ලේකම් ඇන්ඩෘ සමරතුංග මහතාගේ අත්සනින් ඉදිරිපත් කළ ඒ වාර්තාවේ මෙසේද දැක්වේ.

විශේෂයෙන් සමාජයෙහි දුප්පත් ජන ස්ථරයෙහි අහිංසක කුඩා දරුවන් හඹා යන දුශ්ශිල ළමා අපයෝජනය දිනෙන් දින ඉහළ පරිමාණයකින් පැතිරීම පිළිබඳව අපි ක්‍රියා කළෙමු. මාතර තෙලිජ්ජවිල රාජකීය විද්‍යාලයීය විභාග ශාලාවකදී සිදු කළ දැඩි සාහසික අපරාධය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා හා අධ්‍යාපන අමාත්‍යතුමාට කඩිනම් පියවර ගන්නාලෙස ආයාචනා කරෙත. සිවිල් හා ආගමික සංවිධානයන්ගෙන් මේ සම්බන්ධව සානුකම්පිතව ක්‍රියා කරමින් විපතට පත් වූවන් සමාජයෙහි යළි ස්ථාපිත කරවීමටද ආයාචනා කර ඇත.

# ජාතික දෙව්සත්හලේ 58 වසරක් සේවය කළ කේ.ඩබ්ලිව්. පබිලිස් මහතා මියයයි



අම්පිටිය ජාතික දෙව්සත්හලේ සේවයේ නියුතුව සිට කේ. ඩබ්ලිව්. පබිලිස් මහතා මහනුවර මහ රෝහලේදී අවසන් ගමන් ගියේය. අවසන් කටයුතු මහනුවර අම්පිටිය පොදු සුසාන භූමියේදී සිදු කෙරිණි.

උපතින්ම සැදැහැවත් බෞද්ධ පෙළපතකට නෑකම් කියමින් 1935 දී උපත ලද පබිලිස් මහතා (අවු. 76) මිය යනතෙක් මහනුවර අම්පිටිය ජාතික දෙව්සත්හලේ සේවය කරමින් සිටියේය. දූවරුන් තිදෙනෙකුගෙන් හා එකම පුතනුවන්ගේ දයාබර පියාණන් වන ඒ මහතා 1953 සිට මේ දක්වා අවුරුදු 58 ක් එහි සේවය කළ අතර ඔහුගේ පුතු කේ. ඩබ්ලිව්. නිමල් උපාලි මහතාද එහි සේවය කරන අතර යමුණා සඳමාලි නම් දියණිය සිය විවාහය වන තෙක් එහි සේවය කළාය.

සිය පවුලට, ගෙදරට මෙන්ම ජාතික දෙව්සත්හලටද එකසේ පෙම්බැඳ දිවිගෙවූ පබිලිස් මහතාගේ දුක්බර වියෝව දැනගත් මොහොතේ සිට අම්පිටිය ජාතික දෙව්සත්හලේ අධිපති පියතුමා ප්‍රමුඛ කාර්යය මණ්ඩලයද, එහි ඉගෙනුම ලබන ගරු සොහොයුරන්ද, දිවයිනේ සතර දිග්භාග යන්හි වැඩ වසන ගරු පියතුමන් බොහොමයක්ද, කුරුණෑගල රදගුරු අති උත්තම හැරල්ඩ් ඇන්තනි පෙරේරා, ගාල්ල රදගුරු අති උත්තම රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ද දේහය තැන්පත් කර තිබූ අම්පිටිය නිවසට විත් අවසන් ගෞරව දැක්වූහ.

**(ජී.බී.එච්. ලිවේරා)**

# කළුඑළිය සා. තෙරේසා මහජන සභා අසූපස් වැනි සංවත්සරය



කළුඑළිය සාන්ත තෙරේසා මහජන සභාවට වසර 85 ක් පිරීමේ සංවත්සරය පසුගියදා ගරු රීඩ් ෂෙල්ටන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් කළුඑළිය ප්‍රාථමික පාසලේදී සිදු කෙරුණි.

සමිතියේ සභාපති ලේකම් භාණ්ඩාගාරික ධූර දැරූ සමිතියේ උන්නතිය සඳහා එහි වත්මන් සංවිධායක ධූරය දරණ පී.එස්. ඇනස්ලි පීරිස් මහතාගේ මේ සමාජ සත්කාරයට වසර 50 ක් පිරීම නිමිත්තෙන් සමිතියේ සංවිධානයෙන් පැවති උපහාර දැක්වීමේ උළෙලේදී ගරු රීඩ් ෂෙල්ටන් පියතුමා අතින් සම්මානයෙන් පිදුම් ලැබූ අයුරු.

ලේකම් ධූරය වසර 25 ක් තිස්සේ හොබවන යූ.එල් නිහාල් ජනප්‍රිය මහතා වම් පසින්ද, සමිතියේ සභාපති මැක්ෂි පෙරේරා මහතා දකුණු පසින්ද සිටිති.

80 වැනි විදේ පසු වෙමින් ජීවිතයේ තම විනෝදාංශය සමාජ සේවය බැව් පවසන සාම විනිසුරු පදවියෙන්ද පිදුම් ලබා ඇති පීරිස් මහතා කළුඑළිය ශාන්ත ජුවකීනු පාසලෙන් මූලික අධ්‍යාපන ලබා කපුවත්ත ශාන්ත සේවියර් සහ කඳාන මැසිනොද් යන විද්‍යාලවල ආදි ශිෂ්‍යයෙකි.

ශ්‍රී ලංකා තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ලිපිකාර සේවයෙන් විශ්‍රාම ලබා ජීවිතයේ සන්ධ්‍යා සමය සමාජ සේවයට හා ආගමිකත්වයට යුතු වලට කැප කරමින් කල් යවන ඇනස්ලි පීරිස් මහතාට සිංහල, ඉංග්‍රීසි හා ලතින් භාෂාවලින් ගීත ගායනා කිරීමේ සහජ හැකියාවක් ඇති ශ්‍රී ලංකා නාවික හමුදාවේ උසස් නිලයක් දරණ එහි තූර්ය වාදක මණ්ඩලයේ අණ දෙන නිලධාරී ජූඩ් පීරිස් මහතාගේ දයාබර පියාණන්ය.

ජීවිතයේ 80 විය පසුකරන ඇනස්ලි පීරිස් මහතාට අපි නිරෝගී සුව පතමු. **(ලෙස්ලි පෙරේරා)**

# දේශබන්ධු දේශශක්ති සම්මානයෙන් පිදුම් ලබයි



එක්සත්ජාතීන්ගේසංගමයේ 66 වන සංවත්සරය හා ජාත්‍යන්තර සාම දිනයට සමගාමීව, ජාතික සමගි සංගමය පිහිටුවා වසර 18 ක් පිරීම නිමිත්තෙන් සංවිධානය කරන්නට යෙදුන 09 වන මහ සමුළුව හා තිළිණ ප්‍රදාන උළෙලේදී මට්ටක්කුලිය සා. මරියා මීසම් ධර්ම සේවා සභාවේ ගරු ලේකම් හා ඇමඩියස් ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනයේ දේශීය කළමණාකරු ඩෙනිස් ෆොන්සේකා මහතාට දේශබන්ධු දේශ ශක්ති සම්මානය සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍ය ටි.බී. ඒකනායක මහතා පිරිනැමීය.

මෙතුමා ශ්‍රී ලංකාවාසී ජනතාවට කරන නිහඬ සේවය වෙනුවෙන් මෙම සම්මානය ප්‍රදානය සඳහා තෝරා ගන්නා ලදී. ජාතික සමගි සංගමයේ ගරු සභාපති ආචාර්ය රන්බන්ඩාර ජයවර්ධන මහතාගේ මෙහෙයවීම තුළ දේශබන්ධු මාධ්‍යවේදී ජයලත් පී. ලක්ෂමන් මැතිතුමාගේ සංවිධානය යටතේ මෙම උත්සවයේ කටයුතු සිදුවිනි. **(ප්‍රවීනා රවින්ද්‍රන්)**

# දහම් සේවීන් යුග දිවියට



කොළඹ අගරදගුරු පදවි විවාහ හමු මෙහෙයුම් සංඝයේ ලේකම් යුවළ ලෙස කටයුතු කරන හපුගොඩ විවාහ හමු සම්බන්ධීකාරක උපාලි + නෙලීෂියා පෙරේරා යුවළගේ පුත් උමේෂ් පෙරේරා මහතා පොල්ගහහේන පදිංචි සාංගිකා පෙරේරා මෙනවිය සමග යුග දිවියට පිවිසියේය.

උමේෂ් වසර 10 ක පමණ කාලයක සිට ශා. මරියා දහම් පාසලේ ක්‍රියාකාරී දහම් ගුරුවරයෙකු ලෙස කැපී පෙනෙන සේවාවක් කරයි. ඔහු 2008 වසරේදී එහි විදුහල්පති ලෙසත්, මෙම වසරේ උප විදුහල්පති ලෙසත් කටයුතු කරයි. සාංගිකා ද පොල්ගහහේන ජේසු බිළිඳු දහම් පාසලේ වසර 5 ක කාලයක සිට දහම් ගුරුවරියක ලෙස කටයුතු කරයි. එසේම ඇය එහි ලේකම් ධූරයත්, ශිෂ්‍ය නායක නායිකාවන් භාරවත් කටයුතු කරන්නීය. උමේෂ් - සාංගිකා යුවළගේ නව දිවියට "ප්‍රදීපය" ද ආසිරි පතයි.

**(ඇන්ටන් ජයසූරිය.)**

# පැවිදි සොයුරියගේ ජයන්ති තුති පිදීමේ මෙහෙයෙන් පසු

පාතිමා අප ස්වාමිදුවගේ යාගික සොයුරියන්ගේ නිකායේ ගරු මේරි ඇග්නස් ද මැල් පැවිදි සොයුරියගේ පැවිදි දිවියට තිස් වසරක් පිරීම නිමිත්තෙන් පැවැති දේව මෙහෙය මොරටුව කොරළවැල්ලේ මිඛායෙල් අග්‍රදූත දේවස්ථානයේ පසුගියදා සිදු කෙරිනි. එම නිකායේ ප්‍රථම පැවිදි සොයුරිය වන ගරු ඇග්නස් ද මැල් සොහොයුරිය දමිළ අපෝස්තලික සේවා නාහිමි අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු, කොරළවැල්ල මීසම් සේවක ගරු ලියෝ කැමිලස් පියතුමා සමග ප්‍රදීප කැමරාව හමුවේ.

ශ්‍යාමා විතාන



# පැවිදි දිවියේ ස්වර්ණ ජයන්තිය සමරයි



*1942 වර්ෂයේ මැයි මස 11 වන දින මොරටුව කඩලාන ග්‍රාමයේ කුරුකුලසූරිය ජෝශප් ෆර්ඩිනැන්ඩු සහ මෙරායා ප්‍රනාන්දු යන යුවලට දාව මෙලොව එළිය දුටු ගරු මේරි ජෝශප් පැවිදි සොයුරිය පැවිදි දිවියේ ස්වර්ණ ජයන්තිය සැමරුවාය.*

කඩලාන රෝමාණු කතෝලික විද්‍යාලයෙන් තම අධ්‍යාපනය නිමා කර ජීවිතයේ නව පියවරක් තබමින් ශ්‍රී ලංකා සුරදූතික පැවිදි නිකායට එක්වෙමින් වර්ෂ 1960 සැප්තැම්බර් 08 වන දින පැවිදි දිවියේ මූලික පියවර සනිටුහන් කළාය.

එදා මෙදා තුර කැපවුනු දිවියේ දෙවිඳු සේවාව කුලියාපිටිය, බලංගොඩ, නාගොඩ, කොල්ලුපිටිය, කහවත්ත, ඒකල, තංගල්ල, නුවර, වැල්ලවාය, තොඩුවාව, ගෝනවිල වැනි අති දුෂ්කර ප්‍රදේශයන්හි කන්‍යාරාම සේවාවන් දහම් පාසල් සේවාව, මීසම් වල විශේෂ ධර්මදූත සේවාවන් හි නායකත්වය දරමින් දෙවිඳු ප්‍රේමයේ දූතිකාවක් විය. මින් කන්‍යාරාම කිහිපයක ප්‍රධාන පැවිදි සොයුරිය ලෙස පැවිදි හවුලේ වගකීම් හෙබවූවාය. තවද අප්‍රිකානු අර්ධද්වීපයේ කෙන්යානු ප්‍රාන්තයේ වසර කිහිපයක් විදේශගතව දුගී දිළිඳු ජනතාවට සේවය කිරීමට වරම් ලැබීය. එමෙන්ම ශුද්ධ වූ බයිබලය පිළිබඳව වැඩිදුර අධ්‍යාපනය සඳහා ශුද්ධවූ දේශයට යාමේ භාග්‍යයද ඇය හිමිකරගත්තාය.

පනස් වසරක් පුරාවට මෙතෙක් ආ පැවිදි දිවිමගෙහි ලද බහුල වරප්‍රසාදයනට තුති පුද දෙමින් තමන්ට අතහිත දුන් සැමදෙනා වෙනුවෙන් එතුමිය දෙවිඳුන්ට තුති පුද දෙන්නීය.

**(ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු)**

# පැවිදි දිවියේ රජත ජයන්තිය



නායකකන්ද මීසමට අයත් සියඹලාපිටියගේ දෝන සුසාන කැලිස්ට්‍රා පැවිදි සොයුරිය පැවිදි දිවියේ රජ ජයන්ති සැමරුවාය. දික්ඕවිට ශාස්ත්‍රාලෝක විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා දොමිනිකාන පැවිදි හවුලේ පැවිදි සොයුරියක ලෙස වේදහාර ලබා 1995 - 1996 වසරේ පිලිපීනයේ අධ්‍යාපන කටයුතු නිම කර මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු පුහුණුවද, කැළණි විශ්ව විද්‍යාලයෙන් ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියෙන්ද පිදුම් ලැබූ ඇය දැනට දළුවකොටුව ලොයලා විද්‍යාලයේ ගුරුවරියක ලෙසද කඳාන නාගොඩ මීසම් සේවයේදී නියුතු වන ඇයට ඉදිරි කටයුතු දෙවිඳුන්ගේ රැකවරණය හා නිරෝගී බව තුළ ඉටුකිරීමට දෙවිඳු වරම් හා ඇයගේ විසිපස් දිවියට සුභ පැතුම් !.

# දිවියෙන් සමුගත් ගුරු මාතාව



*හිඟුරක්ගොඩ මීසමේ කුමාරගම පදිංචිව සිටි එම්. පස්කලීන් ප්‍රනාන්දු ගුරු මාතාව පසුගියදා ස්වර්ග ස්ථ වූවාය. 1929 වර්ෂයේදී නුවරඑළිය ප්‍රදේශයේ උපත ලැබ මහනුවර ශාන්ත මරියා කතෝලික මිශ්‍ර පාසලින් අකුරු කළාය.*

කතෝලික ගුරුවරියක ලෙස මුල්ම පත්වීම ලැබූවේ මඩකලපුව ශාන්ත සිසිලියා කන්‍යාරාම පාසලටය. 1960 දී පොලොන්නරුව දිස්ත්‍රික්කයේ රජරට කතෝලික විදුහලට (අද රජරට මහා විදුහල) මාරුවක් ලැබ රජරට කතෝලික දරුවන්ට දහම ඉගැන්වීමේ නිරතව හිඟුරක්ගොඩ ආනන්ද බාලිකා මහ විදුහල, මින්නේරි මධ්‍ය මහා විදුහල්වල නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙස සේවය කළ ඇය යටියල්පතාන විදුහල සහ කවුඩුල්ල මහ විදුහලේ විදුහල්පතිනිය ලෙස සේවය කර 1986 වසරේ ගුරු සේවයෙන් ඉසිඹු ලැබුවාය. විශ්‍රාම ලැබූ පසු ද හිඟුරක්ගොඩ ක්‍රිස්තුරාජ දහම් පාසලේ උසස් පෙළ දරුවන්ට ධර්මය ඉගැන්වූ අතර දායක සභාවේ ලේකම් ධූරයද දැරීය. ප්‍රදේශයේ බෞද්ධ ජනතාව සමග සම්බන්ධ වෙමින් හිඟුරක්ගොඩ සමථ මූල මණ්ඩලයේ ප්‍රධාන සමථ කරු ලෙස වසර 14 ක් කටයුතු කළාය. ගුරු සේවය මෙන්ම සමාජ සත්කාරය ජීවිතය කොට ගත් මෙම ගුරුමාතාවගේ ආත්මය වෙනුවෙන් අපේ යැදුම්ද එකතු කරමු. **(ඩබ්. ජෝශප් ඇන්ටනී)**

# විවාහ ජයන්ති සමරුවක්



*කොළඹ 15 පදිංචි බී. එඩ්මන්ඩ් මෙන්ඩිස් සහ එල්. විනිෆ්‍රීඩා මෙන්ඩිස් යුවළගේ විවාහ දිවි 59 සමරුම නිමිත්තෙන් ලුණුපොකුණ සා. අන්ද්‍රේ දෙව්මැඳුරේදී තුති පිදීමේ දිව්‍ය යාගයක් පැවැත්විය.*

එඩ්මන්ඩ් මෙන්ඩිස් මහතා වසර ගණනාවක් මරිය හමුදාවේ (ඉංග්‍රීසි අංශයේ) හා මීසම් ධර්ම සේවා සභාවේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස සේවය කර ඇත. විනිෆ්‍රීඩා මෙන්ඩිස් මහත්මිය සාන්ත වින්සන් ද පාවුලා සමිතියේ සභාපති වශයෙන් අසරණ පවුල් වෙනුවෙන් සේවය කරන අතර දිව්‍ය හෘදයේ සමිතියේ හා කිතුදන පුබුදුවේ සාමාජිකාවකි. පුරා වසර 38 ක් කොළඹ කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රෝර් වශයෙන් සේවය කර දැනට විශ්‍රාමිකව සිටින ඇය සාම විනිසුරුවරියක වශයෙන් ද පළාතට විශිෂ්ට සේවයක් කරන්නීය.

## නත්තල් කැරොල්... 1 පිටුවෙන්

නුගේගොඩ සා. ජෝශප්, කෝට්ටේ සා. තෝමස්, රාජගිරිය දිව්‍ය හෘදය, අතුරුගිරිය සා. පියෝ, පොල්හේන්ගොඩ දිව්‍ය හෘදය, තලංගම සා. ජෝන් දල්බස්තෝන්,
බොරලැස්ගමුව සා. අන්තෝනි යන දෙව්මැඳුරු මීට එක්විය. සිංහල අංශයේ ප්‍රථම ස්ථානය කෝට්ටේ සා. තෝමස් දෙව්මැඳුරු ගායනා කණ්ඩායම දිනාගත් අතර මේ කංඩායම් සහභාගි වන විශේෂ කැරොල් හා නාට්‍ය දැක්ම දෙසැ. 04 ඉරිදා ප.ව. 6.00 ට නුගේගොඩ සා. ජෝශප් දේවස්ථානයේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

## කොළඹ අගරදගුරු... 1 පිටුවෙන්

අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු මාහිමිපාණන් 1948 මැයි 20 දා යාපනයේ උපත ලබා කොළඹ දී හැදී වැඩුණු අතර සා. බෙනඩික් විදුහලෙන් අධ්‍යාපනය ලබා බොරැල්ල සා. ඇලෝසියස් කනිටු දෙව්සත්හලෙන් හා ජාතික දෙව්සත්හලින් දේව ධර්මය හැදෑරීය. රෝමයේ උර්බානියානා සරසවියේ දේව ධාර්මික උසස් අධ්‍යාපනය ලද එතුමා ශීලධාර්මික දේව ධර්මය සඳහා ශාස්ත්‍රපති උපාධිය ලබා 1973 ජනවාරි 6 වැනි දා වතිකානයේ දී අති උතුම් සවැනි පාවුළු සසුන් පියා වෙතින් පූජකවරය ලැබීය. වසර කිහිපයක් දහම් සේවාවේ නියැලී පශ්චාත් උපාධිය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයට ගිය උන්වහන්සේ වොෂින්ටනයේ කතෝලික සරසවියෙන් දේව ධර්මය උපාධිය දිනා ගත්තේ ය. අම්පිටිය ජාතික දෙව්සත්හලේ කථිකාචාර්ය හා අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ එතුමා මීසම් සේවාවේ ද නියැලි අතර මොරටුව දිසානායක හා කොළඹ දකුණු කලාපීය නාහිමි ලෙස ද සේවය කළේ ය. රදගුරුවරයට නම් කරන අවස්ථාවේ නාහිමි ලෙස ද සේවය කළේ ය. රදගුරුවරයට නම් කරන අවස්ථාවේ කොළඹ අගරදගුරු වසමේ දමිළ අපෝස්තලික සේවාව බාරව කටයුතු කළේ ය.

අතිගරු මැක්ස්වල් සිල්වා මාහිමිපාණන් 1953 සැප්තැම්බර් 27 වැනි දා විල්ලෝරාවත්ත මීසමේ උපත ලබා මොරටුව සා. සෙබස්තියන් විදුහලෙන් සිප් සතර හදාරා බොරැල්ල සා. ඇලෝසියස් කනිටු දෙව්සත්හලට ද පසුව අම්පිටිය ජාතික දෙව්සත්හලට ද ඇතුළුව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීය. කැළණිය සරසවියෙන් විද්‍යා උපාධිය හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා ද සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය ද දිනා ඇත. 1981 ජූලි 25 පූජක වරම් ලද එතුමා දළුගම සහයක ලෙස ද තිබ්බොටුගොඩ හා මාබෝල මීසම් සේවක ලෙසද ග්‍රෑන්ඩ්පාස් සා. ජෝශප් විදුහලේ ද රාගම බැසිලිකා විදුහලේ ද සේවය කළේය. රදගුරුවරයට නම් කරන විට එතුමා කෝට්ටේ සා. තෝමස් විදුහල් අධ්‍යක්ෂ ධූරය දැරීය.

## ජාතික ළමා ආරක්ෂක.... 3 පිටුවෙන්

කර්මයක් බව හුවා දක්වා ඇති ආකාරයත් විමසා බැලීමේ දී යම් ගුප්ත බලවේගයක් විසින් මෙම ජනමාධ්‍ය උසිගන්වා ඇති බව අවබෝධ කරගත යුතුය.

මේ සියල්ල මහා අපරාධ ලෙස පොල් ගෙඩි අකුරින් පෙළගස්වන්නට තොරතුරු සපයා ඇති අය මෙම ළමා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යන්නේ කවුද? මෙම ආයතනය විසින් පසුගිය විසි වසර කට අධික කාලයක් මෙරට දරුවන්ට ද අසරණ වූ තරුණ මව්වරුන්ට ද සිදුකර ඇති සේවය කුමක් ද? මෙම ආයතනය පක්ෂ භේදයකින් හෝ ආගම් භේදයකින් හෝ ජාති භේදයකින් තොරව කර ඇති සේවය අගය කරන්නට මැලිවීම තුළින් තම තමන්ගේ කුහකභාවය ප්‍රදර්ශනය කරන්නට කටයුතු කර ඇත්තේ ඔත්තුකරුවා යයි කියැවෙන ගුප්ත බලවේගය මෙහෙයවන පුද්ගලයා ද? රහස් සුරැකිව ලබාගෙන පරික්ෂණ මෙහෙයවන රහස් පොලිසිය ද? නැත්නම් ජනමාධ්‍යය ද? එසේත් නොමැති නම් ළමා පරපුර ආරක්ෂා කරන්නට පමණක් පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ද? යන්න තෝරා බේරාගත යුතුව ඇත. මෙසේ කියන්නට බොහෝ හේතු කාරණා තිබේ. ඒ සඳහා මෙය කියවන අප කවුරුන් වුවත් නිදහස් මනසකින් විපරම් කළ යුතුය. ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පහත සඳහන් කාරණා ගැන විමසිලිමත් වීම කළ යුතුව තිබුණි.

පැමිණිලිකරුවකු නොමැතිව යම් චෝදනාවක් විභාග කළ නොහැකිය. ඔත්තුකරුවකු යොදවන්නේ සැකයක් ඇත්නම් පමණි. සැක සහිත නම් විපරම් කළ යුත්තේ ද රහසිගතව ය. එවැනි රහස් පරික්ෂණයක දී සාධාරණ සැකයකින් තොරව ඔප්පු කළ හැකි තොරතුරු හා සාක්ෂි ඇත්නම් අධිකරණය වෙත ගෙන යාම නිර්දේශිතය. සැකය පමණක් මුල්කරගෙන, උපකල්පනය කළ චෝදනා, ජනමාධ්‍ය වෙත කියාපෑම, ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් හෝ රහස් පොලීසිය විසින් හෝ නොකළ යුතු අතර, එසේ කළා නම් එම ක්‍රියාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නොවේ ද? ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ තුමිය යම් ස්ථානයක් පරික්ෂා කිරීමට සහභාගි වන්නේ මාධ්‍යකරුවන් සමඟ වීම ඉතා කණගාටුදායක ය. මාධ්‍ය වාර්තා අනුව ඒ බව පසක් වේ. මෙවැනි පුන්‍ය ආයතනයක් ලෝකයා ඉදිරියේ නිරුවත් කර පරික්ෂණ පැවැත්වීම සදාචාර සම්පන්න ද? ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවීමේ පනතින් එවැනි වරමක් මෙම අධිකාරියට දී තිබේ නම් හැල්ලුවට පත්වන්නේ එම නීති සම්මත කළ අපගේ පාර්ලිමේන්තුව නොවේ ද?

යමෙකු අධිකරණයක දී වරදකරුවකු ලෙස ප්‍රකාශ වන්නට පෙර මේ ආකාරයෙන් ජනමාධ්‍ය වෙත තොරතුරු ලබා දී නින්දා - අපහාස, ගැරහුම් ඔච්චන් කරන්නට කටයුතු සිදුවීම ශ්‍රී ලංකාවේ කීර්ති නාමයට ඔකැළලකි. මෙවැනි පීඩාවකට ලක් වූ අයකු හෝ ආයතනයක් අධිකරණයක දී නිදොස්ව නිදහස් වූ පසුව ඔවුන්ට තිබුණා වූ පූර්ව කීර්තිනාමය නැවත ස්ථාපිත කර දෙන්නට ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුවන් වේවි ද? වැරදි කළ පුද්ගලයන්ට හෝ ආයතන වලට දඬුවම් ලබා දීමට පියවර ගැනීම ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වගකීම වූවත්, පුද්ගලයන්ගේ හෝ ආයතනවල හොඳ නම කැළැල් කරන්නට හෝ තම මෙහෙයුම් කටයුතු වලට පුළුල් ප්‍රචාරයක් ලබා ගන්නට මෙම අධිකාරියට වරමක් ලබා දී තිබෙනවා ද?

රාජ්‍ය ආයතනයක් තම හැසිරීම තුළ තම ආයතනයේ ද මෙරට පුරවැසියන්ගේ ද ගෞරවය ආරක්ෂා කරගෙන නීතිය ක්‍රියාත්මක කර සාමය හා සමගිය ද වර්ධනය වන ආකාරයෙන් සිහි නුවණ ඇතිව සේවයේ නිරතවන්නට වරම් ලැබේවා!

## කිතු සමිඳුන්... 5 පිටුවෙන්

සමිඳාණන්ගේ මඟ පිළියෙල කිරිම සඳහා දෙවියන් වහන්සේ විසින් එවන ලද අවසාන දූතයා වශයෙන් සැලකෙන ස්නාවක ජුවාම් තුමා තවත් අයෙකි.

"සමිඳුන්ගේ මඟ පිළියෙල කරන්න. එතුමන් හට ඇද නැති මාවත් සාදන්න. සියලු කඳුරැළි පුරවනු ලැබේ. සියලු කඳු හෙල් සමතලා කරනු ලැබේ. සියලු වංගු ඇද හරිනු ලැබේ. රළු මාවත් මට්ටම් කරනු ලැබේ." (ලූක් 3:4-6). කිතු සමිඳුන්ගේ මෑණියන් වන කන්‍ය මරියතුමිය තවත් අයෙකි. "බලන්න, මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටුවේවා". (ලූක් 1:38).

සමිඳාණන්ගේ දෙවන පැමිණීම ආසන්නය. දැනටමත් පීඩාවන්හි පෙර නිමිති පහළ වී ඇත. එම දිනය කවදා සිදුවූවද නිතර යාච්ඤාවෙන් අවදිව සිටින්නැයි සමිඳාණෝ අවධාරණය කරති. එබැවින් අපි අපගේ පවුලට, සංඝයට, මුළු විශ්වයටම එකමුතු වී ඔවුන් වහන්සේගේ දෙවන පැමිණීම කෙරෙහි බලාපොරොත්තුවෙන් අවදිව සිටිය යුතු වෙමු. සමඟි සන්ධානයේ හා දිව්‍ය භෝජනයේ සක්‍රමේන්තු ලබා ගනිමින් යාච්ඤා මඟින් ද මර්දන ක්‍රියා මඟින් ද දයාවේ ක්‍රියාවලින් ද ස්වාමීන් වහන්සේගේ පැමිණීම සඳහා අපගේ ආත්ම පාරිශුද්ධ කරගත යුතු වෙමු.

## ආසියාකරයේ... 5 පිටුවෙන්

මෙහි දී පෘතුගීසි ජාතික ගොන්සාල්වෙස් නම් විචාරකයාගේ සාක්ෂිය ඉතා සුවිශේෂී වේ.

"ප්‍රැන්සිස් සාවියර් ක්‍රි.ව. 1551 දි ගාල්ලට පැමිණි බව ඓතිහාසිකව ගොන්සාල්වෙස්ගේ කෘතියේ සඳහන් කෙරේ. සේවියර් තුමා දකුණු ඉන්දීය මුහුදු තීරයේ සිට ජපානයේ සිට සිංගප්පූරුව හරහා මලක්කා සමුද්‍ර සන්ධිය හරහා පැමිණි බව සඳහන් කරයි. මෙලෙස ක්‍රි.ව. 1552 ජනවාරි 24 වන දිනට සාවියෙර් තුමා ඉන්දියාව බලා පිටත් වන්නේ මලක්කාවෙනි. මලක්කාවේ දී එතුමන්ට "ගාලේගෝ" නමැති නෞකාව තුළින් ලංකාව හරහා ඉන්දියාවට යෑමට එතුමන්ට සිදුවේ. මෙම නැව වනාහි පැරනි තත්ත්වයේ නැවකි. එම නිසා ක්‍රි.ව. 1551 දෙසැම්බර් මස අවසාන දින කීපය ද ජනවාරි මුල් දින කීපය ද එතුමන්ට ගාල්ලේ නතර වීමට සිදුවූයේ, මෙකී නැවේ කුඹ ගස කැඩී නැව නැවත අලුත්වැඩියා කරන තෙක් එතුමාණන් ගාල්ලේ විසීය. මෙහි දී එතුමන්ට මිගුවෙල් ෆර්නැන්ඩස් හමුවිය. ඔහුගේ නැව ද ඒ වසරේ දී වීදිය බණ්ඩාර විනාශ කරන ලද්දෙන් ඔහුට ද ගාල්ලේ විසීමට සිදුවිය. සේවියර් තුමාට මිගුවැල් ෆර්නැන්ඩස් හමුවන විට ඔහු ඉතා තදබල ලෙස අසනීප තත්ත්වයෙන් පසුවිය. මෙහි දී සේවියර් තුමා මිගුවෙල් වෙනුවෙන් දිව්‍ය පූජාවක් පවත්වා නැවත ඔහුගේ සුව දුක් බැලීමට ගිය බවත් සඳහන් වේ. මෙහි දී එතුමන් කාලේගාන ප්‍රදේශයට පැමිණ දේශනා කළ බවත්, එහිදී ප්‍රාතිහාර්ය කීපයක් සිදුකොට කිතු දහම දේශනා කළ ස්ථානය "කිතු දම් පිටිය" පසු කලෙක එය "කිතුලම් පිටිය" ලෙස අද දක්වා ම ජනව්‍යවහාරයේ පවතී. මෙහි දී නැවත ගාල්ලෙන් එන ගමනේ දී මිගුවෙල්ගේ සුව දුක් බලා ඔහු සුවසේ විසීම හේතුවෙන් දෙවිඳුනට ප්‍රශංසා කළේය. පසුව කලෙක ප්‍රැන්සිස් සාවියරේ තුමා ශුද්ධවරයට එසැවීමේ දී මිගුවෙල් ෆර්නැන්ඩස් ගේ සාක්ෂිය ඉතා වැදගත් විය. (ගොන්සාල්වෙස් - Vo I, Page 275), (Perniola Vo,1 289)

මේ අනුව බලන කල ශු. ප්‍රැන්සිස් සාවියෙර් මුනිඳුන් ලංකාවට පැමිණියේ එතුමන්ගේ ජීවිත කාලයේ පමණි. තත්කාලීනව ඇතැම් අන්තවාදී පිරිස් ෆ්‍රැන්සිස් සාවියර් මුනිඳුන්ගේ දේහය ෂඩ් වර්ණ පරමේෂ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ යැයි මත දැරුව ද එය එසේ නොවන්නේ ය. එනමුදු ක්‍රි.ව. 1554 මාර්තු 16 වන ගෝවා පුරයට මේ සුදුවර සිරුර රැගෙන ගියේ, ලංකාව හරහා ය. ප්‍රථමයෙන් ක්‍රි.ව. 1554 දී ගෝවා පුර ආසන දෙව්මැඳුරේ ස්ථාපිත කර තිබූ සිරුර අභිනවයෙන් ඉදි වූ "බෝම් ජේසු" බැසිලිකාවේ ස්ථාපිත කරන ලද්දේ ක්‍රි.ව. 1613 දීය. එතැන් සිට අද දක්වා ම මේ සිරි සිරුර දේව ජනතාවගේ ගෞරවාභිමානයට ලක්ව තිබෙන්නේ ය. ශු. ප්‍රැන්සිස් සාවියර් මුනිඳුන් ලාංකේය කතෝලික ශාසනය වැදගත් වන තවත් සංසිද්ධියක් ලෙස ක්‍රි.ව. 1651 සිට 1676 දක්වා ශිෂ්‍යයකු හා තරුණ සොයුරුතුමකු ලෙස ක්‍රි.ව. 1676 සිට ක්‍රි.ව. 1687 දක්වා තරුණ ජ්වලිත පූජාප්‍රසාදිතුමකු ලෙස සේවය කළ ලංකා අපෝස්තුළුවර භාග්‍යවත් ජුසේ වාස් මුනිඳුන් නිසාවෙනි. එතුමන්ගේ දිවි මඟ පුරාවට සා. ප්‍රැන්සිස් සාවියෙර් මුනිඳුන්ගේ අද්විතීය ධර්මදානීය මෙහෙවර සිතට තදින් ම කා වැදුණු බව එතුමන්ගේ ජීවිත කතාවේ සඳහන් වේ. එයට ප්‍රධානතම හේතුව වූයේ ගෝවේ "බෝම් ජේසු" බැසිලිකාවේ ස්ථාපිත එතුමන්ගේ නොදිරූ සිරි සිරුර හා එයට වැඳුම් පිදුම් කරන ජනතාවය.



*නයිනමඩම වික්ෂෝප මාතා දෙව් මැඳුරේ වාර්ෂික මංගල්‍යය මීසම් සේවක ගරු නිහාල් පයස් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. දෙව් මැඳුරේ තරුණ සමිතිය මංගල්‍යයට නව ආලෝකයක් එක් කරමින් අඩි 40 ක් පළල, අඩි 60 උස ඉතා දර්ශනීය තොරණක් ඉදි කළේය.* **(එච්. ඒ. සිරිල් පෙරේරා)**

## දළුපත ග්‍රාමයට නව ශා. වින්සෙන්තිද පාවුලා කොන්ෆරන්සියක්

දළුපත සිද්ධස්ථානයේදී පසුගියදා ශාන්ත වින්සෙන්තිද පාවුලා සමිතියක් පිහිටුවා ගන්නා ලදී. මීගමු දිසාවේ ආත්මීක අධ්‍යක්ෂ ගරු සිස්වන් කෘස් පියතුමා මීගමු කලාපයේ දිසානායක ගරු ජුලියස් ක්‍රිස්ටෝපර් පියතුමා මෙයට මූලිකත්වයක් දරණ ලදී. ගරු ආත්මීක අධ්‍යක්ෂ පියතුමා මෙවන් සමිතියක කාර්යභාරය සභාවට පැහැදිලි කරන ලදී. දිසා ලේකම් ලෙස්ලි රොහාන් සොයුරා හා පෙරියමුල්ල සමිතියේ සභාපති කිංස්ලි හෙට්ටිආරච්චි සොයුරන් ආරාධිත අමුත්තන් වශයෙන් පැමිණි අතර ඒ අය සමිතියක ව්‍යුහය හා සාර්ථත්වය ගෙන යන ආකාරය දැනුවත් කරන ලදී.

පී. එරික් ප්‍රනාන්දු සොයුරා සභාපති තනතුර සඳහාත් කේ. ඒ රෝලන්ඩ් ලෙස්ලි සොයුරා ලේකම් තනතුර සඳහාත් එස්.තේජා දීප්ති ප්‍රනාන්දු සොයුරිය භාණ්ඩාගාරික තනතුර සඳහා තේරී පත්විය. සෑහෙන පිරිසක් සාමාජිකත්වය ලබාගත් අතර මෙය ස්ථිර සාරව ගෙනයාමට සැවොම එකමුතුවන ලෙස ගරු ජුලියස් ක්‍රිස්ටෝපර් පියතුමා ඉල්ලා සිටින ලදී. **(කේ.ඒ. රෝලන්ඩ් ලෙස්ලි)**



*වත්තල සාන්ත ආනා දෙව්මැඳුරට සම්බන්ධ සාන්ත ආනා එක්සත් සහෝදර සමාජසේවා සමිතිය මගින් වත්තල සිංහ සමාජය, කැලණිය රොටරි සමාජය, පෑලියගොඩ සිංහ සමාජය හා වත්තල සිටි ලියෝ සමාජය යන සංවිධාන වලද සහය ඇතිව දෙව්මැඳුරේ ගරු නිකලස් පෙරේරා අනුස්මරණ ශාලාවේ පවත්වන ලද වෛද්‍ය සායනයේ ප්‍රධානත්වය දැරුවේ දිස්ත්‍රික් 306 බී සිංහ අධිපති ප්‍රියන්ත ප්‍රනාන්දු මහතාය. සාන්ත ආනා සමිතියේ සභාපති මාලිංග ජයවර්ධන සහ සංවිධායක සිංහ ලසන්ත මෙන්ඩිස් ඇතුළු නිලධාරීන් විසින් සිංහ අධිපතිවරයා සහ දිස්ත්‍රික් කැබිනට් ලේකම් සිංහ කැමිලස් ප්‍රනාන්දු මහතා පිළිගෙන දෙව්මැඳුරු ශාලාව වෙත කැඳවාගෙන යාමට සැරසුනු අයුරු...*

**(නිමල් පෙරේරා)**

## ජීවිත මගේ සිප්සතර දිනාගත්තීය ඇය

*ක්‍රිෂානි ප්‍රබෝදා පෙරේරා උඩරට ගම්මානයක ඉපිද නුවර එළිය යහපත් එඬේරා බාලිකා මහ විදුහලෙන් අධ්‍යාපනය ලැබුවාය. උසස් අධ්‍යාපනය සඳහා ඇය හැටන් සාන්ත ග්‍රේබ්‍රියෙල් බාලිකා මහ විදුහලට එක්ව උසස් පෙළ විභාගයෙන් අනතුරුව කැළණිය සරසවි බිමේ දී අගේ අධ්‍යාපන නිම් වළළු පුළුල් කරගත්තාය. 2010 දී කැළණි විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේදී රන් පදක්කම් දෙකකට උරුමකම් කීවාය.*

*බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශයේ ශාස්ත්‍රවේදී විෂයයේ වැඩිම ලකුණු ලබාගත් අධ්‍යයනවේදියට හිමි ස්වර්ණ මුද්‍රිකාව, මානව ශාස්ත්‍ර පීඨයේ වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍යාවට හිමි රන් පදක්කම ද ඇය විසින් දිනා ගනු ලැබීය. ඇය නානු ඔය මීසමේ බ්ලැක්පූල් දේවස්ථානයේ දහම් ගුරුවරියක ලෙස සිදුකළ ඒ සේවාවට ද වඩා වටිනාකමක් එක්කර ගත්තේ 2005 වසරේ දහම්ගුරු ධර්මාචාර්ය ගෞරව විභාගයෙන් ශ්‍රී ලංකාවෙන්ම පළමු තැන දිනාගනිමිනි. දැනට කොළඹ ශාන්ත ජෝශප් විදුහලේ ආචාර්‍යවරියක සේ සේවය කරන ඇය තව නොබෝ දිනකින් යුගදිවියකට පිවිසීමට සූදානම්ය.* ඇයට සුබාසිරි !

## ළමා ප්‍රදීපය නත්තල් කලාපයේ පිටකවරය සිත්තම් කිරීමට ළමුන්ට අවස්ථාවක් !

**ළමා ප්‍රදීපය 2011 නත්තල් කලාපයේ කවරය සිතුවම් කිරීමට, චිත්‍ර ඇඳීමට හපන් දුවා පුතාලට අවස්ථාවක් ලබා දීමට අපි තීරණය කළ බැව් සතුටින් යුතුව දන්වමු. මේ පිළිබඳව විස්තර 2011 නොවැම්බර් 28 හා දෙසැම්බර් 05 වන දින ළමා ප්‍රදීපයේ පල කොට ඇත. චිත්‍ර එවන නිර්මාණ කරුවන් නම, ලිපිනය, පාසල, දහම් පාසල, දුරකතන අංකය, චිත්‍රයේ පිටුපස සඳහන් කරන්න. ඔබගේ චිත්‍ර දෙසැම්බර් 10 වන දිනට පෙර තැපල් කර හෝ ගෙනවිත් භාර දිය හැකිය.**

**ලිපිනය : ළමා ප්‍රදීපය,**
**නත්තල් කලාපය, පිටකවර තේරීමේ තරගය,**
**අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.**

ළමා ප්‍රදීපය සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා